කුඩා පරිමාණ උද්‍යාන බෝග වගාකරුවන් සවිබල ගැන්වීම සහ ප්‍රවර්ධනය (SHEP)

# ව්‍යාප්ති කාර්ය මණ්ඩලය සඳහා SHEP අත්පොත



2018 මාර්තු

**SHEP ප්‍රවේශය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රායෝගික මාර්ගෝපදේශයකි**

ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය

# ව්‍යාප්ති කාර්ය මණ්ඩලය සඳහා SHEP අත්පොත

**SHEP ප්‍රවේශය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රායෝගික මාර්ගෝපදේශයකි**

# පටුන


**1. කොටස. සංකල්පය** ........ 05

**1. SHEP ප්‍රවේශය පිළිබඳ සංකල්පය** ........ 06

1.1. SHEP ප්‍රවේශයේ ප්‍රධාන කුළුණු දෙක ........ 06

1.2. SHEP වල අත්‍යවශ්‍ය පියවර හතර ........ 11

1.3. SHEP හි ස්ත්‍රී පුරුෂභාවය ........ 13

**2. SHEP හි වාසි** ........ 15

2.1. SHEP අනෙකුත් ප්‍රවේශයන්ගෙන් වෙනස් වන්නේ කෙසේද? ........ 15

2.2. SHEP ප්‍රවේශයේ වර්තමාන බලපෑම් (Effects) සහ ඉදිරි බලපෑම් (Impacts) ........ 16

**2. කොටස: පුහුණුව** ........ 19

**1. පියවර 1 - ගොවීන් සමඟ ඉලක්කය බෙදා ගැනීම** ........ 20

1.1. දැනුවත් කිරීමේ වැඩමුළුව (සංවේදීකරණ වැඩමුළුව) ........ 20

**2. පියවර 2 - ගොවීන්ගේ දැනුවත් බව වැඩි කිරීම** ........ 24

2.1. සහභාගීත්ව මූලික සමීක්ෂණය ........ 24

2.2. පාර්ශවකරුවන්ගේ සංසදය (විකල්ප ක්‍රියාකාරකමකි) ........ 35

2.3. වෙළඳපල සමීක්ෂණය ........ 42

**3. පියවර 3 -ගොවීන් විසින් තීරණ ගැනීම** ........ 57

3.1. ඉලක්කගත බෝග තේරීම ........ 57

3.2. බෝග කැලැන්ඩර සෑදීම ........ 64

**4. පියවර 4 -ගොවීන් කුසලතා ලබා ගැනීම** ........ 73

4.1. ක්ෂේත්‍ර පුහුණු ........ 73

**5. පසු විපරම සහ ඇගයීම/අධීක්ෂණය (සහභාගීත්ව අවසන් සමීක්ෂණයද ඇතුළුව)** ........ 82

**6. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණුවේ උදාහරණයක්** ........ 92

**3. කොටස: මග පෙන්වීම** ........ 101

**1. නිතර අසන ප්‍රශ්ණ** ........ 102

1.1. SHEP ක්‍රම හා භාවිතය සම්බන්ධ ප්‍රශ්ණ ........ 102

1.2. අලෙවිකරණ අභියෝග සම්බන්ධ ප්‍රශ්න ........ 104

1.3. සහයෝගීතා ආකාර සම්බන්ධ ප්‍රශ්න ........ 105

1.4. ඉලක්ක කිරීම සම්බන්ධ ප්‍රශ්න ........ 108

1.5. ව්‍යාප්ති කාර්ය මණ්ඩලය සහ පද්ධති සම්බන්ධ ප්‍රශ්න ........ 108

1.6. මූල්‍ය සම්පත් සම්බන්ධ ප්‍රශ්න ........ 109

1.7. ස්ත්‍රී-පුරුෂ භාවයට සම්බන්ධ ප්‍රශ්ණ ........ 109

**2. සම්පත්** ........ 110

## පරිවර්තනය සඳහා දායක වූ සම්පත්දායකයින්

**ආචාර්ය.ඩබ්.මලවිආරච්චි මයා**, ප්‍රධාන කෘෂි විද්‍යාඥ (ශෂ්‍ය විද්‍යා), ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය/ (FCRDI), කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව.

**ආචාර්ය සි.කේ.ඩී.වෙල්ලාල මිය**, සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන), ආහාර පර්යේෂණ ඒකකය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව.

**ඩී.පි. කරුණානන්ද මිය**, ප්‍රධාන කෘෂි විද්‍යාඥ (ශෂ්‍ය විද්‍යා), උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය /(HORDI), කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව.

**ඒල්.කේ.ඒස්.ටී. කුමාර මයා**, නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ, කෘෂි ව්‍යාපාර සංවර්ධන අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව.

**ඒ.ඒස්.ඒම්. රොෂාන් මයා**, සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (සංවර්ධන), කෘෂි ව්‍යාපාර සංවර්ධන අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව.

**මේනකා ප්‍රනාන්දු මිය**, සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය /(FCRDI), කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව.

**ආර්.ජී.ඒස්.ඉරෝෂනී මිය**, සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ) උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය /(HORDI), කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව.

**ඒ.ඒම්.ඒම්.ඒල්.බී. අත්තනායක මයා**, කෘෂිකර්ම උපදේශක. තරුණ ගොවි සමාජ මූලස්ථානය - පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව.

## තාක්ෂණික මාර්ගෝපදේශන දායකත්වය

**අයි.ජී. තිලකරත්න මයා**, වෙළඳපල පාදක කරගත් කෘෂිකර්ම ව්‍යාප්ති විශේෂඥ, සැපයුම් දාමය ශක්තිමත් කිරීම තුලින් සුළු හා මධ්‍යම පරිමාණ ගොවීන්ගේ ජීවනෝපාය ඉහළ නැංවීගම් ජයිකා/JICA ව්‍යාපෘතිය -ශ්‍රී ලංකාව.

**ඩී.ඒස්. රත්නසිංහ මිය**, අධ්‍යක්ෂ, බීජ සහතික කිරීම හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය/(SCPPS), කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව.

**ආර්. ඉෂා කල්පනි මිය**, පුහුණුකරු, සැපයුම් දාමය ශක්තිමත් කිරීම තුලින් සුළු හා මධ්‍යම පරිමාණ ගොවීන්ගේ ජීවනෝපාය ඉහළ නැංවීගම් ජයිකා/JICA ව්‍යාපෘතිය -ශ්‍රී ලංකාව.

# *1 කොටස. සංකල්පය*


''1කොටස. සංකල්පය (CONCEPT)'' මගින් SHEP ප්‍රවේශයේ ප්‍රධාන සංකල්පය, එහි පසුබිම, වාසි සහ සත්‍යය බලපෑම් සහ බිම් මට්ටමේ ඇති කරන බලපෑම පැහැදිලි කරයි.

# 1.SHEP ප්‍රවේශය පිළිබඳ සංකල්පය

## *1.1 SHEP ප්‍රවේශයේ ප්‍රධාන කුළුණු දෙක:*

*SHEP හි කොඳු නාරටිය ලෙස ප්‍රධාන කුළුණු දෙක*

SHEP ප්‍රවේශය මගින් කුඩා පරිමාණ ගොවියන් ගේ උද්‍යාන වගා භෝග වල වෙළඳපල ඉලක්ක කරගත් කෘෂිකර්මාන්තය අනුගමනය කිරීමේ උත්සාහයේ දී ඔවුන් සවි බල ගැන්වීම අරමුණු කරයි. ගොවීන්ට අවශ්‍ය අලෙවිකරණ සහ නිෂ්පාදන කුසලතා ලබාදීම තුළින් තිරසාර ලෙස ගොවිතැන ව්‍යාපාරයක් ලෙස සිදුකිරීමට ගොවීන්ගේ හැකියාව ගොඩනැගීමට එය උත්සාහ කරයි. ගොවීන්ගේ ස්වයං විශ්වාසය ගොඩ නැංවීමේ දී හා SHEP අපේක්ෂා කරන තිරසාර ප්‍රථිපල ලගා කර ගැනීමේ දී, ගොවීන් විසින් ස්වයං අභිප්‍රේරණය වීම අත්‍යාවශ්‍ය අංගයක් නිසා ගොවීන්ගේ එම ස්වයං අභිප්‍රේරණයට උපකාර කිරීම කෙරෙහි මෙම ක්‍රියාවලියේ දී විශේෂ අවධානයක් යොමු කරයි. පහත රූපසටහනෙන් දැක්වෙන්නේ SHEP පදනම් වී ඇති මෙම කුළුණු දෙක වන අතර, එය "ගොවිතැන ව්‍යාපාරයක් ලෙස ප්‍රවර්ධනය කිරීම" සහ "ගොවීන් සවිබල ගැන්වීම සහ අභිප්‍රේරණය කිරීම" යන ගැටළු දෙකම විසඳයි. SHEP හි කොඳුනාරටිය වන මෙම කුළුණු දෙකට ශාස්ත්‍රීය කතිකාවත් සහ පර්යේෂණ මගින් සහාය දැක්වෙයි: පළමුවැනි කුළුණට **"අසමමිතික තොරතුරු සහිත වෙළඳපල" නම් ආර්ථික න්‍යායක් මගිනුත්** සහ දෙවැනි කුළුණට **"ස්වයං -නීර්ණ න්‍යාය" නම් මනෝවිද්‍යාත්මක න්‍යායක් මගිනුත් උදව් ලැබෙයි.**




රූප සටහන 1. SHEP හි කුළුණු දෙකක්

## ආර්ථික න්‍යාය: "අසමමිතික තොරතුරු සහිත වෙළඳපල"

වම් පස ඇති කවය නිෂ්පාදනය පාදක කර ගත් කෘෂිකර්මයට ප්‍රතිවිරුද්ධව, වෙළඳපල පාදක කර ගත් කෘෂිකර්මාන්තයක් ක්‍රියාත්මක කිරීම සඳහා SHEP හි ප්‍රධාන උපාය මාර්ගය පිළිබිඹු කරයි. SHEP විශ්වාස කරන්නේ අසමමිතික තොරතුරු, එනම් කුඩා පරිමාණ ගොවියන් සහ එළවළු ගැණුම්කරුවන්, කෘෂිකාර්මික යෙදවුම් අලෙවිකරුවන්, මූල්‍ය ආයතන වැනි වෙළඳපල ක්‍රියාකාරීන් අතර ඇති අසමතුලිත තොරතුරු, කුඩා පරිමාණ ගොවීන් බොහෝවිට විඳවන අකාර්යක්ෂම දේශීය ආර්ථිකයේ ඇති ප්‍රබලතම සාධක වලින් එකකි. 2001 වසරේ ආර්ථික විද්‍යාව පිළිබඳ නොබෙල් ත්‍යාග ලාභීන් වන ජෝර්ජ් ඇකර්ලොෆ්, මයිකල් ස්පෙන්ස් සහ ජෝසෆ් ඊස්ටිග්ලිට්ස් විසින් යෝජනා කරන ලද "අසමමිතික තොරතුරු සහිත වෙළඳපල" නම් ආර්ථික න්‍යාය මෙම තත්ත්වය මනා ලෙස පැහැදිලි කරයි. මෙම න්‍යාය තර්ක කරන්නේ **තොරතුරු අසමමිතිය ජයගැනීම, ගණුදෙණු වල බල අසමතුලිතතාවය අඩු කිරීමට සහ කාර්යක්ෂමව දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමට ඇති යතුර ලෙසයි.** මෙම අවබෝධය මත පදනම්ව, SHEP ගොවීන් සහ ඔවුන්ගේ ව්‍යාපාරික හවුල්කරුවන් අතර ඇති තොරතුරු පරතරය පිරවීමට ගොවීන්ට වෙළඳපල සමීක්ෂණ පවත්වන ආකාරය ඉගැන්වීම මෙන්ම වෙළඳපල ක්‍රියාකාරීන් සමඟ ව්‍යාපාරික සම්බන්ධතා ගොඩ නගා ගැනීමට SHEP උපකාර කරයි (කුළුණ 1).

### තීරුව 1: SHEP මගින් තොරතුරු අසමමිතිය අවමකිරීම

### අසමමිතික තොරතුරු නිසා ඇතිවන ගැටළු

- වෙළඳාම, එනම්, ගැනුම්කරුවන්ට නිෂ්පාදකයින් සොයාගැනීමට නොහැකිවීම සහ නිෂ්පාදකයන්ට ගැනුම්කරුවන් සොයා ගැනීමට නොහැකි නිසා උද්‍යාන බෝග මිලදීගැනීම සහ විකිණීම තහවුරු නොවීම, බෝග වෙළඳපල අවශ්‍යතා සපුරාලන්නේ නැතිකම, සමහර කාලවල දී බෝග අඩුවෙන් සැපයීම ආදී.
- වෙළඳපොල මිල පිළිබඳ නොදැනුවත්කම හේතුවෙන් අසාධාරණ ලෙස අඩුවෙන් ඉල්ලා සිටින මිල ගණන් වලට ගොවීන් එකඟ විය යුතු නිසා මිල ගණන් විකෘති විය හැක.
- ගැණුම්කරුවන්ට මෙන්ම නිෂ්පාදකයින්ටද තමන්ට විශ්වාස කළ හැකි ව්‍යාපාරික ජාල ස්ථාපිත කළ නොහැකි නිසා ගනුදෙනු අඛණ්ඩව කර ගෙන යාම හෝ ස්ථායීව පවත්වා ගෙන යාම සිදු නොවේ.
- ස්ථාවර ව්‍යාපාරික සබඳතා නොමැතිව ගැනුම්කරුවන් සහ නිෂ්පාදකයින් යන දෙපාර්ශවයටම එක් එක් අවස්ථාවේ දී තම ව්‍යාපාරික හවුල් කරුවන් සොයා ගැනීමට අවශ්‍ය වන නිසා සෙවීම් කිරීමේ සහ කේවල් කිරීමේ පිරිවැය වැනි ගනුදෙනු වියදම් විශාල වේ.



## SHEP ගොවීන් විසින් ආරම්භ කරන ලබන වෙළඳපල සමීක්ෂණ සහ පාර්ශවකරුවන්ගේ රැස්වීම වැනි මාර්ග හරහා විසඳුම්



ඡායාරූපය: මලාවි

- ගොවීන්, වෙළඳපල පාර්ශවකරුවන් සමඟ ව්‍යාපාරික සම්බන්ධතා ඇති කරගනී.
- ගොවීන්, වෙළඳපල ඉල්ලීම් පිළිබඳ තොරතුරු ලබා ගනී (වඩාත් කැමති බෝග වර්ග, ප්‍රභේද, ප්‍රමාණය, ගුණාත්මකභාවය, උපරිම ඉල්ලුම පවතින කාලය ආදිය).

## අසමමිතික තොරතුරු අවම කිරීමෙන් පසු ප්‍රතිඵල

- ගොවීන් තම ව්‍යාපාර ජාල පුළුල් කරන අතර ඔවුන්ගේ ව්‍යාපාරික හවුල්කරුවන් තෝරා ගැනීමට ඇති විකල්ප ගණන වැඩිවේ.
- ගොවීන් සහ වෙළඳපල පාර්ශවකරුවන් එකිනෙකාගේ තත්වයන් තේරුම් ගෙන දෙපාර්ශ්වයටම ජයග්‍රාහී තත්වයක් ස්ථාපිත කර ගැනීමට කටයුතු කරයි.
- ගොවීන් උද්‍යාන වගා බෝග වෙළඳපොළට ඇතුල් වීමට විවිධ අවස්ථා සොයාගනී.
- අඛණ්ඩව ව්‍යාපාරික වෙලදාම් කටයුතු වල නියැලීමට හැකි වන පරිදි ගොවීන් හා වෙලදපොල පාර්ශ්වකරුවන් අතර විශ්වාසය ගොඩ නගා ගනී.

## මනෝ විද්‍යාත්මක න්‍යාය: "ස්වයං-නිර්ණ න්‍යාය"

ඇමරිකානු මනෝවිද්‍යාඥයන් වන එඩ්වර්ඩ් ඩෙසි සහ රිචඩ් රයන්, "ස්වයං-නිර්ණ න්‍යාය" නම් වූ මානව අභිප්‍රේරණය පිළිබඳ ඔවුන්ගේ න්‍යාය තුළ මිනිසුන් පොළඹවන මනෝවිද්‍යාත්මක අවශ්‍යතා තුනක් යෝජනා කළහ . **න්‍යායට අනුව , ස්වාධීනබව, නිපුණතාවය හෝ සම්බන්ධකම් සඳහා ඔවුන්ගේ අවශ්‍යතා සඳහා සහය දක්වන විට මිනිසුන්ට අභිප්‍රේරණයක් දැනේ.** SHEP සම්බන්ධයෙන් ගත් කල, මෙම මනෝවිද්‍යාත්මක අවශ්‍යතා තුන (කුළුණ 2) සැලකිල්ලට ගනිමින් වෙළඳපල කේන්ද්‍ර කර ගත් කෘෂිකර්මාන්තය සඳහා ගොවීන් තුල අභිප්‍රේරණයක් ඇති කිරීමට හැකිවන පරිදි ක්‍රියාකාරකම් මාලාවක් සැලසුම්කර ඇත. නිදසුනක් වශයෙන්, ගොවීන්ට තමන් විසින්ම වෙළඳපල සමීක්ෂණ සිදුකිරීමට මඟ පෙන්වනු ලැබීම මඟින් ඔවුන්ගේ ක්‍රියාවන් ඔවුන් විසින්ම පාලනය කරන හැඟීම මඟින් ඔවුන්ගේ ස්වාධීනබව සඳහා වන අවශ්‍යතාවයට උපකාර වේ. වෙළඳපල සමීක්ෂණ සාර්ථකව සිදුකිරීමෙන්, ගොවීන්ට හැඟෙන්නේ තමන් මෙම කාර්යයේ ප්‍රවීණත්වය (කුසලතා සහ දැනුම) ලබා ගෙන ඇති බවත්, නව කුසලතා ඉගෙනගත් බවත්ය. අවසාන වශයෙන්, SHEP වෙළඳපල සමීක්ෂණ සිදුකර ඇති එම ගොවි නියෝජිතයින්ගෙන් ඉල්ලා සිටින්නේ ඔවුන්ගේ ගොවි කණ්ඩායම වෙත ආපසු ගොස් ඔවුන්ගේ කණ්ඩායමේ සෙසු ගොවීන් සමඟ සමීක්ෂණ ප්‍රතිඵල බෙදාගන්නා ලෙසයි. එම ක්‍රියාවලිය හරහා, ගොවීන්ට කණ්ඩායම් සාමාජිකයින්ට අයත් වීමේ හැඟීමක් සහ බැඳීමක් දැනෙන අතර, එමඟින් ඔවුන්ගේ සම්බන්ධතා සඳහා මනෝවිද්‍යාත්මක අවශ්‍යතාවය ට උදව් වේ.

**තීරුව 2: අභිප්‍රේරණය ඉහළ නැංවීම සඳහා වන මනෝවිද්‍යාත්මක අවශ්‍යතා තුන:**

## ස්වාධීනබව:




ස්වාධීනබව සඳහා අවශ්‍යතාවය වන්නේ තමාගේම මුල පිරීම මත ක්‍රියා කිරීමට ඇති ආශාවයි - නැතහොත් අන් අය විසින් පාලනය නොකිරීමට ඇති ආශාවයි. මිනිසුන්ට අවශ්‍යවන්නේ චෙස් ක්‍රීඩාවේ ඉත්තන් වීමට නොව චෙස් ක්‍රීඩකයකු වීමටය. ස්වාධීනබව සඳහා ගොවීන්ගේ අවශ්‍යතාවයට සහය දැක්වීම සඳහා, ව්‍යාප්ති කාර්යමණ්ඩලයට භාෂාව ගැන සැලකිලිමත් වන ලෙස උපදෙස් දෙනු ලබන අතර, කිසි විටෙක ගොවීන්ට කර්තව්‍යයක් කිරීමට නියෝග කිරීම හෝ අණ කිරීම නොකළ යුතුය. ඔවුන් එක් එක් SHEP ක්‍රියාකාරකම්වල නියැළීමේ අවශ්‍යතාවය ගොවීන්ට සන්නිවේදනය කළ යුතු අතර, කළ යුතු කාර්යය සහ එය කරන්නේ කෙසේද යන්න සම්බන්ධයෙන් තේරීමක් ලබාදීම සහ කාර්යය කරන්නේ කෙසේද යන්න පිළිබඳ ඔවුන්ගේ අදහස්වලට සවන්දීම කල යුතුය. කර්තව්‍යය කෙරෙහි ගොවීන්ගේ අතෘප්තිය සහ විවේචනය පිළිගැනීමද වැදගත් වේ. මන්ද එවිට ගොවීන්ට ඔවුන්ගේ දෘෂ්ටිකෝණයන් අර්ථවත් ලෙස සැලකිල්ලට ගන්නා බව හැඟීම මගින්, ඔවුන් තමන්ගේම මූලිකත්වයෙන් ක්‍රියා කිරීමේ හැඟීම වැඩි දියුණු වේ.

## නිපුණතාවය



නිපුණතාවය යනු කෙනෙකුගේ පරිසරය සමඟ සඵලවත් ලෙස අන්තර් ක්‍රියා කිරීමට ඇති හැකියාවයි. කලින් සැලසුම් කළ පරිදි කාර්යයක් ඉටුකර ගැනීමට හැකිවන විට, අපගේ හැකියාවන් වැඩිදියුණු වන බව අපට හැඟෙන විට සහ අපගේ කුතුහලය තෘප්තිමත් වනවිට වැනි අවස්ථාවලදී අපට විශ්වාසයක් දැනේ. ගොවීන්ට අපහසුතාවයක් නොදැනෙන මට්ටමක තිබෙන පරිදි, ගොවීන්ට ඔවුන්ගේ ජයග්‍රහණ ලගා කර ගැනීම් නිවැරදිව ඇගැයීමකට ලක් කිරීමට හැකි වන පරිදි සහ එක් එක් පුහුණු පැවරුමේදී සකස් කර ගත් පරිදි කවදා, කුමක්, කෙසේ, කුමන අරමුණක් සඳහා විවිධ SHEP ක්‍රියාකාරකම් කිරීමට කොපමණ ගොවීන් ගණනක් අවශ්‍යදැයි පැහැදිලි ව්‍යුහයක් සැපයීම මගින්, එක් එක් SHEP ක්‍රියාකාරකම්වල කාර්යයන් සැලසුම් කිරීමෙන් ගොවීන්ගේ නිපුනත්වය සඳහා ඇති අවශ්‍යතාවයට ව්‍යාප්ති කාර්යය මණ්ඩලයට උදව් කල හැකිය.

## සම්බන්ධතාවය



සම්බන්ධතාවය යනු අන් අය සමඟ යහපත් සබඳතා ඇති කර ගැනීමට ඇති ආශාවයි. කර්තව්‍යය ලබා දෙන පුද්ගලයා සහ කාර්යය ලබාගන්නා පුද්ගලයා අතර ඇති සම්බන්ධය එම කාර්යය කෙරෙහි දෙවැන්නාගේ අභිප්‍රේරණය කෙරෙහි විශාල බලපෑමක් ඇති කරයි. අදාල සහයෝගය සඳහා ඉතාමත්ම වැදගත් දෙය වන්නේ SHEP ක්‍රියාකාරකම් සිදු කරන ගොවීන් විසින් ව්‍යාප්ති කාර්යමණ්ඩලය, කෙරෙහි විශ්වාසය තබා කටයුතු කිරීමයි. ගොවීන් සමඟ විශ්වාසය ගොඩනගා ගැනීම සඳහා, ව්‍යාප්ති කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ SHEP කටයුතු වල නියැලීමේදී ගොවීන් පවසන දේට සාවධානව ඇහුම්කන්දෙන ලෙසත්, ගොවීන් විසින් විශ්වාසය තැබිය හැකි පරිදි කායිකව සහ මනෝවිද්‍යාත්මකව ගොවීන් වෙත සේවය ලබා දීමට සූදානම්ව සිටින ලෙසත් උපදෙස් දෙනු ලැබේ.

***නිරසාරභාවය සඳහා අවශ්‍යතා දෙක සම්පූර්ණ කිරීම:***

SHEP හි ශක්තිය රදා පවතින්නේ ඉහත පැහැදිලි කරන ලද ආර්ථික හා මනෝවිද්‍යාත්මක න්‍යායන් තුළ පවත්නා වූ අවශ්‍යතා දෙකම එකවර සපුරාලීම සඳහා සියලුම ක්‍රියාකාරකම් සැලසුම් කිරීම මතයි. වෙනත් වචනවලින් කිවහොත්, SHEP වෙළඳපොලේ ඇති තොරතුරු වල අසමමිතිකබව අවම කිරීමට උත්සාහ කරන අතරම ස්වාධීනබව, නිපුණතාවය හා සම්බන්ධකම් සඳහා ගොවීන්ගේ මනෝ විද්‍යාත්මක අවශ්‍යතා සඳහා සහාය වීමයි. මෙම ද්විත්වකාර්ය මැදිහත්වීම නිසා ඉලක්කගත ගොවීන්ට SHEP පුහුණු පාඨමාලාව අවසන් වූ පසු රජයේ ආධාර නොමැතිව වුවද තම වගා ව්‍යාපාරය තමන්ගේම මූලිකත්වයෙන් කළමණාකරණය කර ගැනීමට හැකියාව ලැබේ. SHEP හි දැක්ම වන්නේ අවසානයේ දී, ගොවීන්ගේ වගා ව්‍යාපාර දිගටම කර ගෙන යමින් ඔවුන්ගේ ජීවනෝපාය වැඩි දියුණු කිරීමට හැකි වනු පිණිස යැපුම් මානසිකත්වයෙන් මිදී, ස්වයං-විශ්වාසීව කටයුතු කිරීම සඳහා ගොවීන් පුහුණු කිරීමයි.

## *1.2 SHEP වල අත්‍යවශ්‍ය පියවර හතර*

ස්වයං-නිර්ණ න්‍යායට අනුව, ගොවීන්ගේ මනෝවිද්‍යාත්මක අවශ්‍යතා තුනට සහාය වීම පිණිස ඔවුන්ගේ අභිප්‍රේරණය ඉහල නැංවීම සඳහා හැකියා සංවර්ධන පුහුණු මාලාවක් SHEP විසින් පිරි නමනු ලබයි. උදාහරණයක් ලෙස SHEP මගින් ප්‍රශස්ථ අනුපිළිවෙලකට විවිධ පුහුණු, ගොවීන් හට ලබා දෙයි. මෙම පිලිවෙලට "SHEP වල අත්‍යවශ්‍ය පියවර හතර" ලෙස නම් කරනු ලබන අතර ඒවා පහතින් දැක්වේ.

| පියවර 4 | කටයුතු |
|---|---|
| **1. ගොවීන් සමඟ ඉලක්කය බෙදා ගැනීම.** | සංවේදීකරණ වැඩමුළුව |
| **2. ගොවීන් දැනුවත් වීම.** | සහභාගීත්ව මූලික සමීක්ෂණය<br>-පාර්ශවකරුවන්ගේ රැස්වීම (අනිවාර්ය නොවේ)<br>වෙළඳපල සමීක්ෂණය |
| **3. ගොවීන් තීරණ ගැනීම.** | ඉලක්කගත බෝග තේරීම<br>බෝග කැලැන්ඩර සෑදීම |
| **4. ගොවීන් කුසලතා ලබා ගැනීම.** | ක්ෂේත්‍රයේ පුහුණුවීම් |
| පසු විපරම් සහ අධීක්ෂණය (සහභාගී අවසාන සමීක්ෂණය ඇතුළුව) | |

රූප සටහන 2: SHEP වල අත්‍යවශ්‍ය පියවර හතර

[පියවර 1- **ගොවීන් සමඟ ඉලක්කය බෙදාගැනීම**]: SHEP සිය ඉලක්කය සහ දැක්ම ප්‍රතිලාභී ගොවීන් සමඟ බෙදාගැනීම තීරණාත්මක පළමු පියවර ලෙස සලකයි, පුහුණු පාඨමාලාව පුරාවටම ආර්ථික වශයෙන් ලාභදායී ගොවි ව්‍යාපාර ක්‍රියාවට නැංවීමට වැඩිම පරිශ්‍රමයක් දරන්නේ ගොවීන් වීම ඊට හේතුවයි. SHEP සාක්ෂාත් කර ගැනීමට උත්සාහ කරන ඉලක්කය, ගොවීන්ට ඒත්තු ගැන්විය යුතු අතර ඊට ඔවුන් එකඟ විය යුතුය. ඉලක්කගත ගොවීන් සමඟ මෙම ඉලක්කය බෙදාගැනීමට සිදු කරන විශේෂිත මාර්ගය වන්නේ **දැණුවත් කිරීමේ වැඩමුලුවක් (සංවේදීකරණ වැඩමුළුවක්)** සංවිධානය කිරීමයි (මෙම අත්පොතෙහි 2 කොටසෙහි "1.1. සංවේදීකරණ වැඩමුළුව" බලන්න).

[පියවර 2 - **ගොවීන්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීම**]: දෙවන පියවර වන්නේ උද්‍යාන බෝග වගාවේ අවස්ථා සහ විභවයන් ගැන ක්ෂේත්‍රයේ ගොවීන්ගේ දැනුවත්භාවය ඉහල නැංවීම කෙරෙහිය. මෙම පියවර අතිශයින් වැදගත් වන්නේ මෙම දැනුවත්භාවය නොමැතිව ගොවීන් තම ගොවිතැන් පිළිවෙත් වඩා යහපත් ලෙස වෙනස්කිරීමට කැපවීම සඳහා පෙළඹවීමට ඇති ඉඩකඩ අඩු බැවිනි. මෙම පියවරට ප්‍රධාන වශයෙන් ගොවීන් ව්‍යාපාර සහ වෙළඳපල යථාර්ථයන්ට නිරාවරණය කිරීම ඇතුළත් වේ.

පියවර 2 සඳහා වන ක්‍රියාකාරකම් වලට **සහභාගීත්ව මූලික සමීක්ෂණය, පාර්ශවකරුවන්ගේ රැස්වීම** (අනිවාර්ය නොවන විකල්ප ක්‍රියාකාරකමක් ලෙස) සහ ගොවීන් විසින්ම **සිදුකරන වෙළඳපල සමීක්ෂණය** ඇතුළත් වේ. (මෙම අත්පොතෙහි 2 වන කොටසෙහි "2.1. සහභාගීත්ව මූලික සමීක්ෂණය", "2.2. පාර්ශවකරුවන්ගේ රැස්වීම (විකල්ප ක්‍රියාකාරකම්)", සහ "2.3. වෙළඳපල සමීක්ෂණය ” බලන්න). පාර්ශවකරුවන්ගේ රැස්වීම විකල්ප ක්‍රියාකාර කමක් ලෙස සලකන බව කරුණාවෙන් සලකන්න; වෙනත් වචන වලින් කිවහොත්, ප්‍රමාණවත් මූල්‍ය හා මානව සම්පත් සුරක්ෂිතව ඇති විට ඉටු කල යුතු කාර්යයක් වන අතර, ඉලක්කගත ප්‍රදේශවල ප්‍රාදේශීය සමාජ-ආර්ථික තත්ත්වයන් අනුව මෙම ක්‍රියාකාරකම පැවැත්වීම සුදුසු සහ ඵලදායි බවට තහවුරු කර ගත් පසු සිදුකළ යුතු ක්‍රියාකාරකමක් ද වේ.


[**පියවර 3 -ගොවීන් තීරණ ගැනීම**]: දෙවන පියවරේදී ගොවීන් ලබාගත් දැනුවත්භාවය සහ නව දැනුම සමඟ, ඔවුන් පසුව වෙනස් විමට තීරණ ගනී. මෙය තුන්වන පියවරයි. මෙම ක්‍රියාවලියට ගොවීන් විසින් **ඉලක්කගත බෝග තෝරා ගැනීම සහ බෝග කැලැන්ඩරය** නම් සැලැස්මක් සැකසීම ඇතුළත් වන අතර එමගින් ඔවුන්ට තම ඉලක්ක ගත බෝග නියමිත වේලාවට ඔවුන් කැමති නිශ්චිත වෙළඳපොළ වෙත උපාය මාර්ගිකව සැපයීමට හැකිවනු ඇත. (මෙම අත්පොතෙහි 2 කොටසෙහි "3.1. ඉලක්ක බෝග තේරීම සහ 3.2. බෝග කැලැන්ඩරය සෑදීම බලන්න).

[**පියවර 4. ගොවීන් කුසලතා අත්කර ගැනීම**]: අවසාන පියවර ලෙස, SHEP ක්‍රියාත්මක කරන්නන් විසින් ගොවීන්ට තාක්ෂණික විසඳුම් ලබාදෙයි, එනම් ගොවීන් තෝරාගත් බෝග සඳහා ක්ෂේත්‍ර අභ්‍යන්තර පුහුණුව ලබාදීම කරයි. එවිට ඔවුන් සැලසුම් කර ඇති පරිදි බෝග නිෂ්පාදනය කළ හැකිය (මෙම අත් පොතෙහි 2 වන කොටසෙහි "4.1. ක්ෂේත්‍ර පුහුණු” බලන්න).

[**පසු විපරම් සහ අධීක්ෂණය**]: පියවර හතර අවසන් කිරීමෙන් පසු, ගොවීන් තම දෛනික ගොවි ව්‍යාපාරයට තමන් ලබාගත් දැනුම යොදවන බව සහතික කිරීම සඳහා පසුවිපරම් සහ අධීක්ෂණය සිදු කරනු ලැබේ (“පසු විපරම් සහ අධීක්ෂණය (සහභාගිත්ව, අවසාන සමීක්ෂණය ඇතුළුව)” මෙම අත්පොතෙහි 5 බලන්න.)

## *අභිප්‍රේරණය සහ නිපුණතා සංවර්ධනය අතර අන්තර් සම්බන්ධය:*

4 වන පියවර (ක්ෂේත්‍ර පුහුණුවීම්) වෙත කෙලින්ම පැනීම වෙනුවට, කාලය වැය වන පියවර 4 ක් SHEP ප්‍රවේශයේ දී ගනු ලබන්නේ ඇයි? ඒ නව කුසලතා පිළිබදව ඉගෙනගෙන ඒවා උකහාගැනීම සඳහා ගොවීන් පලමුවෙන් අභිප්‍රේරණය කිරීම අවශ්‍ය බව SHEP විශ්වාස කරන නිසාය. ගොවීන්ගේ නව නිපුණතා සංවර්ධනය හා ඔවුන් අභිප්‍රේරණය කිරීම අතර අන්තර් සම්බන්ධතාවය සැලකීමේ දී පුහුණු කටයුතු මාලාවක් කෙරෙහි සැලකිලිමත් විය යුතු බව SHEP විශ්වාස කරයි. පහත රූප සටහනේ දැක්වෙන පරිදි, ගොවීන් අභිප්‍රේරණය නොවුනහොත්, ඔවුන්ට අලුත් දෙයක් ඉගෙන ගැනීමට අපහසු වනු ඇත. අනෙක් අතට, ඔවුන්ගේ කුසලතා වැඩිදියුණු වන බව ඔවුන්ට දැනිය හැකි නම්, ඔවුන්ගේ ආත්ම විශ්වාසය ශක්තිමත් වන අතර තවත් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට ඔවුන් අභිප්‍රේරණය වනු ඇත.




රූප සටහන 3: අභිප්‍රේරණය සහ කුසලතා සංවර්ධනය අතර අන්තර් සම්බන්ධය

ගොවීන්ගේ අභිප්‍රේරණය හා කුසලතා සංවර්ධනය අතර අන්තර් සම්බන්ධතාවය ගැන සැලකීමේ දී, SHEP හි පියවර හතර, හෝ කෙන්නියාවේ දී පරීක්ෂා කර තහවුරු කරන ලද ක්‍රියාකාරකම්වල ප්‍රශස්ත අනුපිළිවෙල සැලකිල්ලට ගනු ලැබේ. එම නිසා ගොවීන්ගේ කුසලතා අත්පත් කරගැනීම සහ ඉහළ අභිප්‍රේරණය වීම අනුව බිම් මට්ටමේ දී ප්‍රශස්ථ ප්‍රතිපල ලබා ගැනීමට හැකි වනු ඇත.

## *1.3 SHEP හි ස්ත්‍රී පුරුෂභාවය:*

SHEP ප්‍රවේශය විසින්, කුඩා පරිමාණ උද්‍යාන බෝග වගා ගොවීන්ගේ ගොවිපල ව්‍යාපාර කළමණාකරණයේ දී **අත්‍යාවශ්‍ය හා අනුබද්ධිත අංගයක් ලෙස ස්ත්‍රී-පුරුෂ භාවය** සැලකිල්ලට ගනු ලැබේ. SHEP වල ඉලක්කය ලගා කරගැනීමේ දී ස්ත්‍රී-පුරුෂ භාවය ඉතා වැදගත් පැත්තක් වේ. උදාහරණයක් ලෙස ගොවි කුටුම්භ වල ජීවනෝපාය ඉහල නැංවීම කර ගත හැක. යම්කිසි මැදිහත්වීමක දී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සැලකිල්ලට නොගතහොත් තීරණ ගැනීමේ දී ගොවි යුවල් අතර එකගතාවයකට එළඹීමට නොහැකිවීම් ඇති විය හැකි ය. එසේම එක් කලත්‍රයකු හට වෙහෙසකාරී හා කාලය කා දමන ගොවිපල කාර්යයන් වල නියැලීමෙන් ඒවා දරා ගැනීමට සිදු වේ. කෙන්නියාවේ එක් එක් කටයුත්තට අදාල ස්ත්‍රී-පුරුෂ භාවයට අදාල ගැටලු ප්‍රවේශමෙන් ආමන්ත්‍රණය කල නිසා එහි ප්‍රතිපලයක් ලෙස ගොවිපල ව්‍යාපාර කළමණාකරණයේ දී ගොවි යුවලවල් ක්‍රියාකාරී පුද්ගලයන් බවට පත් විය. අවසානයේ දී මෙම වෙනස එම ගොවීන්ගේ ජීවනෝපාය වැඩි දියුණු වීමට හේතු වූවේ ය.

ස්ත්‍රී-පුරුෂ භාවයට සම්බන්ධ සම්මතයන් හා ගැටලු විශාල පරාසයක පැතිරී ඇති අතර ඒවා රටවල් අනුව හා ප්‍රදේශ අනුව වෙනස් වේ. උදාහරණයක් ලෙස රැස්වීමක දී කාන්තාවන් හා පුරුෂයන් එකට වාඩි නොවිය යුතු බව සමහර ප්‍රජාවන් හි පුද්ගලයන් සිතයි. තවත් සමහර ප්‍රජාවන් වල ස්වාමි පුරුෂයන් නගරයෙන් පිටව ගොස් සංක්‍රමික කම්කරුවන් ලෙස වැඩ කරන නිසා ඔවුන්ගේ භාර්යාවන්ට පමණක් කෘෂිකාර්මික කටයුතු වල නිරත වීමට සිදු වී තිබේ. මේ අවස්ථා දෙකේ දීම, ස්වාමියෙක් හා භාර්යාවක් විධියට කුටුම්භයේ මූල්‍ය කළමණාකරණය කරන මූලික ඒකකය වන නිසා, ගොවිතැන ව්‍යාපාරයක් ලෙස ප්‍රවර්ථනය

කිරීමේ දී ඔවුන් දෙදෙනාම ව්‍යාපාරික හවුල්කරුවන් ලෙස සැලකීම ඉතා වැදගත් වේ. එමනිසා ඉලක්ක ප්‍රජාවන්ගේ ස්ත්‍රී-පුරුෂ භාවයන්ට අදාල සම්බන්ධතා හා සම්මතයන් පිළිබදව තදින් සොයා බලා ප්‍රජාවේ ප්‍රාදේශීය තත්වයන්ට ගැලපෙන සේ ව්‍යාප්ති කටයුතු සැලසුම් කරන ලෙසට SHEP ක්‍රියාත්මක කරන්නන්ට උපදෙස් ලබා දී ඇත.




රූප සටහන 4: SHEP හි ලිංග ප්‍රවාහය

රූප සටහන 4 හි පෙන්වා ඇති පරිදි, කෙන්නියාවේ SHEP ස්ත්‍රී පුරුෂ භාවය ආශ්‍රිත ගැටලු වෙනස් දෘෂ්ඨි කෝණ තුනකින් ආමන්ත්‍රණය කරනු ලබයි.. (1) සමාන අවස්ථා. (2) ස්ත්‍රී-පුරුෂ භූමිකාවන් සංශෝධනය කිරීම. (3) සාමූහිකව තීරණ ගැනීම. මෙම දෘෂ්ඨි කෝණයන් SHEP වලට ඇතුලත් කිරීම සදහා SHEP ක්‍රියාත්මක කිරීමේ සෑම පියවරකදීම ස්ත්‍රී-පුරුෂ සමාජභාවය ඒකාබද්ධ කිරීමට කටයුතු කිරීම ඉතා වැදගත් වේ. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය ඒකාබද්ධ කිරීම සදහා භාවිතා වූ සමහර වැදගත් දර්ශක[1] ගණනාවක්, “2 කොටසෙහි: භාවිතය (Practice)” එක් එක් කාර්යයන් සදහා “පිරික්සුම් ලැයිස්තුවක්” ලෙස මෙම අත්පොතෙහි දක්වා ඇත. කෙන්නියා වල ඇති ස්ත්‍රී-පුරුෂ භාවයට අදාල තත්වයන්ට සමාන තත්වයන් ඉලක්ක ප්‍රජාවේ පවතී නම්, එම දර්ශකම භාවිතයට ගත හැක.

1 අත්පොතෙහි ලැයිස්තුගත කර ඇති දර්ශක සාමාන්‍ය ස්වභාවයක් වන අතර එක් එක් රටෙහි හෝ ප්‍රදේශයේ තත්ත්වයට විශේෂිත නොවේ. එබැවින්, ඉලක්කගත ප්‍රජාවන්ගේ ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ ගැටළු පිළිබඳව ප්‍රවේශමෙන් සොයා බලන ලෙස ක්‍රියාත්මක කරන්නන්ට උපදෙස් දෙනු ලැබේ. ඔවුන්ගේ රටවල හෝ කලාපවල ස්ත්‍රී පුරුෂ සමාජභාවය ප්‍රධාන ප්‍රවාහයට පහසුකම් සපයන හොඳම දර්ශක සකස් කරන්න.

# 2. SHEP හි වාසි

## 2.1 SHEP අනෙකුත් ප්‍රවේශයන්ගෙන් වෙනස් වන්නේ කෙසේද?

සම්ප්‍රදායික ප්‍රවේශයන් භාවිතා කරන උපාංග හා තාක්ෂණයන්ට වඩා වෙනස් ඒවා SHEP විසින් භාවිතා කරයි. SHEP වල මග පෙන්වීමේ මූලධර්මය වන්නේ "1.1 SHEP වල ප්‍රධාන කුළුණු දෙක" හි විස්තර කර ඇති ආකාරයට, කටයුතු ක්‍රියාත්මක කිරීම, පුරාවටම ගොවීන් අභිප්‍රේරණය කිරීම හා සවි බල ගැන්වීමයි. එම නිසා ක්ෂේත්‍රයේ දී බලපෑමක් ඇති කිරීමේ උපරිම අවධානය සහිතව මැදිහත් වීමේ පැත්තෙන් හැකියා සංවර්ධනය කිරීම සදහා SHEP හැමවිටම යොමු වෙයි. SHEP පිළිපදින්නාවූ මෙම ගොවියා කේන්ද්‍ර කොට ගත් පුහුණුවට කදිම උදාහරණ කීපයක් මෙහි දැක්වේ.

### දැණුවත් කිරීමේ වැඩමුළුව (සංවේදීකරණ වැඩමුළුව):



ඡායාරූපය කෙන්නියාව

- **SHEP** යනු හුදෙක්ම තාක්ෂණික සහයෝගයක්ම පමණක් බවත්, ගොවියන්ට සෘජුවම ලබා දෙන මූල්‍යමය හෝ ද්‍රව්‍යමය සහයෝගයක් නොවන බවත් ගොවීන්ට දන්වනු ලැබේ.
- ගොවීන්ගේ තාක්ෂණික හැකියාව සංවර්ධනය කර ගැනීම හරහා ස්වයං විශ්වාසී වීම පිණිස **SHEP** වලට සහභාගී වීමට ගොවීන් එකග වේ.

### මූලික සමීක්ෂණය සහ අවසාන සමීක්ෂණය:

- ව්‍යාප්ති කාර්ය මණ්ඩලය සහ ගොවීන් එක්ව සමීක්ෂණ පවත්වයි.
- අවම නමුත් තීරණාත්මක දත්ත රැස්කරනු ලබන අතර ගොවීන්ටම සමීක්ෂණ පෝරම පිරවිය හැක.

### පාර්ශවකරුවන්ගේ රැස්වීම/සංසදය (අනිවාර්ය නොවේ):

- කුඩා පරිමාණ උද්‍යාන වගා කර්මාන්තයේ වඩාත්ම අදාළ වෙළඳපල ක්‍රියාකාරීන්ට පමණක් රැස්වීමට ආරාධනා කරනු ලැබේ. ගොවීන්ට පහසුවෙන් සහභාගිවන්නන් එකිනෙකා සමග ව්‍යාපාරික සාකච්ඡා පැවැත්වීමට හැකියාව ලැබේ.

### වෙළඳපල සමීක්ෂණය:

- ගොවීන් ආසන්න වෙලඳපොලවල් වෙත ගොස් බෝග අලෙවි කෙරෙන ආකාරය නිරීක්ෂණය කරයි. ඔවුන් මිල පිළිබඳ තොරතුරු එකතු කරනවා පමණක් නොව, අලෙවි කළහැකි බෝග, අවශ්‍ය ගුණාත්මකභාවය, සහ ප්‍රමාණ වැනි වෙළඳපල අවශ්‍යතා ද අවබෝධ කර ගනී.
- ගොවීන් වෙළඳපල පාර්ශවකරුවන් දැන හඳුනාගෙන ඔවුන් සමඟ පුද්ගලික සම්බන්ධතා ජාළ ඇතිකර ගනී.

### ඉලක්ක බෝග තේරීම සහ බෝග කැලැන්ඩර සෑදීම:


- ගොවීන් වෙලදපොළ සමීක්ෂණයේ දී රැස්කර ඇති වෙළඳපල තොරතුරු මත පදනම්ව කුමන බෝග කුමන වේලාවක දී වගා කල යුතු දැයි, යන්න ගැන ව්‍යාප්ති කාර්ය මණ්ඩලයෙන් ලැබෙන තාක්ෂණික උපදෙස් මත ගොවීන් විසින්ම තීරණය කරනු ලැබේ.

### ක්ෂේත්‍රයේ පුහුණු වීම්:

- ගොවීන් තෝරාගත් බෝග පිළිබඳව, ව්‍යාප්ති කාර්ය මණ්ඩලය විසින් ගොවීන්ට පුහුණුව ලබාදෙයි. ඒ අනුව මෙය ඉල්ලුම මත පදනම් වූ පුහුණුවක් වේ.

## *2.2 SHEP ප්‍රවේශයේ වර්තමාන බලපෑම් (Effects) සහ ඉදිරි බලපෑම් (Impacts):*

අනෙකුත් SHEP ක්‍රියාත්මක කරන රටවල මෙන්ම කෙන්යාවේ දී ලද අත්දැකීම් අනුව ඉලක්ක ගොවීන් හා වෙලදපොළ පාර්ශ්වකරුවන් යන දෙකොට්ඨාසය මතම බොහෝ ධනාත්මක වර්තමාන බලපෑම් හා ඉදිරි බලපෑම් කල හැකි බව SHEP ප්‍රවේශය හොදින් ඔප්පු කොට ඇත. SHEP ක්‍රියාත්මක කිරීමෙන් පසුව ඇති වන පොදු වෙනස්කම් කීපයක් පහත ලෙස දැක්විය හැක.




රූප සටහන 5: SHEP පසු ධනාත්මක වෙනස්කම්

## ගොවිතැන් ක්‍රම වල සිදු වන වෙනස්කම්:

- SHEP මගින් ගොවීන්ට හඳුන්වාදී ඇති වගා තාක්ෂණයන් භාවිතයට ගැනීම
- ගොවිපල අවශ්‍යතා අනුව ගොවීන් වගා කරන බෝග හෝ බෝග වල ප්‍රභේද වෙනස් කිරීම
- ගොවීන් සහතික කල බීජ භාවිතා කිරීම
- ඉහලම ඉල්ලුමක් තිබෙන කාල පරාසයේ දී අස්වනු නෙලීමට හැකි වන පරිදි සිටුවීමේ කාලය වෙනස් කිරීම.
- වෙලදපොල ඉල්ලුම සපුරාලිය හැකි වන ලෙස උද්‍යාන බෝග වගා වපසරිය වැඩි කිරීම
- අලෙවි කල හැකි බෝග වල ගුණාත්මය ඉහල නැංවීම සදහා යෝග්‍ය බෝග පාලන ක්‍රම අනුගමනය කිරීම

## කළමනාකරණ සහ අලෙවිකරණ භාවිතයන්හි වෙනස්කම්:

- ගොවීන් නිතිපතා වෙළඳපල සමීක්ෂණ පැවැත්වීමට පටන් ගැනීම.
- වගා කරන බෝග තීරණය කිරීමට පෙර ගොවීන් විසින් වෙලදපොල අවශ්‍යතා ගැන සොයා බැලීම
- ගොවීන් ගොවිපල වාර්ථා තබා ගැනීම ආරම්භ කිරීම
- ගොවීන් ගොවිපල කටයුතු සැලසුම් සකස් කිරීම ආරම්භ කිරීම
- ගොවීන් විභව ගැනුම්කරුවන් සමග සම්බන්ධතා පවත්වා ගන්නා අතර දුරකථන මගින් නිරන්තරයෙන් තොරතුරු හුවමාරු කර ගැනීම
- ගොවීන් වෙලදපොලට අවශ්‍ය විධියට සමහර බෝග ඇසිරීම
- ගොවීන්ට විශ්වාසය තැබිය හැකි නිත්‍ය පාරිභෝගිකයින් (සිල්ලර වෙලෙදුන්, තොග වෙලෙදුන්, අතරමැදියන් ආදී) ලබා ගැනීම
- අපනයන සමාගම් සමග හෝ ආහාර සකසන සමාගම් සදහා කොන්ත්‍රාත් ගොවිතැන් කිරීම ආරම්භ කිරීම
- සිල්ලර වෙලෙන්දන් බෝග මිල දීගැනීම සදහා ගොවීන්ගේ ගොවිබිම් වෙත පැමිණි කල්හී වාහන වලට බෝග පැටවීම සදහා සමහර කණ්ඩායම් සාමාජිකයින් උදව් කිරීම සහතික වීම

## ගොවි කණ්ඩායම්වල ක්‍රියාකාරකම්වල වෙනස්කම්:

- ගොවි කණ්ඩායම් වඩාත් ශක්තිමත් එකමුතුකමක් ගොඩ නගා ගන්නා අතර සාමාජිකයින් අතර විශ්වාසයක් ගොඩ නගා ගැනීම
- ගොවීන් කණ්ඩායම්, මිලදීගැනීම් හා අලෙවි කිරීම් ආරම්භ කිරීම
- කණ්ඩායමක් ලෙස අඛණ්ඩව වෙලදපොලට නිෂ්පාදන සැපයීම සමඟා ගොවි කණ්ඩායම් සාමාජිකයින් අතර සම්බන්ධීකරණයක් ගොඩ නගා ගැනීම
- ගොවීන් උද්‍යාන බෝග වගාවන්ගෙන් ලබා ගන්නා මුදල් ගොවිතැන් කිරීම සදහා ජල සම්පාදන පහසුකම් වැනි මූලික යටිතල පහසුකම් වල ආයෝජනය කිරීම
- ගොවි කණ්ඩායම් ඔවුන්ගේ සාමාජිකයින් සංඛ්‍යාව වැඩි කර ගන්නා අතර සමූපකාර වශයෙන් නිල වශයෙන් ලියා පදිංචි කිරීම

## ජීවන මාර්ගවල වෙනස්කම්:

- ආදායමේ වැඩි වීමත් සමඟ ගොවීන් නිවසක්, යතුරුපැදියක්, මෝටර් රථයක් හෝ ඉඩමක් මිලදී ගැනීම
- ගොවීන් ඔවුන්ගේ දරුවන් පෞද්ගලික පාසල් හෝ උසස් මට්ටමේ අධ්‍යාපන ආයතන වලට යැවීම
- ගොවීන් තමන්ගේ උද්‍යාන බෝග වගාවන්ගෙන් උපයා ගන්නා මුදල් කොණ්ඩා සැකසීම, කුඩා වෙලද කුටි පවත්වා ගෙන යාම වැනි අර්ධ කාලීන ගොවිතැනින් පිටස්තර ආදායම් මාර්ග වල ආයෝජනය කිරීම .

## පවුල් සබඳතාවල වෙනස්කම්:

- ස්වාමි පුරුෂයන් හා භාර්යාවන් ගොවිපල කළමණාකරණය සම්බන්ධයෙන් අදහස් හුවමාරු කර ගැනීම ආරම්භ කල අතර සාමූහිකව තීරණ ගැනීම
- ස්වාමි පුරුෂයන් හා භාර්යාවන් ස්ත්‍රී-පුරුෂ භාවයට අදාල කාර්යයන් සමාලෝචනයට ලක් කල අතර ගොවිතැනේ දී හා ගෘහස්ථ කටයුතු වලදී වඩාත් කාර්යක්ෂමව ශ්‍රම විභාජනය කල හැකි ආකාරය සොයා ගැනීම
- ස්වාමි පුරුෂයන් හා භාර්යාවන් එකට එකතු වී පවුලේ අය-වැය කළමණාකරණය කිරීම ආරම්භ කිරීම
- ස්වාමි පුරුෂයන් මධ්‍යසාර භාවිතය අඩු කරමින් වැඩි කාලයක් ගොවිතැන් කටයුතු සදහා යෙදවූ අතර මේ නිසා ඔවුන්ගේ භාර්යාවන් සමග හොද සම්බන්ධතාවයන් ගොඩ නගා ගැනීමට හැකි වීම
- දෙමාපියන්ගේ ගොවිතැන් කටයුතු වලට උදව් කිරීමට ඔවුන්ගේ දරුවන් විසින් ආරම්භ කිරීම
- රැකියා සොයා ගෙන නගර වෙත ඇදී යාම වෙනුවට, තරුණ ගම්වාසීන් ගමේම නතර වී ගොවිතැන් කටයුතු වල නිරත වීම ආරම්භ කිරීම

# 2 කොටස: පුහුණුව

"2 කොටස: පුහුණුව" SHEP ප්‍රවේශයේ එක් එක් ක්‍රියාකාරකම විස්තරාත්මකව සිදු කරන්නේ කෙසේද යන්න පැහැදිලි කරයි.

# 1.පියවර 1 - ගොවීන් සමඟ ඉලක්කය බෙදා ගැනීම

SHEP ප්‍රවේශයේ පළමු පියවර වන්නේ SHEP හි ඉලක්කය ගොවීන් සමඟ බෙදා ගැනීමයි. SHEP යනු ගොවීන්ට ද්‍රව්‍ය හෝ මූල්‍ය ආධාර සැපයීමේ ප්‍රවේශයක් නොවේ. එය SHEP හි ඔවුන්ගේ සහභාගීත්වය තුළින් නව දැනුම සහ කුසලතා ඉගෙන ගැනීමට ගොවීන් දැඩි කැපවීමක් කළ යුතු කුසලතා සංවර්ධන මැදිහත්වීමකි. SHEP හි අවසාන ඉලක්කය වන්නේ ගොවීන් තාක්ෂණික හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීමයි, එවිට ඔවුන්ට ව්‍යවසායක මානසිකත්වයකින් වෙළඳපල පාදක කර ගත් කෘෂිකර්මය, හෝ "ව්‍යාපාරයක් ලෙස ගොවිතැන් කිරීම" දිගටම පවත්වාගන යා හැකිය. මෙම පණිවිඩය ඉලක්කගත ගොවීන් වෙත පැහැදිලිව සන්නිවේදනය කළ යුතු අතර එමඟින් ඔවුන් SHEP ඉලක්කය සපුරා ගැනීමට පෙළඹෙනු ඇත.

### *1.1. දැනුවත් කිරීමේ වැඩමුළුව (සංවේදීකරණ වැඩමුළුව)*

| පියවර 4 | කටයුතු |
|---|---|
| **1. ගොවීන් සමඟ ඉලක්කය බෙදා ගැනීම.** | **සංවේදීකරණ වැඩමුළුව** (අපි මෙතැන) |
| **2. ගොවීන් දැනුවත් කිරීම.** | සහභාගීත්ව මූලික සමීක්ෂණය<br>-පාර්ශවකරුවන්ගේ රැස්වීම/සංසදය (අනිවාර්ය නොවේ)<br>වෙළඳපල සමීක්ෂණය |
| **3. ගොවීන් තීරණ ගැනීම.** | ඉලක්කගත බෝග තේරීම<br>බෝග කැලැන්ඩර සෑදීම |
| **4. ගොවීන් කුසලතා ලබා ගැනීම.** | ක්ෂේත්‍රයේ පුහුණුවීම් |
| පසු විපරම් සහ අධීක්ෂණය (සහභාගී අවසාන සමීක්ෂණය ඇතුළුව) | |

ඇයි? - **අරමුණු**

දැණුවත් කිරීමේ වැඩමුළුවේ (සංවේදීකරණ වැඩමුළුවේ) අරමුණ වන්නේ ගොවීන් සමඟ SHEP දැක්ම සහ ඉලක්කය බෙදා ගැනීම යි. එනම්, ව්‍යවසායක අභිලාෂයන් සහිත ස්වයං-විශ්වාසයෙන් යුත් ගොවීන් බවට පත්වීමට ඔවුන්ට උපකාර කිරීමයි.

මොනවාද? - **දළ සටහන**

ඉලක්කගත ගොවීන් තෝරාගත් පසු, SHEP ප්‍රවේශයේ ඉලක්කය මෙන්ම SHEP පුහුණු පාඨමාලාවේ විස්තර සහ කාල රාමුව පැහැදිලි කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩමුළුව (සංවේදීකරණ වැඩමුළුව) පවත්වනු ලැබේ.



## කෙසේද? - ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ඉඟි:

- ක්‍රියාත්මක කරන්නන් සහ ගොවීන් අතර SHEP හි දැක්ම බෙදා ගන්නා ආරම්භක සිදුවීමක් ලෙස දැනුවත් කිරීමේ වැඩමුළුව (සංවේදීකරණ වැඩමුළුව) වැදගත් වේ.
- දැක්ම සාක්ෂාත් කර ගත හැක්කේ වෙළඳපල පාදක කරගත් කෘෂිකර්මාන්තය ඉදිරියට ගෙනයාම සඳහා ගොවීන්ගේම මුලපිරීම් හරහා පමණක් බව ගොවීන් තේරුම් ගෙන එකඟ වෙති.
- SHEP යනු තනිකරම රජයෙන් කිසිදු මූල්‍යමය සහ ද්‍රව්‍යමය ආධාරයක් ලබා නොදී තාක්ෂණික සහාය ලබාදීමක් බව ගොවීන් තේරුම් ගනී.



## පියවර - ක්‍රියාත්මක කිරීමේ ක්‍රියා පටිපාටි (අවශ්‍ය කාලය[2]: පැය 1-2)

1. ප්‍රජා ශාලාවක්, පල්ලියක්, පාසලක්, කණ්ඩායම් නායක නිවසක් වැනි ගොවීන්ට පහසුවෙන් රැස්විය හැකි ස්ථානයක රැස්වීමක් කැඳවන්න.
2. කණ්ඩායම භාරව සිටින ව්‍යාප්ති කාර්ය මණ්ඩලය ඇතුළු ක්‍රියාත්මක කරන්නන් SHEP ප්‍රවේශයේ දර්ශනය දෙපාර්ශවයටම තේරුම්ගත හැකි පරිදි පැහැදිලි කරයි.
3. තවද SHEP ක්‍රියාකාරකම්වල විස්තර හා කාල රාමුව, පුහුණු පාඨමාලාව සම්පූර්ණ කිරීම සඳහා ගොවීන්ගේ භූමිකාවන් සහ වගකීම් පැහැදිලි කිරීම ද කළ යුතුය.



ඡායාරූපය: සිම්බාබ්වේ

4. ක්‍රියාත්මක කරන්නන් විසින් පිරිමි සහ කාන්තා යන දෙපිරිසම පුහුණුවීම් වලට සමානව සහභාගීත්වය අවධාරණය කළ යුතු වේ. ඊට අමතරව, සාමාජිකයින් සහ ඔවුන්ගේ කලත්‍රයා පුහුණු පාඨමාලාව පුරා තීරණ ගැනීම සහ SHEP ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරීව සහභාගී කළ යුතුය. පුහුණු පාඨමාලාව ක්‍රියාත්මක කරන්නන් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තා සවිබල ගැන්වීමේ වැදගත්කම පිළිබඳ ගොවීන්ට සාකච්ඡා කිරීමට උපකාර කළ යුතුය.




ඡායාරූපය: ටකේෂි කුනෝ/ජයිකා,

2"අවශ්‍ය කාලය" යන්නට සුරක්ෂිත ස්ථානයක් ලබා ගැනීම, ගොවීන් සමඟ සන්නිවේදනය කිරීම, සූදානම් වීමේ කාලය වැනි දෑ ඇතුළත් නොවේ.

**පිරික්සුම් ලැයිස්තුව - මෙම ක්‍රියාකාරකමෙන් පසු තහවුරු කළ යුතු කරුණු**

- ඉලක්කගත ගොවීන් ඉදිරි පුහුණුවීම්වල කාලසටහන තේරුම් ගෙන එකඟ වන බව.
- ඉලක්කගත ගොවීන්, SHEP හි සහභාගිවන්නන් ලෙස තමන් සතු කාර්යභාරයන්, වගකීම් සහ අයිතිවාසිකම් මොනවාද යන්න තේරුම් ගෙන පැහැදිලි කිරීම.
- ඉලක්කගත ගොවීන්ට SHEP පුහුණු සැසි සම්පූර්ණ කිරීම සඳහා ඔවුන් විසින් සාක්ෂාත් කර ගන්නා ඉලක්කය ගැන සිතා බලා පැහැදිලි කිරීම
- සහභාගිවන්නන්ගේ පිරිමි සහ ගැහැණු අනුපාතය සමතුලිත බව.
- ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තා සවිබල ගැන්වීම පිළිබඳ සාකච්ඡාවක් පවත්වන ලද බව හා (1) පිරිමි සහ කාන්තා සාමාජිකයින්ගේ සහ (2) සාමාජිකයින්ගේ සහ ඔවුන්ගේ කලත්‍රයන්ගේ සහභාගීත්වය දිරිමත් කරන ලද බව.

**දෝෂ නිරාකරණය කිරීම - නිතර ඇතිවන ගැටළු සඳහා විසඳුම්**

**ප්‍ර: ගොවීන් "අත්පත්‍රිකා" අපේක්ෂා කරයි** - පෙර පැවති ව්‍යාපෘති/වැඩසටහන් සියල්ලම පාහේ ගොවීන්ට යම් ආකාරයක ද්‍රව්‍ය යෙදවුම් සපයා ඇති අතර, ඔවුන් SHEP වෙතින්ද අත්පත්‍රිකා ද අපේක්ෂා කරති. ඔවුන් SHEP වෙතින් මූල්‍යමය හෝ ද්‍රව්‍යමය සහාය නොලැබෙන බව තේරුම් ගිය විට පුහුණුවට එන එක නවත්වනවාද?

**පි**: ආරම්භයේදීම, ඉලක්කගත ගොවීන් විසින් ඔවුන්ට ලැබෙන්නේ තාක්ෂණික සහාය පමණක් මිස ද්‍රව්‍යමය ආධාර නොවේ යන්න අවබෝධ කර ගැනීම සහ එකඟ වීම අතිශයින් වැදගත් වේ. ඉලක්ක තෝරා ගැනීම සඳහා ඔබ විභව ගොවීන් සම්බන්ධ කර ගන්නා විට කිසිදු ද්‍රව්‍ය යෙදවුම් ලබා නොගෙන කුසලතා සංවර්ධන පුහුණු මාලාවකට සහභාගී වීමට කැමති ගොවීන් පමණක් SHEP සඳහා සුදුසු වන බව පැහැදිලිව විස්තර කරන්න.

**ප්‍ර: සංවේදීකරණ වැඩමුළුවේදී ස්ත්‍රී පුරුෂ භාවය ගැන කතා කරන්නේ ඇයි?** - සංවේදීකරණ වැඩමුළුවේදී අපි ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටළු සාකච්ඡා කළ යුත්තේ ඇයි? අපට එය පසුකාලීනව කළ හැකිද?

**පි**: SHEP හි ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ ගැටළු සම්බන්ධයෙන්, කරුණාකර “1.3. SHEP හි ස්ත්‍රී පුරුෂ භාවය 1 කොටස" පරිශීලනය කරන්න. ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ සැලකීම ස්වයංපෝෂිත ගොවිපල හරහා ජීවනෝපාය වැඩිදියුණු කර ගැනීමට; එහි ඉලක්කය සැබෑ කර ගැනීමට; SHEP හි අනිවාර්ය අංගයක් ලෙස දැකිය යුතු බව SHEP සලකයි. SHEP හි අරමුණ සාක්ෂාත් කර ගත හැක්කේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සමතුලිත සහභාගීත්වයක් තුලින් පමණි. එබැවින්, ඉලක්කගත ගොවීන් SHEP පුහුණුව ආරම්භයේදීම මෙම ගැටලුව පිළිබඳව දැනුවත් විය යුතුය, එනම් සංවේදීකරණ වැඩමුළුවේදී, පිරිමි සහ ගැහැණු ගොවීන් SHEP හි ඔවුන්ගේ නියැලීමේදී ක්‍රියාකාරී සහභාගීත්වය සහ ඒකාබද්ධ තීරණ ගැනීම සාක්ෂාත් කර ගැනීමට ඔවුන්ගේ කලත්‍රයන්ද එකඟ වන බැවිනි.

## 2. පියවර 2 - ගොවීන්ගේ දැනුවත් බව වැඩි කිරීම:

SHEP හි දෙවන පියවර වන්නේ ගොවීන්ට ඔවුන්ගේ වර්තමාන තත්ත්වයන් පිළිබඳව දැනුවත් වීමට මෙන්ම උද්‍යාන බෝග වගාවෙන් ඔවුන්ට ලබා දිය හැකි අවස්ථා සොයා ගැනීම සඳහා ඔවුන්ට හැකි තරම් අවස්ථා ලබා දීමයි. SHEP ගොවීන්ගේ දෑස් විවර කරන අත්දැකීම් හරහා ගොස් වෙළෙඳපොළ පාදක කරගත් කෘෂිකර්මාන්තයක් ක්‍රියාත්මක කිරීම සඳහා ස්ථිර ක්‍රියාමාර්ග ගැනීමට ඔවුන්ගේ අභිප්‍රේරණය තවදුරටත් ඉහළ නැංවීමේ පියවර මෙයයි. එබැවින්, මෙම පියවර අතිශයින්ම තීරණාත්මක වන අතර SHEP මූලික සමීක්ෂණ සහ වෙළඳපල සමීක්ෂණ වැනි අභ්‍යාස හරහා ව්‍යාපාරයක් ලෙස උද්‍යාන බෝග වගාව සඳහා ගොවීන්ට ඔවුන්ගේ ක්ෂිතිජය විවෘත කරවීමට ක්‍රියාත්මක කරන්නන් වග බලා ගත යුතුය.

### *2.1 සහභාගීත්ව මූලික සමීක්ෂණය*

| පියවර 4 | කටයුතු |
|---|---|
| **1. ගොවීන් සමඟ ඉලක්කය බෙදා ගැනීම.** | සංවේදීකරණ වැඩමුළුව |
| **2. ගොවීන් දැනුවත් කිරීම.** | **සහභාගීත්ව මූලික සමීක්ෂණය**<br>-පාර්ශවකරුවන්ගේ රැස්වීම/සංසදය (අනිවාර්ය නොවේ)<br>වෙළඳපල සමීක්ෂණය |
| **3. ගොවීන් තීරණ ගැනීම.** | ඉලක්කගත බෝග තේරීම<br>බෝග කැලැන්ඩර සෑදීම |
| **4. ගොවීන් කුසලතා ලබා ගැනීම.** | ක්ෂේත්‍රයේ පුහුණුවීම් |
| පසු විපරම් සහ අධීක්ෂණය (සහභාගී අවසාන සමීක්ෂණය ඇතුළුව) | |

අපි මෙතැන

**ඇයි? - අරමුණු**

සහභාගීත්ව මූලික සමීක්ෂණය ඉලක්කගත ගොවීන්ට ඔවුන්ගේ වර්තමාන ගොවිතැන් තත්වය, නිෂ්පාදනය, ආදායම් සහ ගොවිතැන් ශිල්පීය ක්‍රම අනුව විමසා වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර පැහැදිලිව හඳුනා බැලීමට අවස්ථාව ලබා දෙයි. වාර්තා තබා ගැනීමේ වැදගත්කම ගොවීන්ට ද වැටහේ. මෙම අවස්ථාව, සමීක්ෂණය ක්‍රියාත්මක කරන්නන්ට SHEP මැදිහත්වීමේ ප්‍රතිඵල නිරීක්ෂණයට පසුකාලීනව භාවිතා කිරීමට ඉලක්කගත ප්‍රතිලාභීන්ගේ ගොවිතැන් පිළිවෙත් පිළිබඳ අත්‍යවශ්‍ය දත්ත එකතු වීමට ඉඩ සලසයි.


## මොනවාද? - දළ සටහන

සහභාගීත්ව මූලික සමීක්ෂණය ඉලක්කගත ගොවීන්ගෙන් සමීක්ෂණ පත්‍රිකා වර්ග දෙකක් පුරවන ලෙස ඉල්ලා සිටී: (1) මූලික සමීක්ෂණය 1 කොටස- නිෂ්පාදනය, ආදායම සහ පිරිවැය සහ (2) මූලික සමීක්ෂණය 2 කොටස- කෘෂිකාර්මික ශිල්පීය ක්‍රම. මෙම සමීක්ෂණ පත්‍රිකා ව්‍යාප්ති කාර්ය මණ්ඩලයේ ආධාරයෙන් ගොවීන් විසින්ම පුරවයි. ක්‍රියාත්මක කරන්නන් විසින් දත්ත රැස්කර විශ්ලේෂණය කරනු ලැබේ. විශ්ලේෂණය කරන ලද දත්ත ලබා ගත් හැකි පසු දිනකදී මූලික සමීක්ෂණයේ ප්‍රතිඵල පිළිබඳ ප්‍රතිපෝෂණය ගොවීන්ට ලබා දෙනු ලැබේ.

## කෙසේද? - ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ඉඟි

- මෙම සමීක්ෂණය ක්‍රියාත්මක කරන්නන්ගේ ප්‍රයෝජනයට වඩා ගොවීන් සඳහා ප්‍රතිලාභ වැඩි විය යුතුයි (රූපය 6).
- සමීක්ෂණය පැවැත්විය යුත්තේ ව්‍යාප්ති කාර්ය මණ්ඩලය ඒකපාර්ශ්විකව ඔවුන්ගෙන් තොරතුරු රැස් කරනවාට වඩා ඉලක්කගත ගොවීන් සමීක්ෂණයේ ප්‍රධාන ක්‍රියාකරු වන පරිදි සහභාගීත්ව ක්‍රමය අනුවය.
- ව්‍යාප්ති කාර්ය මණ්ඩලය ගොවීන්ට ගොවිපල කළමනාකරණය සඳහා වැදගත් වන බෝග අස්වැන්න, වියදම, ලාභය වැනි මූලික අංග ගණනය කිරීමට උපකාර කරයි.





රූප සටහන 6 ගොවීන්ගේ ප්‍රයෝජනය සඳහා මූලික සමීක්ෂණය

## පියවර - ක්‍රියාත්මක කිරීමේ ක්‍රියා පටිපාටි (අවශ්‍ය කාලය: පැය 3-4)

1. (සූදානම් කිරීම) උද්‍යාන බෝග වෙළඳාම සඳහා භාවිතා කරන දේශීය ඒකක පිළිබඳ සොයා බලා පරිවර්තන වගුවක් සකස් කරන්න. උදා දේශීය ඒකක කිලෝග්‍රෑම් බවට පරිවර්තනය කරන වගුව.
2. රැස්වීමක් කැඳවාසහාය මූලික සමීක්ෂණයේ අරමුණ ගොවීන්ට පැහැදිලි කරන්න. සමීක්ෂණ ආකෘති වර්ග දෙක පුරවන ආකාරය ගොවීන්ට උපදෙස් දෙන්න. *ඉඟිය! විශේෂයෙන් ආකෘති පත්‍ර පුරවන්නේ කෙසේද යන්න තේරුම් ගැනීමේ දුෂ්කරතා සහිත සාක්ෂරතාව අඩු ගොවීන් සිටීනම්, ඔවුන්ට සහාය වීමට සාක්ෂරතාව ඇති ගොවීන්ගෙන් ඉල්ලා සිටින්න.*
3. අවශ්‍ය අවස්ථාවලදී ව්‍යාප්ති කාර්ය මණ්ඩලයෙන් උදව් ඇතිව ගොවීන් විසින්ම පෝරම පුරවයි.
4. කිලෝග්‍රෑම් බවට පත් කිරීම අපහසු මිටි, බෑග්, කූඩ වැනි වෙළඳ ඒකක පරිවර්තනය කරන්නේ නම්, ක්‍රියාත්මක කරන්නන් විසින් දේශීය වෙළෙඳපොළ තත්ත්වයන් මත පදනම්ව කලින් සාදන ලද පරිවර්තන වගුවක් සපයන්න
5. ගොවීන් පෝරම පුරවා අවසන් වූ පසු මෙම සමීක්ෂණ අභ්‍යාසය හරහා ලබා ගත් ඕනෑම නව සොයාගැනීමක් පිළිබඳ සාකච්ඡා කිරීමට ඔවුන්ව දිරිමත් කරන්න. සාකච්ඡාවට පහත කරුණු ඇතුළත් වන නමුත් ඒවාට සීමා නොවේ:



ඡායාරූපය: කෙන්යාව

- ✓ අපගේ වර්තමාන වාර්තා තබා ගැනීමේ ක්‍රම ප්‍රමාණවත්ද? අපගේ කෘෂිකාර්මික ව්‍යාපාරය කළමනාකරණය කිරීමේදී වාර්තා තබාගැනීම අපට උපකාර කරන්නේ කෙසේද?
- ✓ අපි අපට අවශ්‍ය තරම් ලාභ ලබනවාද? අපි සමහර බෝග සඳහා මුදල් ඉපයීම වෙනුවට මුදල් නැති කර ගන්නවාද?
- ✓ හොඳ අලෙවිකරණ අපේක්ෂාවන් ඇති බෝග සඳහා සුදුසු ප්‍රමාණයේ ඉඩමක් අපි වෙන් කරනවාද?
- ✓ අපි බෑගයක (හෝ කූඩයක්, මිටියක්, පෝච්චියක් ආදිය) කොපමණ නිෂ්පාදන ප්‍රමාණයක් අසුරනවා දැයි අපි නිවැරදිව දන්නවාද? අපගේ ගැනුම්කරුවන් නිශ්චිත බර දන්නවාද?
- ✓ අපට ප්‍රමාණවත් වගා කුසලතා තිබේද? අපගේ දුර්වලතා මොනවාද?

6. රැස්වීමෙන් පසු, පැතුරුම්පත්වල (spreadsheets) දත්ත ඇතුළත් කරන්න, සැකසීම, හා විශ්ලේෂණය කර සහ පසු දිනක ගොවීන්ට ප්‍රතිපෝෂණ ලබා දෙන්න. (කරුණාකර ඔබේ සංවිධානයේ දත්ත ඇතුළත් කිරීම, සැකසීම සහ විශ්ලේෂණය සඳහා වගකිව යුත්තේ කවුරුන්ද යන්න තහවුරු කරන්න) ප්‍රතිපෝෂණ සඳහා පහත කරුණු ඇතුළත් වන නමුත් ඒවාට සීමා නොවේ:

    - ✓ ගොවිපල කළමනාකරණය පිළිබඳ හොඳ විශ්ලේෂණයක් කිරීමට හොඳින් තබා ඇති ගොවීන්ගේ වාර්තා කෙතරම් ප්‍රමාණවත්ද.
    - ✓ කුමන බෝග බහුලව නිෂ්පාදනය කරන්නේද, කුමන බෝගවලින් හොඳ ලාභයක් ලැබේද, ආදිය.
    - ✓ ගොවීන් ශක්තිමත් කළ යුතු ගොවිතැන් ශිල්පීය ක්‍රම මොනවාද?




ඡායාරූපය: කෙන්යාව

## ආකෘතිය - මූලික සමීක්ෂණ ප්‍රශ්නාවලිය

මූලික සමීක්ෂණ ප්‍රශ්නාවලියේ සාම්පල පහත දැක්වේ. ආකෘති වර්ග දෙකක් ගොවීන් විසින් පිරවීම අවශ්‍ය වේ.

1.මූලික සමීක්ෂණය 1 කොටස- නිෂ්පාදනය, ආදායම සහ පිරිවැය

| 1.බෝග නම සහ ප්‍රභේදය | 2. බෝගය යටතේ ඇති ප්‍රදේශය මීටර් x මීටර් ($m^2$) හෝ හෙක්ටයාරයක $100m^2 = 0.01ha$ $1,000m^2 = 0.1ha$ $10,000m^2 = 1ha$ | | 3. නිෂ්පාදනය විවිධ ඒකකවලින් වෙළඳපොලේ විකුණනු ලැබේ (උදා. බෑග්, කූඩ, මිටි, බුසල්, ආදිය) | 4. වෙළඳ පොලේ අලෙවි කරන නිෂ්පාදනය kg වලින් (කිලෝග්‍රෑම් බවට පරිවර්තනය කර ඇත) | 5. වෙළඳපොලේ විකුණනු ලැබූ නිෂ්පාදනය හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් වලින් | 6. සාමාන්‍ය මිල (ඒකකයකට දේශීය මුදල්) | 7. දේශීය මුදලින් කිලෝග්‍රෑම් එකක සාමාන්‍ය මිල (කිලෝග්‍රෑම් බවට පරිවර්තනය කර) | 8. දේශීය මුදලින් මුළු ආදායම | 9. දේශීය මුදලින් මුළු නිෂ්පාදන පිරිවැය (යෙදවුම්, ප්‍රවාහනය, ශ්‍රමය ආදිය ඇතුළුව) | 10. ශුද්ධ ආදායම (ලාභය) දේශීය මුදලින් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 a. | 2 b. | 3 | 4 | 4/2 b | 6 | 6/ ඒකක පරිවර්තනය කොටුව තුළ | (3. x 6.) හෝ (4. x7.) | 9 | 8-9 |
| 1 වන බෝගය | M x M ($m^2$) | ha | (ඒකකය:) | kg | kg | (ඒකකය:) | | | | |
| 2 වන බෝගය | M x M ($m^2$) | ha | (ඒකකය:) | kg | kg | (ඒකකය:) | | | | |
| 3 වන බෝගය | M x M ($m^2$) | ha | (ඒකකය:) | kg | kg | (ඒකකය:) | | | | |
| 4 වන බෝගය | M x M ($m^2$) | ha | (ඒකකය:) | kg | kg | (ඒකකය:) | | | | |

කරුණාකර පහත කොටුවේ ඒකක පරිවර්තන සඳහන් කරන්න. (උදා.) අයර්ලන්ත අර්තාපල් මල්ලක් = 110 kg, ගෝවා ගෙඩි 1 = 2 kg

## 2.මූලික සමීක්ෂණය 2 කොටස- කෘෂිකාර්මික ශිල්පීය ක්‍රම

| වගාවට පෙර හා පසු අදියර | අයිතම | භාවිතය සඳහා යෝජනා කරන උද්‍යාන විද්‍යාත්මක ශිල්පීය ක්‍රම | ඔව් | නැත |
|---|---|---|---|---|
| 1පූර්ව වගා සැකසීම | ප්‍ර. 1 | ඔබ එක් එක් කන්නයේ වගා කිරීමට අවශ්‍ය බෝග නිර්ණය කිරීම සඳහා වෙළඳපල සමීක්ෂණයක් සිදු කරන්නේද? | | |
| | ප්‍ර.2 | ඔබ වෙළඳපල සමීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව බෝග කැලැන්ඩර(ය) සකස් කර භාවිතා කරන්නේද? | | |
| | ප්‍ර. 3 | ඔබ එළවළු/වාර්ෂික මල් සඳහා අවම වශයෙන් වසර දෙකකට වරක්වත් හෝ පලතුරු ගස්/බහු වාර්ෂික මල් සිටුවීමට පෙරද පාංශු පරීක්ෂණයක් සිදු කරන්නේද? | | |
| | ප්‍ර. 4 | ඔබ කොම්පෝස්ට්/ පොහොර සකස් කිරීමේදී ප්‍රධාන පෝෂක: නයිට්‍රජන් (N), පොස්පරස් (P), සහ පොටෑසියම් (K) සපයන්නට විවිධ කාබනික ද්‍රව්‍ය භාවිතා කරමින් නිර්දේශිත කොම්පෝස්ට් ක්‍රම භාවිතා කරනවාද? | | |
| | ප්‍ර. 5 | ඔබ පහත සඳහන් ලක්ෂණ එකක් හෝ කිහිපයක් සහිත නිර්දේශිත ගුණාත්මක රෝපණ ද්‍රව්‍යය(න්) භාවිතා කරන්නේද: රෝග ප්‍රතිරෝධීතාවය, ඉහළ අස්වැන්නක්, මුල් පරිණතභාවය, වඩා හොඳ රස, ප්‍රමාණය සහ දිගු ආයු කාලය? | | |
| 2 බිම් සකස් කිරීම | ප්‍ර. 6 | රෝග සහ පළිබෝධ කළමනාකරණය කිරීමට පහත සඳහන් නිර්දේශිත බිම් සැකසීමේ පිළිවෙත් එකක් හෝ කිහිපයක් ඔබ භාවිතා කරන්නේද: සූර්යාලෝකය මගින් ජීවානුහරණය, කාලෝචිත සීසෑම, සුදුසු ගැඹුරට සීසෑම සහ පාංශු රෝග සහ පලිබෝධ පැතිරීම අවම කිරීම සඳහා පස සංචලනය අඩු කිරීම | | |
| | ප්‍ර. 7 | පෝෂක ප්‍රතිචක්‍රීකරණය වැඩි දියුණු කිරීම සඳහා ගොවිපලට බෝග සිටුවීමට අවම වශයෙන් මාස දෙකකට පෙර සීසෑමේදී ඔබ බෝග අවශේෂ පසට කළවම් කරනවාද? | | |
| | ප්‍ර. 8 | බෝග සිටුවීමට අවම වශයෙන් සති 1-2 කට පෙර ඔබ කොම්පෝස්ට්/පොහොර හෝ කාබනික පොහොර මූලික පොහොරක් ලෙස පසට ඇතුළත් කරනවාද? | | |
| 3<br>බෝග සංස්ථාපනය (බීජ සිටුවීම / පැල සිටුවීම) | ප්‍ර. 9 | ඔබ එළවලු/වාර්ෂික මල් සඳහා බීජ පැල සිටුවීමේදී නිර්දේශිත ක්‍රම භාවිතා කරනවාද නැතහොත් පිළිගත් තවාන් වලින් නිපදවන ලද පළතුරු ගස්/බහු වාර්ෂික මල් සඳහා බීජ පැල භාවිතා කරනවාද? | | |
| | ප්‍ර. 10 | ඔබ නිර්දේශිත පැල සිටුවීමේ පරතරය භාවිතා කරන්නේද? | | |
| | ප්‍ර. 11 | ඔබ නියමිත පොහොර නිර්දේශ භාවිතා කරමින් බෝග සංස්ථාපනය කරනවාද? | | |
| 4 බෝග කළමනාකරණය | ප්‍ර. 12 | ඔබ පහත සඳහන් වාරිමාර්ග කම එකක් හෝ කිහිපයක් හෝ හරහා බෝග ජල අවශ්‍යතාවය ලබාදීම කරනවාද: ජලය දැමීමේ කෑන්, උස් ස්ථානයක පිහිටවූ ටැංකියකින්, බිංදු සහ මතුපිට ජල සම්පාදනය මගින් යනාදී | | |
| | ප්‍ර. 13 | වල් පැලෑටි කළමනාකරණයේදී නියමිත වේලාවට වල් නෙලීම සහ සුදුසු වල් නෙලීමේ මෙවලම් භාවිතා කිරීම ගැන ඔබ සහතික වෙනවාද? | | |
| | ප්‍ර. 14 | ඔබ සුදුසු මතුපිට පොහොර යෙදීමේ පිළිවෙත් අනුගමනය කරන්නේද: කාලෝචිත බව, වර්ගය සහ නිර්දේශිත අනුපාතය සහ පොහොර යෙදීමේ ක්‍රමය? | | |
| | ප්‍ර. 15 | ඔබ අවම වශයෙන් පහත සඳහන් ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණ (IPM) භාවිතයන් දෙකක් හෝ භාවිතා කරන්නේද: සම්ප්‍රදායික, ජීව විද්‍යාත්මක, භෞතික සහ රසායනික? | | |
| | ප්‍ර. 16 | පහත සඳහන් ආරක්ෂිත සහ ඵලදායී පළිබෝධනාශක භාවිතය ඔබ නිරීක්ෂණය කරනවාද: සුදුසු මාත්‍රා, නිර්දේශිත පළිබෝධනාශක සහ පෙර අස්වනු කාලය (PHI)? | | |
| 5 අස්වැන්න නෙලීම | ප්‍ර. 17 | ඔබ අවම වශයෙන් පහත සඳහන් අස්වනු නෙලීමේ දර්ශක වලින් එකක්වත් භාවිතා කරන්නේද: වර්ණය, ප්‍රමාණය, හැඩය සහ තද බව? | | |

| | | | | |
|---|---|---|---|---|
| 6 පසු අස්වනු තාක්ෂණය | ප්‍ර. 18 | ඔබ පහත ලක්ෂණ සහිත අස්වැන්න නෙළීමේ /ගබඩා කිරීමේ/ප්‍රවාහනය කිරීමේ බහාලුම්/සම්මත ඇසුරුම් ද්‍රව්‍ය භාවිතා කරන්නේද?<br>: හොඳින් වාතාශ්‍රය ඇති, පිරිසිදු කිරීමට පහසු සහ හානි අවම වන පරිදි සිනිදු වීම වැනි? | | |
| | ප්‍ර. 19 | ඔබ පහත සඳහන් නිර්දේශිත අගය එකතු කිරීමේ ක්‍රමවලින් එකක් හෝ භාවිතා කරන්නේද: නිෂ්පාදන පිරිසිදු කිරීම, වර්ග කිරීම, ශ්‍රේණිගත කිරීම, ඇසුරුම් කිරීම හෝ සැකසීම වැනි? | | |
| 7 පිරිවැය සහ ආදායම විශ්ලේෂණය | ප්‍ර. 20 | ඔබ නිෂ්පාදන හා විකුණුම් පිරිවැය පිළිබඳ වාර්තා තබාගෙන පිරිවැය සහ ආදායම් විශ්ලේෂණය සිදු කරන්නේද? | | |
| 8 සාමූහික ක්‍රියාව | ප්‍ර. 21 | ඔබ කණ්ඩායමක් ලෙස බීජ, පොහොර සහ රසායනික ද්‍රව්‍ය වැනි කෘෂිකාර්මික යෙදවුම් මිලදී ගන්නවාද? (කණ්ඩායම් මිලදී ගැනීම) | | |
| | ප්‍ර. 22 | ඔබ නිෂ්පාදන සාමූහිකව ප්‍රවාහනය කිරීම හෝ ඔබේ නිෂ්පාදන සාමූහිකව විකුණනවාද? (කණ්ඩායම් විකිණීම) | | |
| | ප්‍ර. 23 | කණ්ඩායමක් ලෙස සාමාජිකයින් සමඟ සාමූහිකව, ඔබ ඉලක්කගත බෝග තෝරාගෙන නිෂ්පාදන/අලෙවිකරණ උපාය මාර්ග සැලසුම් කරනවාද? | | |

## නවෝත්පාදනය - විවිධ රටවල්/ කලාපවල අභිරුචිකරණය

මූලික සමීක්ෂණයන් සමහර රට වල හා ප්‍රදේශවල නිසියාකාරව සිදු කිරීම සඳහා එම රටට හා ප්‍රදේශයට ගැලපෙන සේ කරන ලද වෙනස්කම් වලට උදාහරණ පහත දැක් වේ.

**කොටුව 1 මූලික සමීක්ෂණය සඳහා දෘෂ්‍ය ඒකක පරිවර්තන වගුව**

### බර පරිවර්තනය පහසු කිරීම සඳහා දෘශ්‍ය ඒකක පරිවර්තන වගුවක් සංවර්ධනය කිරීම (මලාවි)



<ඇයි?> ගොවීන් සහ ගැනුම්කරුවන් සම්ප්‍රදායිකවබෑග්, පෝච්චි, මිටි වැනි විවිධ ඒකක භාවිතා කළේය දේශීය වෙළඳපොලවල වෙළඳාම් කළ යුතු විශේෂිත භෝග සඳහා. එක් එක් ඒකකයේ බර කොපමණදැයි ගොවීන් දැන සිටියේ නැත.

<කෙසේද?> ක්‍රියාත්මක කරන්නන් පරිමාණයක් සහ කැමරාවක් සමඟ දේශීය වෙළඳපොළට ගියහ. ඔවුන් පින්තූර ගත් අතර පොදුවේ වෙළඳාම් කරන එළවළු සහ පලතුරු කිරා මැන බැලූවා. දෘශ්‍ය ඒකක පරිවර්තන වගුව සංවර්ධනය කරන ලද අතර විවිධ ඒකක කිලෝග්‍රෑම් බවට පරිවර්තනය කිරීම සඳහා භාවිතා කරන ලදී.

<ප්‍රතිඵල?> දේශීයව වෙළඳාම් කරන ඒකක කිලෝග්‍රෑම් බවට පරිවර්තනය කිරීම පහසු වූ අතර බර වෙළඳාමේ වැදගත්කම පිළිබඳව ගොවීන් දැනුවත් කිරීම වැඩි විය.


## කොටුව 2 පිරිවැය ගණනය කිරීම සඳහා වූ පත්‍රය

### පිරිවැය ගණනය කිරීම සඳහා අතිරේක වැඩ පත්‍රිකාවක් සංවර්ධනය කිරීම (මලාවි)

<ඇයි> මූලික සමීක්ෂණ පෝරමයේ මුලු වියදම ගනනය කිරීම සඳහා කෘෂිකාර්මික යෙදවුම් වල හා ශ්‍රමයේ සියලු වියදම් එකතු කිරීම ගොවීන්ට දුෂ්කර වීම

<කෙසේද?> ක්‍රියාත්මක කරන්නන් විසින් සම්පූර්ණ පිරිවැය ගණනය කිරීම සඳහා අමතර වැඩ පත්‍රිකාවක් සකස් කරන ලදී. වැඩ පත්‍රිකාවට සාමාන්‍ය අයිතම ඇතුළත් විය විවිධ පොහොර, බීජවල පිරිවැය වැනි ප්‍රදේශය, පළිබෝධනාශක, වල් නාශක, ශ්‍රම පිරිවැය, ප්‍රවාහනය ගොවීන්ට පහසුවෙන් පිරවිය හැකි වන පරිදි පිරිවැය යනාදිය සම්පූර්ණ පිරිවැය සාරාංශ කිරීමට අවශ්‍ය සියලු තොරතුරු.

<ප්‍රතිඵල?> ගොවීන් ව්‍යාකූලත්වයට පත් නොවී හෝ යටපත් නොවී සම්පූර්ණ පිරිවැය තරමක් නිවැරදිව ගණනය කිරීමට සමත් විය.



96

## කොටුව 3 සාක්ෂරතාවය නැති ගොවීන්ට උපකාර කරන සාක්ෂරතාවය ඇති ගොවීන් (ඉතියෝපියාව)

ඇයි ?
කණ්ඩායම් සහ තනි ගොවිබිම් සඳහා මූලික සමීක්ෂණ පැවැත්වීම (රුවන්ඩාව සහ එල් සැල්වදෝරය) ඉලක්කගත ගොවි කණ්ඩායම්වල සාක්ෂරතා අනුපාතය අඩු විය. ඉලක්කගත ගොවීන් බොහෝ දෙනෙකුට සමීක්ෂණ පෝරම පිරවීමේදී දුෂ්කරතා ඇති වනු ඇතැයි අපේක්ෂා කරන ලදී.

කෙසේද ?
නියමු ව්‍යාපෘතියක සහභාගීත්ව මූලික සමීක්ෂණය පවත්වන ආකාරය ඉගෙන ගැනීම සඳහා ක්‍රියාත්මක කරන්නන් විසින් ව්‍යාප්ති කාර්ය මණ්ඩලය සමඟ එක් එක් කණ්ඩායමෙන් සාක්ෂරතාව සහිත සාපේක්ෂ වශයෙන් හොඳින් උගත් ගොවීන් දස දෙනෙකුගෙන් පුහුණුවට සහභාගි වන ලෙස ඉල්ලා සිටියහ. එම සාක්ෂරතාව ඇති ගොවීන් ව්‍යාප්ති කාර්ය මණ්ඩලය සමඟ එක්ව නූගත් ගොවීන්ට ආකෘති පත්‍ර පිරවීමට උපකාර කළහ.



Photo: Ethiopia

ප්‍රතිපලය :
සාක්ෂරතාව ඇති ගොවීන්ගේ උපකාරය නිසා නූගත් ගොවීන්ට ඉතා පහසුවෙන් සමීක්ෂණය නිම කිරීමට හැකි විය. ගොවීන්ගේ එකමුතුකම පිළිබඳ හැඟීම ද ශක්තිමත් වූ අතර, එය ගොවීන්ගේ සම්බන්ධකම් සඳහා වූ හොඳ මානසික වටපිටාවක් ඇති කිරීමට දායක විය

## කොටුව 4 : කණ්ඩායම් සහ තනි ගොවිබිම් සඳහා මූලික සමීක්ෂණය

ගෙවතු

ඇයි ?

සමහර ඉලක්කගත ගොවි කණ්ඩායම්වලට එළවළු උද්‍යාන වර්ග දෙකක් තිබුණි; එකක් සමූහයට අයත් වන අතර අනෙක කණ්ඩායමේ තනි සාමාජිකයින්ට අයත් වේ. ක්‍රියාත්මක කරන්නන්ට ගොවි බිම් වර්ග දෙකෙහිම තත්ත්වයන් ග්‍රහණය කර ගැනීමට අවශ්‍ය විය.

කෙසේද ?

මූලික සමීක්ෂණ ආකෘති පත්‍ර මූලික වශයෙන් තනි තනි ගෘහයන් විසින් කළමනාකරණය කරනු ලබන උද්‍යාන සඳහා නිර්මාණය කර ඇති බැවින්, ක්‍රියාත්මක කරන්නන් විසින් අවශ්‍ය අවස්ථාවලදී සමහර ප්‍රශ්න වෙනස් කර, කණ්ඩායම් උද්‍යාන මෙන්ම තනි සාමාජිකයින්ගේ උද්‍යාන සඳහා සමීක්ෂණය සිදු කරන ලදී.

ප්‍රතිපලය:

ගොවීන් සහ ක්‍රියාත්මක කරන්නන් යන දෙපිරිසටම කණ්ඩායම් උද්‍යානවල සහ පුද්ගල උද්‍යානවල වත්මන් තත්ත්වයන් අවබෝධ කර ගැනීමට හැකි විය. ගොවිබිම් දෙකෙහිම වැඩිදියුණු කිරීම සිදු කිරීමට ගොවීන් පෙලඹී ඇත



රුවැන්ඩාවේ වත්තක සිටින ගොවීන් කණ්ඩායමක්

97

## කොටුව 5 : මූලික සමීක්ෂණය අතරතුර "නිවසේ පැවරුම්" පද්ධතිය

**වඩා හොඳ දත්ත රැස් කිරීමක් සහ ශක්තිමත් කලත්‍රයන්ගේ බැඳීමක් සඳහා "නිවසේ පැවරුම්" පද්ධතිය හඳුන්වාදීම (මලාවි සහ නේපාලය)**

ඇයි ?

මූලික සමීක්ෂණයේදී බොහෝ ගොවීන් සතුව නිෂ්පාදන පිරිවැය සහ විකුණුම් ප්‍රමාණය වැනි සංඛ්‍යා නොමැති බව සමීක්ෂකයන් සොයා ගත්හ. ඔවුන්ගේ වාර්තාව පරීක්ෂා කිරීමට හෝ නිවැරදි සංඛ්‍යා ලබා ගැනීමට තම පවුලේ සාමාජිකයන්ගෙන් ඉල්ලා සිටීමට ඔවුන්ට නිවසට යාමට අවශ්‍ය විය. දිනක රැස්වීමකදී එම ස්ථානයේදීම මූලික සමීක්ෂණය අවසන් කිරීම අපහසු විය.

කෙසේද ?



ඡායාරූපය මලාවි

ක්‍රියාත්මක කරන්නා මූලික සමීක්ෂණය සඳහා දින දෙකක සැසි සංවිධානය කළේය. පළමු දිනයේදී, ඔවුන් අවශ්‍ය දත්ත මොනවාදැයි පැහැදිලි කළ අතර නිවසේ සිට නිවැරදි දත්ත ලබා ගැනීමට ඔවුන්ට "නිවසේ පැවරුම" ලබා දුන්නේය. නේපාලය සම්බන්ධයෙන් ගත් කල, ක්‍රියාත්මක කරන්නන් ගොවීන්ගෙන් ඉල්ලා සිටියේ "නිවසේ පැවරුමක්" ලෙස, නිවසේදී පෝරමය පිරවීම සඳහා ඔවුන්ගේ කලත්‍රයන් සමඟ වැඩ කරන ලෙසයි. ගොවීන් දෙවන දිනයේදී නැවතත් රැස්වී සමීක්ෂන පෝරම ඉදිරිපත් කළහ.

ප්‍රතිපලය:

වඩාත් නිවැරදි හා විශ්වාසදායක දත්ත එකතු කරන ලදී. ස්වාමිපුරුෂයා සහ භාර්යාවන් තම ගොවිතැන් ව්‍යාපාරයේ වත්මන් තත්ත්වය අවබෝධ කර ගැනීමට එකට වැඩ කළ අතර, එමගින් ගොවිපල කළමනාකරණ ඒකකයක් ලෙස ඔවුන්ගේ එකමුතුකම සහ ඒකාබද්ධ වගකීම පිළිබඳ හැඟීම වැඩි විය.

**පිරික්සුම් ලැයිස්තුව** - **මෙම ක්‍රියාකාරකමෙන් පසු තහවුරු කළ යුතු කරුණු**

- ඉලක්කගත ගොවීන් ඔවුන්ගේ වර්තමාන නිෂ්පාදන සහ විකුණුම් තත්ත්වය තේරුම් ගෙන පිරවීමට අවශ්‍ය හිඩැස් හඳුනා ගෙන ඇති බව.
- ඉලක්කගත ගොවීන් නිෂ්පාදනය සහ අලෙවිකරණය සම්බන්ධයෙන් ඔවුන්ගේ වර්තමාන තාක්ෂණික මට්ටම් අවබෝධ කර ගෙන පිරවීමට අවශ්‍ය හිඩැස් හඳුනා ගෙන ඇති බව.
- ඉලක්කගත ගොවීන් පොත් තැබීම සහ ගොවිපල ක්‍රියාකාරකම් වාර්තා යන දෙඅංශයෙන්ම ගොවිපල වාර්තා තබා ගැනීමේ වැදගත්කම අවබෝධ කරගෙන වාර්තා තබා ගැනීම ආරම්භ කිරීමට කැමැත්තෙන් සිටින බව.
- සහභාගිවන්නන්ගේ පිරිමි සහ ගැහැණු අනුපාතය සමතුලිත බව.
- ස්ත්‍රී පුරුෂ භාවයේ වෙනසට අදාලව දත්ත රැස් කර විශ්ලේෂණය කෙරෙන බව.
- සාමාජිකයින්ගේ කලත්‍රයන් සම්බන්ධවන බව (අනිවාර්ය නොවේ).

**දෝෂ නිරාකරණය** - **නිතර ඇතිවන ගැටළු සඳහා විසඳුම්:**

ප්‍ර :**වාර්තා තබා ගැනීම පුළුල් ලෙස සිදු නොකෙරේ** සුළු පරිමාණ ගොවීන් විසින් වාර්තා තබා ගැනීම බහුලව සිදු නොවේ. ඔවුන්ට වාර්තා තබා ගැනීම ඉගෙන ගෙන එයින් ප්‍රයෝජන ගත හැකිද?

පි සුළු පරිමාණ ගොවීන්ගෙන් බොහෝ දෙනෙක් වාර්තා තබා ගැනීම නොකරයි. ඔවුන්ට උපදෙස් දෙනු ලබන පළමු පියවර වන්නේ මූලික සමීක්ෂණයට සහභාගී වීමේ ඔවුන්ගේ අත්දැකීම් තුළින් වාර්තා තබා ගැනීමේ වැදගත්කම අවබෝධ කර ගැනීමයි. නිෂ්පාදන අලෙවිය සහ බීජ, පොහොර සහ පළිබෝධනාශකවල වියදම් යනාදී මූලික තොරතුරු තනි ප්‍රවේශ පොත් තැබීම වැනි ඉතා සරල ආකෘතියකින් ලියා තැබීමට උපදෙස් දෙනු ලැබේ. ගොවිපල ක්‍රියාකාරකම් සහ ගිණුම් වාර්තා තබා ගැනීම ගොවීන්ට ප්‍රයෝජනවත් වේ.

ප්‍ර: **සාක්ෂරතාවය නැති ගොවීන්ට එය කළ හැකිද?** - සාක්ෂරතාව ඇති ගොවීන්ට පවා මූලික සමීක්ෂණයට අවශ්‍ය සංඛ්‍යා ගණනය කිරීමට අපහසු වේ. සාක්ෂරතාවය නැති ගොවීන්ට සමීක්ෂණයේ කාර්යයන් සම්පූර්ණ කළ හැකිද?

පි: සාක්ෂරතාවය නැති ගොවීන්ට ඔවුන්ගේ සාක්ෂරතාවයෙන් යුත් සගයන්ට වඩා සමීක්ෂණ පෝරම පිරවීම දුෂ්කර විය හැකිය. කෙසේ වෙතත්, සාක්ෂරතාවයෙන් යුත් ගොවීන්ට වඩා ඔවුන්ගේ ගොවිපල කළමනාකරණ ගැටළු පිළිබඳව ඔවුන් අඩු දැනුමක් ඇති බව අදහස් නොකරයි. ඔවුන්ගේ දැනුම සටහන් කිරීමට තරම් සාක්ෂරතා කුසලතාවයක් ඔවුන්ට නැත. කණ්ඩායමේ සාක්ෂරතාව සහිත සාමාජිකයින්ගෙන් , ඔවුන්ගේ කලත්‍රයා හෝ දරුවන් වැනි සාක්ෂරතාවයෙන් යුත් පවුලේ සාමාජිකයින්ගෙන් පෝරම පිරවීමට උපකාර ලබා ගන්න. සාක්ෂරතාවය නැති ගොවීන්ට තම පවුලේ සාමාජිකයින්ගේ සහාය ඇතිව දිනපතා වාර්තා තබා ගත හැකිය.

ප්‍ර: **දත්ත එතරම් විශ්වාසදායක නොවේ** - ගොවීන් තොරතුරු පිරවීමට උපරිම උත්සාහයක් ගත්තද, සමහර තොරතුරු තවමත් අස්ථානගත වී හෝ ඇත්ත වශයෙන්ම නිවැරදි නොවන බව මට පෙනේ. දත්තවල විශ්වසනීයත්වය සහ නිරවද්‍යතාවය මා බලාපොරොත්තු වූ තරම් ඉහළ මට්ටමක නොමැති බැවින් ඔවුන්ගෙන් තොරතුරු ලබාගැනීම සම්පූර්ණයෙන්ම අත්හැරිය යුතුද?

පි: SHEP හි සහභාගීත්ව මූලික සමීක්ෂණයට අරමුණු දෙකක් ඇත: (1) ඔවුන්ගේ වර්තමාන ගොවිතැන් තත්ත්වය පිළිබඳව ගොවීන් දැනුවත් කිරීම සහ (2) ගොවීන්ගෙන් මූලික දත්ත රැස් කිරීම. ප්‍රථමයෙන් සහ ප්‍රධාන වශයෙන්, සමීක්ෂණ අභ්‍යාසය තුළින් දැනුවත් කිරීම, පළමු අරමුණ සාක්ෂාත් කර ගැනීම ඉතා වැදගත් වෙයි. අනෙක් අතට, දත්තවල විශ්වසනීයත්වය සහ නිරවද්‍යතාවය සහතික කිරීම, දත්ත රැස් කිරීමේදී සැමවිටම අභියෝගයකි. විශේෂයෙන්ම මූලික සමීක්ෂණය අතරතුර, බොහෝ ගොවීන් තවමත් නිවැරදි වාර්තා තබා ගැනීමට නොහැකි බැවින් ඉතා ඉහළ නිරවද්‍යතාවයක් ලබා ගැනීමට අපහසු වේ. අපි ඉවසිලිවන්තව සිටිය යුතු අතර, දත්තවල විශ්වසනීයත්වය සහ නිරවද්‍යතාවය අවසාන සමීක්ෂණය වන විට ඉහළ නැංවෙන පරිදි වාර්තා තබා ගැනීම ක්‍රමයෙන් ආරම්භ කිරීමට ගොවීන් දිරිමත් කළ යුතුය.

ප්‍ර: **ගොවීන් දත්ත ඉදිරිපත් කිරීමට ඕනෑකමක් නොමැති වීම** - ගොවීන් දත්ත පිරවීමට කැමැත්තෙන් සිටිති. කෙසේ වෙතත්, ඔවුන්ගේ ලාභයට අදාළ දත්ත හෙළි කිරීමට ඔවුන් කැමති නැත. මම කළ යුත්තේ කුමක් ද?

පි: ගොවීන්ට අපහසුතාවයක් දැනෙනවා නම් ඒ දත්ත ඉදිරිපත් කිරීමට බල කිරීම සුදුසු ක්‍රියාමාර්ගයක් නොවෙයි. දත්ත ඉදිරිපත් කිරීමකින් තොරව, ගොවිපල කළමනාකරණය පිළිබඳව ගොවීන් දැනුවත් කිරීමට තවමත් අවස්ථාව ලබා දී ඇත. එබැවින් ඉහත පැහැදිලි කර ඇති මූලික සමීක්ෂණයේ අරමුණු දෙකෙන් එකක් අවම වශයෙන් ඉටු වේ. වෙනත් ගොවීන්ගෙන් ඔවුන් දත්ත ඉදිරිපත් කිරීමට කැමති දැයි විමසන්න එවිට ඔබට සැකසීමට සහ විශ්ලේෂණය කිරීමට හැකි දෘඪ දත්ත (hard data) ලබා ගත හැක.

# මූලික සමීක්ෂණය 1 කොටස නිෂ්පාදනය ආදායම සහ වියදම (Baseline Survey -Part 1)

**ආදර්ශ පෝරමය**

දිනය:______/______/________

දිස්ත්‍රික්කයේ නම:__________________________________ ග්‍රාම සේවා කොට්ඨාශයේ නම:__________________________________

ගොවි කංඩායමේ නම:______________________________________________

ගොවියාගේ නම:____________________________ ස්ත්‍රී/පුරුෂ:______ දුරකතන අංකය.:_________________________

කරුණාකර පසු ගිය වගා කන්නයේ උද්‍යාන වගා බෝග ගැන තොරතුරු දක්වන්න (බඩ ඉරිඟු උක් වැනි අනෙකුත් බෝග ඇතුලත් නොකරන්න).

| 1.බෝගයේ නම හා ප්‍රභේදය | 2.වගා වපසරිය (මීටර්xමීටර් හා හෙක්. ) 100 ව. මී. =0.01හෙක්. 1,000 ව. මී. =0.1හෙක්. 10,000 ව. මී.=1හෙක්. | | 3. වෙලදපොලට විකුණු නිෂ්පාදනය ( ප්‍රාදේශිය ඒකක) (උදා. මලු, කූඩ, මිටි, බුසල්, ආදී.) | 4.වෙලදපොලට විකුණු නිෂ්පාදනය (කි. ග්.) ( කි. ග්. පරිවර්ථනය ) | 5. වෙලදපොලට විකුණු නිෂ්පාදනය (හෙක්ටයාර් එකකට කි. ග්. | 6.සාමාන්‍ය මිල (ප්‍රාදේශීය ඒකකයකට රුපියල්) | 7. සාමාන්‍ය මිල (කි. ග්. එකකට රුපියල්) | 8.මුලු ආදායම (රුපියල්) | 9. මුලු නිෂ්පාදන වියදම (රුපියල්) | 10. ශුද්ධ ආදායම (ලාභය) (රුපියල්) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 a. | 2 b. | 3 | 4 | 4./2 b. | 6. | 6. /ඒකක පරිවර්ථන වගුව | (3. x 6.)හෝ (4. x7.) | 9 | 8.-9. |
| 1 බෝගය: | මී. x මී.(ව. මී.) | හෙක්. | (ඒකක ) | කි ග් | කි ග් | (ඒකක ) | | | | |
| 2 බෝගය: | මී. x මී.(ව. මී.) | හෙක්. | (ඒකක ) | කි ග් | කි ග් | (ඒකක ) | | | | |
| 3 බෝගය | මී. x මී.(ව. මී.) | හෙක්. | (ඒකක ) | කි ග් | කි ග් | (ඒකක ) | | | | |
| 4 බෝගය | මී. x මී.(ව. මී.) | හෙක්. | (ඒකක ) | කි ග් | කි ග් | (ඒකක ) | | | | |

කරුණාකර පහත කොටුවේ ඒකක පරිවර්ථනය දක්වන්න. (උදා:-1 අර්ථාපල් මල්ලක් = 110 කි. ග්., 1 ගෝවා ගෙඩියක් = 2 කි. ග්.)

| |
|---|
| |

# මූලික සමීක්ෂණය 1 කොටස නිෂ්පාදනය ආදායම සහ වියදම (Baseline Survey -Part 1)

උදාහරණය

දිනය:______/______/________

දිස්ත්‍රික්කයේ නම:________________________________ ග්‍රාම සේවා කොට්ඨාශයේ නම:________________________________

ගොවි කංඩායමේ නම:____________________________________________

ගොවියාගේ නම:__________________________ ස්ත්‍රී/පුරුෂ:______ දුරකතන අංකය.:_______________________

කරුණාකර පසු ගිය වගා කන්නයේ උද්‍යාන වගා බෝග ගැන තොරතුරු දක්වන්න (බඩ ඉරිගු උක් වැනි අනෙකුත් බෝග ඇතුලත් නොකරන්න).

| 1.බෝගයේ නම හා ප්‍රභේදය | 2.වගා වපසරිය (මීටර්xමීටර් හා හෙක්.) 100 ව. මී. =0.01හෙක්. 1,000 ව. මී. =0.1හෙක්. 10,000 ව. මී.=1හෙක්. | | 3. වෙලඳපොලට විකුණු නිෂ්පාදනය (ප්‍රාදේශීය ඒකක) (උදා. මලු, කූඩ, මිටි, බුසල්, ආදී.) | 4.වෙලඳපොලට විකුණු නිෂ්පාදනය (කි. ග්.) (කි. ග්. පරිවර්ථනය) | 5. වෙලඳපොලට විකුණු නිෂ්පාදනය (හෙක්ටයාර් ඒකකට කි. ග්. | 6.සාමාන්‍ය මිල (ප්‍රාදේශීය ඒකකයකට රුපියල්) | 7. සාමාන්‍ය මිල (කි. ග්. ඒකකට රුපියල්) | 8.මුලු ආදායම (රුපියල්) | 9. මුලු නිෂ්පාදන වියදම (රුපියල්) | 10. ශුද්ධ ආදායම (ලාභය) (රුපියල්) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 a. | 2 b. | 3 | 4 | 4./2 b. | 6. | 6. /ඒකක පරිවර්ථන වගුව | (3. x 6.)හෝ (4. x7.) | 9 | 8.-9. |
| 1 බෝගය: තක්කාලි KWR | මී. x මී.(ව. මී.) 20 x100 | හෙක්. 0.2 | (ඒකක ) පෙට්ටි 100 | කි ග් 2000 | කි ග් 10000 | (ඒකක ) 6000 | 3000 | 300000 | 210000 | 90000 |
| 2 බෝගය: | මී. x මී.(ව. මී.) | හෙක්. | (ඒකක ) | කි ග් | කි ග් | (ඒකක ) | | | | |
| 3 බෝගය | මී. x මී.(ව. මී.) | හෙක්. | (ඒකක ) | කි ග් | කි ග් | (ඒකක ) | | | | |
| 4 බෝගය | මී. x මී.(ව. මී.) | හෙක්. | (ඒකක ) | කි ග් | කි ග් | (ඒකක ) | | | | |

කරුණාකර පහත කොටුවේ ඒකක පරිවර්ථනය දක්වන්න. (උදා:-1 අර්ථාපල් මල්ලක් = 110 කි. ග්., 1 ගෝවා ගෙඩියක් = 2 කි. ග්.)

තක්කාලි පෙට්ටි 01= 20 කි. ග්.

# මූලික සමීක්ෂණය 2 කොටස -කෘෂිකර්ම තාක්ෂණයන්
(**Baseline Survey Part 2**)

දිනය:___/___/

දිස්ත්‍රික්කයේ නම:__________________ග්‍රාම සේවා කො: යේ නම:

ගොවි කණ්ඩායමේ නම:

ගොවියාගේ නම:_____________ ස්ත්‍රී/පුරුෂ:___ දුරකතන අංකය.:

* කරුණකර පහත ප්‍රශ්ණ වලට "ඔව්" හෝ "නැත" තෝරා හරි ලකුණ යොදන්න කරන්න. යම් අමතර තොරතුරක් වේ නම් මායිමේ ලියන්න.

| පූර්ව /පශ්චාත් වගා අවස්ථා | | අයිතමය | නිර්දේශිත උද්‍යාන වගා තාක්ෂණයන් | ඔව් | නැත |
|---|---|---|---|---|---|
| **1** | වගා කිරීමට පෙර සූදානම් වීම | Q 1 | සෑම කන්නයක දීම වගා කරන බෝග තීරණය කිරීමට වෙලදපොල සමීක්ෂණයක් සිදු කරනවා ද? | | |
| | | Q 2 | වෙලදපොල සමීක්ෂණයේ ප්‍රථිපල මත ඔබ බෝග කැලැන්ඩරයක් පිලියෙල කොට භාවිතයට ගන්නවා ද? | | |
| | | Q 3 | ඔබ එළවලු වගා කිරීමේ දී අඩුම වශයෙන් වසර දෙකකට වරක්වත් පස් පරීක්ෂා කරනවා ද? | | |
| | | Q 4 | ඔබ නයිට්‍රජන් පොස්පරස් පොටෑසියම් යන ප්‍රධාන පෝෂක සැපයීමට විවිධ කාබනික ද්‍රව්‍ය යොදා ගනිමින් නිර්දේශිත කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීමේ ක්‍රම භාවිතා කරනවා ද? | | |
| | | Q 5 | රෝග ප්‍රතිරෝධී හා ඔරොත්තු දෙන, උසස් අස්වැන්නක් දෙන, ඉක්මනින් පූදින, රසැති, නිසි ප්‍රමාණයෙන් යුත්, යන ලක්ෂණ එකක් හෝ කීපයක් සහිත ගුණාත්මක නිර්දේශිත රෝපන ද්‍රව්‍ය භාවිතා කරනවා ද? | | |
| **2** | බිම් පිලියෙල කිරීම | Q 6 | ඔබ පහත දැක්වෙන නිර්දේශිත බිම් පිලියෙල කිරීමේ ක්‍රම එකක් හෝ කීපයක් භාවිතා කරනවා ද? හිරු එලියට නිරාවරනය කිරීම, කාලීන සී සෑම,සුදුසු ගැඹුරට සී සෑම, පස් මගින් බෝ වන රෝග හා පලිබෝධ ව්‍යාප්ත වීම අඩු කිරීමට පස් චලනය වීම අවම කිරීම | | |
| | | Q 7 | ඔබ ගොවිපලේ සිටුවීමට මාස 2කටවත් කලින් බෝග අවශේෂ පසට මිශ්‍ර කරනවාද? | | |
| | | Q 8 | සිටුවීමට සති 1-2 වත් පෙර කාබනික පොහොර (කොම්පොස්ට් ගොවිපල පොහොර හෝ වෙනත්) පසට මිශ්‍ර කරනවා ද? | | |
| **3** | බෝගය ස්ථාපිත කිරීම (සිටුවීම) | Q 9 | එලවලු බීජපැල සකස් කර ගැනීමේ දී නිර්දේශිත රෝපණ ක්‍රියාවන් භාවිතා කරනවා ද? | | |
| | | Q 10 | ඔබ පැල/බීජ සිටුවීමේ දී නිර්දේශිත පරතරයන් | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | භාවිතා කරනවා ද? | | |
| | | Q 11 | ඔබ බීජ/පැල සිටුවීමේ දී නිර්දේෂිත පොහොර ප්‍රමාණ යොදන්නේ ද? | | |
| **4** | බෝග කළමණාකරණය | Q 12 | පහත දැක්වෙන ජල සම්පාදන ක්‍රම වලින් එකක් හෝ කීපයක් බෝගයේ අමතර ජල අවශ්‍යතාවය සැපිරීම සදහා යොදා ගන්නවා ද? පිටාර -බේසම් -ඇලි වැටි -බිංදු -විසිරුම් ජල සම්පාදනය | | |
| | | Q 13 | ඔබ සුදුසු කාලයේ දී යෝග්‍ය උපකරණ යොදා ගෙන වල් මර්ධනය කරනවා ද? | | |
| | | Q 14 | ඔබ නිර්දේශිත මතුපිට පොහොර යෙදීමේ ක්‍රම අනුගමනය කරනවාද ?: අවස්ථාව, වර්ග, ප්‍රමාණ හා  ක්‍රම | | |
| | | Q 15 | ඔබ පහත දැක්වෙන ඒකාබද්ධ පළිබෝධ පාලන ක්‍රම වලින් දෙකක් වත් භාවිතා කරනවා ද? රෝපණ ක්‍රියා -භෞතික ක්‍රියා -ජීව විද්‍යාත්මක ක්‍රියා -රසායනික ක්‍රියා | | |
| | | Q 16 | ඔබ පහත දැක්වෙන ආරක්ෂාකාරී හා කාර්යක්ෂම පළිබෝධනාශක යෙදීමේ ක්‍රම අනුගමනය කරනවා ද? නිර්දේශිත පළිබෝධනාශක, නියමිත මාත්‍රාව, හා පශ්චාත්-අස්වනු නෙලීමේ කාලය | | |
| **5** | අස්වනු නෙලීම | Q 17 | ඔබ පහත දැක්වෙන අස්වනු නෙලීමේ දර්ශක(harvesting indices) වලින් එකක් වත් භාවිතයට ගන්නවා ද ? වර්ණය, ප්‍රමාණය, හැඩය, දැඩිබව | | |
| **6** | පශ්චාත්-අස්වනු පරිහරණය | Q 18 | අස්වනු නෙලීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම, ඇසිරීමේ භාජන හා සම්මත ඇසිරීමේ ද්‍රව්‍ය තෝරා ගැනීම යන කරුණු වලදී ඔබ පහත සදහන් ලක්ෂණ  ගැන සැලකිලිමත් වෙනවා ද? වාතාශ්‍රය, පිරිසිදු කිරීමේ පහසු බව, හානි අවම වීම (සුමුදු බව). | | |
| | | Q 19 | ඔබ පහත දැක්වෙන අගය එකතු කිරීමේ ක්‍රම වලින් එකක් හෝ යොදා ගන්නවා ද? පිරිසිදු ක්රිම, තේරීම, ශ්‍රේණි කිරීම, ඇසිරීම, හෝ නිෂ්පාදන සැකසීම | | |
| **7** | ආදායම් වියදම් විශ්ලේෂණය | Q 20 | ඔබ නිෂ්පාදනය කිරීමට හා අලෙවි නිරීමට අදාල වියදම් වල වාර්ථා තබා ගෙන ආදායම් වියදම් විෂ්ලේෂණයක් සිදු කරනවා ද? | | |
| **8** | සාමූහිකව කටයුතු කිරීම | Q21 | බීජ, පොහොර, කෘෂි රසායනික වැනි කෘෂිකාර්මික යෙදවුම් මිල දී ගන්නේ කංඩායමක් ලෙස ද? | | |
| | | Q22 | ඔබ ඔබේ නිෂ්පාදන ප්‍රවාහනය හා අලෙවිය සාමුහිකව කංඩායමක් ලෙස සිදු කිරීමට කටයුතු කරනවා ද? | | |
| | | Q23 | ඔබ ඉලක්ක බෝග තෝරන්නේ කංඩායමක් ලෙස ද? ඔබ කංඩායමේ සාමාජිකයන් සමග එක්ව සාමුහිකව නිෂ්පාදන හා අලෙවි උපාය මාර්ග සැලසුම් කරන්නෙහි ද? | | |

## *2.2 පාර්ශවකරුවන්ගේ සංසදය (විකල්ප ක්‍රියාකාරකමකි: අනිවාර්ය නොවේ)*

| පියවර 4 | කටයුතු |
|---|---|
| **1. ගොවීන් සමඟ ඉලක්කය බෙදා ගැනීම.** | සංවේදීකරණ වැඩමුළුව |
| **2. ගොවීන් දැනුවත් කිරීම.** | සහභාගීත්ව මූලික සමීක්ෂණය<br>**-පාර්ශවකරුවන්ගේ රැස්වීම/සංසදය** (අනිවාර්ය නොවේ)<br>වෙළඳපල සමීක්ෂණය |
| **3. ගොවීන් තීරණ ගැනීම.** | ඉලක්කගත බෝග තේරීම<br>බෝග කැලැන්ඩර සෑදීම |
| **4. ගොවීන් කුසලතා ලබා ගැනීම.** | ක්ෂේත්‍රයේ පුහුණුවීම් |
| පසු විපරම් සහ අධීක්ෂණය (සහභාගී අවසාන සමීක්ෂණය ඇතුළුව) | |

අපි මෙතැන

සටහන: මෙය "විකල්ප ක්‍රියාකාරකමක්", එනම් (1) ඉලක්කගත ප්‍රදේශවල සමාජ-ආර්ථික තත්ත්වයන් සලකා බැලීමේදී සහ (2) ප්‍රමාණවත් මානව හා මූල්‍ය සම්පත් තිබේ නම්, ක්‍රියාත්මක කරන්නන් එය ඉතා ඵලදායී යැයි විශ්වාස කරන්නේ නම්, මෙම ක්‍රියාකාරකම සිදු කළ යුතු බවයි.

### ඇයි?- **අරමුණු**


මෙම පාර්ශවකරුවන්ගේ සංසදය සිදු කිරීමේ අරමුණු දෙකක් ඇත: (1) එය ගොවීන්ට උද්‍යාන බෝග ගොවිතැනින් ගෙන ආ හැකි ව්‍යාපාරික අවස්ථාවක් පෙන්වයි, (2) උද්‍යාන බෝග ව්‍යාපාරයට සම්බන්ධ විවිධ වෙළඳපල ක්‍රියාකාරීන් සමඟ ව්‍යාපාරික සම්බන්ධතා ඇති කර ගැනීමට ගොවීන්ට උපකාර කරයි.

### කෙසේද? - **අන්තර්ගතය**

අර්ධ දින පාර්ශවකරුවන්ගේ සංසදය සඳහා SHEP ඉලක්කගත ගොවි කණ්ඩායම්වල නියෝජිතයින්, කෘෂිකාර්මික යෙදවුම් සැපයුම්කරුවන්, ගැනුම්කරුවන් (වෙළෙන්දන්, අතරමැදියන්, තොග වෙළෙන්දන්, සිල්ලර වෙළෙන්දන්, ආදිය), ආහාර සැකසුම් සමාගම්, බෝග අපනයනකරුවන්, ප්‍රවාහනය කරන්නන්, මූල්‍ය ආයතන, වැනි වෙළඳපල පාර්ශවකරුවන් , රාජ්‍ය නොවන සංවිධාන යනාදී විවිධ පාර්ශ්වයන් සඳහා ආරාධනා කරයි. ගොවීන් වෙළඳපල පාර්ශවකරුවන්ගේ කුටිවලට ගොස් සාකච්ඡා මගින් ව්‍යාපාරික තොරතුරු හුවමාරු කර ගනී.

## කෙසේද? - ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ඉගි:


- කෘෂිකාර්මික පොළ හෝ කෘෂිකාර්මික දිනය වැනි මහා පරිමාණ සිදුවීම් මෙන් නොව, තෝරාගත් සහභාගිවන්නන් අතර පහසු සන්නිවේදනය සඳහා පහසුකම් සැලසීම සඳහා පාර්ශවකරුවන්ගේ සංසදයට **සහභාගිවන්නන් සංඛ්‍යාව සීමා කළ යුතුය.**
- SHEP ගොවි කණ්ඩායම්වල අනාගත ව්‍යාපාරික හවුල්කරුවන් බවට පත්වන දේශීය වෙළඳුන් වැනි වෙළඳපල පාර්ශවකරුවන්ට පමණක් ආරාධනා කළ යුතුය.
- ව්‍යාප්ති කාර්ය මණ්ඩලය, ගොවීන්ට වෙළඳපල පාර්ශවකරුවන් සමඟ සක්‍රීය ව්‍යාපාරික සාකච්ඡා සඳහා උපකාර කළ යුතුය.
- සහභාගීවන්නන්ගේ විස්තර කලින් හුවමාරු කර ගත යුතු අතර එමඟින් සහභාගීවන්නන් හට කාලය අපතේ නොයවා ව්‍යාපාරික සාකච්ඡා වහාම ආරම්භ කළ හැක.




## පියවර - ක්‍රියාත්මක කිරීමේ ක්‍රියා පටිපාටි (අවශ්‍ය කාලය: පැය 3-4)

1. (සූදානම් කිරීම) පාර්ශවකරුවන්ගේ සංසදය පැවැත්වීම සඳහා සම්මන්ත්‍රණ ශාලාවක් වෙන්කරවා ගන්න. *<u>ඉඟිය! සංසදය පැවැත්වීම සඳහා රජයේ පහසුකමක් භාවිතා කළ හැකි නම්, ස්ථානයක් කුලියට ගැනීම සඳහා වන පිරිවැය සැලකිය යුතු ලෙස අඩු වනු ඇත.</u>*
2. (සූදානම් කිරීම) සංසදයට දේශීය වෙළඳපල පාර්ශවකරුවන් හඳුනාගෙන ආරාධනා කරන්න. *<u>ඉඟිය! ඉලක්කගත ගොවීන් සමඟ ව්‍යාපාර කිරීම ආරම්භ කිරීමට කැමති පාර්ශවකරුවන්ට පමණක් ආරාධනා කරන්න</u>.*
3. (සූදානම් කිරීම) කණ්ඩායමේ නියෝජිතයන් ලෙස සංසදයට සහභාගී වීමට පිරිමි සහ ගැහැණු ගොවීන් දෙදෙනෙකු තෝරා ගන්නා ලෙස ගොවි කණ්ඩායම්වලට උපදෙස් දෙන්න. *<u>ඉඟිය! ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයෙන්ම සමන්විත කණ්ඩායමකට වෙළඳපල පාර්ශවකරුවන් සමඟ ඔවුන්ගේ අන්තර්ක්‍රියා වලදී ඔවුන්ගේ අදහස් පුළුල් කළ හැකි බැවින්, පිරිමි සහ ගැහැණු ගොවීන් යන දෙදෙනාම නියෝජිතයන් ලෙස තෝරා ගැනීමට වග බලා ගන්න</u>.*

4. (සූදානම් කිරීම) සංසද දිනයට පෙර සහභාගිවන්නන් පිලිබද තොරතුරු (පැතිකඩ) හුවමාරු කර ගන්න. ඔවුන්ගේ නිෂ්පාදනවල සාම්පල සංසදයට ගෙන එන ලෙස ගොවි කණ්ඩායම්වලට කියන්න. සාම්පල ඔවුන්ගේ කුටිවල ප්‍රදර්ශනය කිරීමට නියමිතය.
5. (සූදානම් කිරීම) රජයේ සම්මන්ත්‍රණ ශාලාවක් වැනි සංසදය පවත්වන ස්ථානයේ, සහභාගිවන්නන් සඳහා ප්‍රමාණවත් තරම් මේස සහ පුටු සහිත කුටි සකස් කරන්න. <u>*ඉඟිය! සෑම කුටියකදීම සහභාගිවන්නන්ට බාධාවකින් තොරව තම සාකච්ඡා කෙරෙහි අවධානය යොමු කළ හැකි පරිදි ප්‍රමාණවත් ආසන තිබිය යුතුය.*</u>
6. සංසදය අතරතුර, ගොවි නියෝජිතයින්, ව්‍යාප්ති කාර්ය මණ්ඩලය සමඟින්, තොරතුරු හුවමාරු කර ගැනීමට සහ ව්‍යාපාරික සාකච්ඡා පැවැත්වීමට වෙළඳපොළ පාර්ශවකරුවන්ගේ කුටිවලට පැමිණේ.
7. සංසදයෙන් පසුව, කණ්ඩායම් නියෝජිතයින් සංසදයේ දී ඔවුන් ඉගෙන ගත් දේ බෙදා ගැනීමට ඔවුන්ගේ සමූහයේ ප්‍රතිපෝෂණ රැස්වීමක් (feedback meeting) සංවිධානය කරයි.



රූපය: ඉතියෝපියා

## නවෝත්පාදනය - විවිධ රටවල්/ කලාපවල අභිරුචිකරණය

සමහර රටවල් කෙන්යාවේ පැවති ඒවාට වඩා වෙනස් ලෙස පාර්ශවකරුවන්ගේ සංසද සංවිධානය කළේය. උදාහරණ කිහිපයක් පහත දැක් වේ.

### කොටුව 6 - ගැනුම්කරු-විකුණන්නන්ගේ සංසදය

**ගැනුම්කරු-විකුණුම් සංසදය - ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන්ට පමණක් ආරාධනා කිරීම (නේපාලය සහ මලාවි)**

<ඇයි?> ගොවීන් සහ උද්‍යාන වගා භෝග ගැනුම්කරුවන් අතර අවිශ්වාසයක් සහ වැරදි වැටහීමක් ඇති විය.

<කෙසේද?> පාර්ශවකරුවන්ගේ සංසදයක් සංවිධානය කිරීම වෙනුවට හෝ ඊට ඉහළින්, ක්‍රියාත්මක කරන්නන් විසින් ගොවීන් සහ ගැනුම්කරුවන් පමණක් සහභාගී වන ගැනුම්කරු-විකුණුම් සංසදයක් සංවිධානය කරන ලදී.



ඡායාරූපය මලාවි

<ප්‍රතිපලය?> සහභාගිවන්නන්ට එකිනෙකා කෙරෙහි අවධානය යොමු කර සාකච්ඡා කිරීමට සහ එකිනෙකාගේ ස්ථාවරය වඩා හොඳින් අවබෝධ කර ගැනීමට හැකි විය. ඔවුන් පෙර පැවති අවිශ්වාසය සහ වරදවා වටහාගැනීම් මඟහරවා ගත් අතර දෙපාර්ශවයටම ප්‍රයෝජනවත් වන ඉදිරි දැක්මක් සහිත විසඳුම් සෙවීමට පටන් ගත්හ.

### කොටුව 7: තවත් ගොවි නියෝජිතයින් සංසදයට පැමිණේ

**සංසදයට සහභාගී වන තවත් ගොවි නියෝජිතයින් (මලාවි, ඉතියෝපියාව)**

<ඇයි?> මලාවි සහ ඉතියෝපියාවේ ඉලක්කගත ගොවීන්ට වෙළඳපල පාර්ශවකරුවන් සමඟ සන්නිවේදනය කිරීමට හැකි බවට එතරම් විශ්වාසයක් තිබුණේ නැත. ඊට අමතරව, ඔවුන් පුහුණුවීම් වලදී ඉගෙන ගත් දේ අනෙක් කණ්ඩායමේ සාමාජිකයින්ට පැහැදිලි කිරීමට එතරම් දක්ෂ නොවන බව ඔවුන්ට හැඟුණි.

<කෙසේද?> ක්‍රියාත්මක කරන්නන් සෑම කණ්ඩායමකින්ම නියෝජිතයින් හතර දෙනෙකට වඩා වැඩි ප්‍රමාණයක් පාර්ශවකරුන්ගේ සංසදයට සහභාගී වන ලෙස ආරාධනා කළහ.



ඡායාරූපය මලාවි

<ප්‍රතිපලය?> වෙළඳපල පාර්ශවකරුවන් සමඟ අන්තර් ක්‍රියා කිරීම ගොවීන්ට පහසුවක් විය. සංසදයෙන් පසු, ප්‍රජාවේ පැවති රැස්වීමකදී ඔවුන් සංසදයේදී ඉගෙන ගත් දේ ඔවුන්ගේ සෙසු කණ්ඩායම් සාමාජිකයින්ට විස්තරාත්මකව පැහැදිලි කිරීමට ඔවුන්ට හැකි විය.

**ශ්‍රමය භාවිතය අඩු කිරීමේ මෙවලම් සහ උපකරණ ප්‍රදර්ශනය කිරීමේ සංසදය**

<ඇයි?> විශේෂයෙන්ම පලස්තීනයේ කාන්තා ගොවීන්ට ශ්‍රමය බරපතල ප්‍රශ්නයක් විය.

<කෙසේද?> ක්‍රියාත්මක කරන්නන් විවිධ ශ්‍රම ඉතිරිකිරීමේ කෘෂිකාර්මික මෙවලම් සහ උපකරණ අලෙවි කරන ව්‍යාපාරවලට ආරාධනා කළහ.



ඡායාරූපය මලාවි

<ප්‍රතිපලය?> ගොවිතැන් වඩාත් කාර්යක්ෂමව කරගෙන යාමට හැකි වන පරිදි එවැනි මෙවලම් සහ උපකරණ මිලදී ගැනීමට ගොවි කණ්ඩායම් තීරණය කළහ. ශ්‍රම ඉතිරි කිරීමේ මෙවලම් සහ උපකරණ හඳුන්වා දීමෙන් කාන්තා ගොවීන් විශේෂයෙන් ප්‍රතිලාභ ලබා ඇත.

**පිරික්සුම් ලැයිස්තුව - මෙම ක්‍රියාකාරකමෙන් පසු තහවුරු කළ යුතු කරුණු**

- සංසදයේ සොයාගැනීම් සහ ප්‍රතිඵල ඊට සහභාගී වූ කණ්ඩායමේ ගොවි නියෝජිතයින් විසින් අනෙක් කණ්ඩායම් සාමාජිකයින්ට දැනුම් දෙනු ලැබූ බව.
- ඉලක්කගත ගොවීන් උද්‍යාන බෝග සඳහා වන විවිධ ව්‍යාපාරික අවස්ථා අවබෝධ කර ගත් බව.
- ඉලක්කගත ගොවීන් සංසදයට ආරාධනා කර ඇති වෙළඳපල පාර්ශවකරුවන් සමඟ ඔවුන්ගේ ව්‍යාපාර ජාලය පුළුල් කර ගෙන ඇති බව.
- ඉලක්කගත ගොවීන් සංසදයට ආරාධනා කර ඇති වෙළඳපල පාර්ශවකරුවන් සමඟ සම්බන්ධතා පවත්වන බව.
- වෙළඳපල පාර්ශවකරුවන්ගේ පිරිමි සහ කාන්තා අනුපාතය සමතුලිත බව.
- කණ්ඩායමේ නියෝජිතයින්ගේ පිරිමි සහ ගැහැණු අනුපාතය සමතුලිත බව.
- ගොවි සමූහයේ සංවිධානය කරන ලද ප්‍රතිචාර දැක්වීමේ රැස්වීමට සහභාගිවන්නන්ගේ ස්ත්‍රී-පුරුෂ අනුපාතය සමතුලිත බව.

**දෝශ නිරාකරණ පිරික්සුම් ලැයිස්තුව - නිතරම ඇතිවන ගැටළු සඳහා විසඳුම්**

ප්‍ර: **සහභාගී වීමට ඇති කැමැත්ත** - වෙළඳුන්, සිල්ලර වෙළෙන්දන් යනාදී වෙළඳපල පාර්ශවකරුවන් පාර්ශවකරුවන්ගේ සංසදයට සහභාගී වීමට එතරම් උනන්දුවක් නොදක්වයි. සංසදයට ගෙන්වා ගැනීමට ඔවුන්ගේ පෙළඹවීම කුමක්ද?

පි: ඔවුන් සංසදයට එන්නේ ප්‍රධාන වශයෙන්ම ඔවුන්ගේ ව්‍යාපාර ජාලයන් පුළුල් කිරීමට අවශ්‍ය නිසයි. ඔවුන් ඉතා කාර්යබහුල පුද්ගලයන් බව මතක තබා ගන්න. ඔවුන් සංසදයේ ඉතා සීමිත ගොවි කණ්ඩායම් පමණක් දැන හඳුනා ගන්නා තත්වයක් යටතේ සහභාගී වීමෙන් වැඩි ප්‍රයෝජනයක් නොලැබෙයි නම්, ඔවුන්ගේ උනන්දුව නැති වී යනු ඇත. එවැනි අවස්ථාවන්හිදී, සංසදයක් සංවිධානය කරනවාට වඩා වෙළඳපල සමීක්ෂණ අභ්‍යාසයේදී තනි තනිව වෙළඳපල පාර්ශවකරුවන් හමුවීම වඩා සුදුසු වෙයි .

ප්‍ර: **එතරම් ක්‍රියාකාරී සාකච්ඡා සිදු නොවේ** - ගොවීන්ට වෙළඳපොළ පාර්ශවකරුවන් සමඟ සක්‍රීය සාකච්ඡා කිරීමට හැකියාවක් නැත. මන්ද?

පි: හේතු කිහිපයක් තිබීමට හැකිය. ගොවීන් ඕනෑවට වඩා නොසන්සුන් වීම, එතරම් විශ්වාසයක් ගොවීන් තුල නොමැති වීම, හෝ ඔවුන්ගේ ප්‍රජාවෙන් පිටත කෙනෙකු සමඟ විධිමත් සාකච්ඡා කිරීමට පුරුද්දක් නැතිකම විය හැකිය. පාර්ශව දෙකට සක්‍රීය සාකච්ඡා පැවැත්විය හැකි වන පරිදි ව්‍යාප්ත කාර්ය මණ්ඩලය එවැනි අවස්ථාවකදී ඔවුන්ට ක්‍රියාකාරීව සහාය විය යුතුය.


ප්‍ර: **සාකච්ඡා නිර්මාණාත්මක නොවේ-** "ගැනුම්කරුවන් සාධාරණ මිලක් ගෙවන්නේ නැත" හෝ "ගොවීන් බොහෝ විට බෑගයක පතුලේ කුණු වූ නිෂ්පාදන සඟවයි" වැනි දේවල් කියමින් ගැනුම්කරුවන් සහ ගොවීන් එකිනෙකාට පැමිණිලි කිරීමට පටන් ගනී. ඔවුන්ට ඇති ගැටළු විසඳීමට සාධනීය ලෙස සාකච්ඡා පැවැත්වීමට හැකියාවක් නොමැති විය හැක. අප කළ යුත්තේ කුමක්ද?

පි: සංසදය ආරම්භයේදී, සංසදය යනු සහභාගිවන්නන් අන් අයට දොස් පැවරිය යුතු ස්ථානයක් නොවන බව ක්‍රියාත්මක කරන්නන්ට පැහැදිලි කිරීමට උපදෙස් දෙනු ලැබේ. ඒ වෙනුවට, එම සහභාගිවන්නන්ට ඔවුන් තිබෙන ගැටලු සඳහා විසඳුම් ඉදිරිපත් කිරීමට අවස්ථාව තිබේ. නේපාලයේදී, ක්‍රියාත්මක කරන්නන් විසින් සංසදයේ ආරම්භයේ පොදු වෙළඳ ගැටළු ලැයිස්තුගත කිරීමට පූර්ණ බුද්ධි කලම්බන සැසියක් පැවැත්වීය. ඉන්පසුව, ව්‍යාපාරික සාකච්ඡා අතරතුර, දෙපාර්ශ්වයටම ජයග්‍රාහී තත්වයක් වර්ධනය කිරීම අරමුණු කර ගත හැකි අයුරින් එකින් එක සිය ගැටළු වලට විසඳුම් සෙවීම කෙරෙහි අවධානය යොමු කරන ලෙස සහභාගිවන්නන්ගෙන් ඉල්ලා සිටින ලදි.


## තීරුව 3: විවිධ අනුපිළිවෙල, විවිධ අරමුණු

කෙන්යාවේ, පාර්ශවකරුවන්ගේ සංසදය සංවිධානය කරනු ලබන්නේ සහභාගීත්ව මූලික සමීක්ෂණයෙන් පසුවය, එනම් SHEP පුහුණු පාඨමාලාවේ සාපේක්ෂව මුල් අදියර තුළ ය. අනෙක් අතට, ඉතියෝපියාව වැනි සමහර රටවල් ගොවීන් ඉලක්කගත බෝග තෝරා ගැනීමෙන් පසුව පාර්ශවකරුවන්ගේ සංසදය සංවිධානය කරයි. සංසදය වෙනත් වේලාවක හෝ අනුපිළිවෙලකට සංවිධානය කර ඇත්නම්, එහි අරමුණ ද පහත විස්තර කර ඇති පරිදි වෙනස් වේ.

[ ආරම්භක අදියරේ සංවිධානය කර ඇති රැස්වීම]




[ඉලක්ක බෝග තේරීමෙන් පසු සංවිධානය කර ඇති රැස්වීම]




සටහන: ගොවීන්ගේ තෝරාගත් භෝග පිළිබඳව වෙළඳපල පාර්ශවකරුවන් දැනුවත් කරන බැවින් සහ සමූහව පැවැත්වීමට පෙර ගොවි කණ්ඩායම්වල උනන්දුව නිසා ඔවුන්ගේ විභව ව්‍යාපාරික හවුල්කරුවන් ලෙස ගොවීන් හමුවීමට රැස්වීමට පැමිණීමට ඔවුන් කැමැත්තක් දක්වයි.

## 2.3. *වෙළඳපල සමීක්ෂණය*

| පියවර 4 | කටයුතු |
|---|---|
| **1. ගොවීන් සමඟ ඉලක්කය බෙදා ගැනීම.** | සංවේදීකරණ වැඩමුළුව |
| **2. ගොවීන් දැනුවත් කිරීම.** | සහභාගීත්ව මූලික සමීක්ෂණය<br>-පාර්ශවකරුවන්ගේ රැස්වීම/සංසදය (අනිවාර්ය නොවේ)<br>**වෙළඳපල සමීක්ෂණය** ← අපි මෙතැන |
| **3. ගොවීන් තීරණ ගැනීම.** | ඉලක්කගත බෝග තේරීම<br>බෝග කැලැන්ඩර සෑදීම |
| **4. ගොවීන් කුසලතා ලබා ගැනීම.** | ක්ෂේත්‍රයේ පුහුණුවීම් |
| පසු විපරම් සහ අධීක්ෂණය (සහභාගී අවසාන සමීක්ෂණය ඇතුළුව) | |

### ඇයි? - අරමුණු


SHEP හි වෙළඳපල සමීක්ෂණ පවත්වනු ලබන්නේ ගොවීන් විසින්මය. රජයේ කාර්ය මණ්ඩලය හෝ බාහිර විශේෂඥයින් විසින් නොවේ. SHEP හි ගොවීන් විසින් ආරම්භ කරන ලද වෙළඳපල සමීක්ෂණයේ ප්‍රධාන අරමුණ වෙලඳපොලවල් ක්‍රියාත්මක වන්නේ කෙසේද යන්න සහ නිෂ්පාදකයින්ගෙන් වෙළඳපලට අවශ්‍ය දේ අවබෝධ කර ගැනීමේ අත්දැකීම් ලබා ගැනීමට දිරිමත් කිරීම වේ. ඒ අතරම, වෙළඳපල සමීක්ෂණ පැවැත්වීමෙන්, ගොවීන්ට තොග වෙළෙන්දන්, සිල්ලර වෙළෙන්දන්, අතරමැදියන් යනාදි විවිධ වෙළඳපල ක්‍රියාකාරීන් සමඟ හොද සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමට හැකි වනු ඇත, එසේම ඔවුන්ගේ අන්තර් පුද්ගල ජාල පුළුල් කිරීම මගින් වෙළඳපල පාර්ශවකරුවන් හා ගොවීන් යන දෙපාර්ශවයටම ජය අත්වන තත්වයක් නිර්මාණය කර ගැනීමට දායක විය හැකිය.

### මොනවාද?- දළ සටහන

ගොවි කණ්ඩායම් විසින් තෝරා ගන්නා ලද ගොවි නියෝජිතයින් වෙළෙඳපොළ සමීක්ෂණ පැවැත්වීම සිදු වන්නේ කෙසේද යන්න ඉගෙන ගැනීමට පුහුණුවට සහභාගී වේ. (1) වෙළඳපල සමීක්ෂණ පවත්වන්නේ කෙසේද යන්න විස්තර කිරීමත්, (2) ප්‍රාදේශීය වෙලදපොලක සංවිධානය කර සිදු කරන ලද සැබෑ වෙළඳපල සමීක්ෂණ අභ්‍යාසයක් පැවත්වීමත් මෙම පුහුණුවට ඇතුලත් වේ. ප්‍රාදේශීය වෙළෙඳපොළ පුහුණුවෙන් පසු ගොවි නියෝජිතයන් වෙළඳපල සමීක්ෂණයේ ප්‍රතිඵලය මෙන්ම වෙළඳපල සමීක්ෂණ පැවැත්වීමේ ක්‍රමය ද කණ්ඩායමේ අනෙක් සාමාජිකයින්ට උගන්වයි. SHEP ක්‍රියාත්මක කරන්නන් වෙළඳපල සමීක්ෂණයක් "ප්‍රායෝගිකව" පැවැත්වීමට පමණක් අවස්ථාවක් ගොවීන්ට සපයන බව මතක තබා ගැනීම වැදගත්ය. මෙම ප්‍රායෝගික "පුහුණුවෙන්" පසු, රජයෙන් උදව්වක් නැතිව ගොවීන් විසින් සිදු කරනු ලබන "සැබෑ" වෙළඳපල සමීක්ෂණ නැවත නැවතත් සිදු කිරීම අපේක්ෂා කෙරේ.

## කෙසේද? - ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ඉඟි

- **ගොවීන් විසින්** ප්‍රශ්නාවලි පෝරමය අතේ ගෙන යමින්, **වෙළඳපල සමීක්ෂණ පැවැත්විය යුතුය**. රජයේ කාර්ය මණ්ඩලය විසින් නොවේ.
- වෙළඳපල සමීක්ෂණ අරමුණු වන්නේ **වෙළෙඳපොළ මිල පමණක් නොව,** නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහ අවශ්‍ය ප්‍රමාණය, මිල හා වෙළඳපොල මිල උච්ඡාවචනයන්, අලෙවි වන ප්‍රමාණය, ගෙවීම් කරන ආකාරය, ආදී අවශ්‍ය තොරතුරු ද එකතු කිරීම වේ.
- වෙළෙඳ පොළ සමීක්ෂණවලදී ගොවීන් වෙළඳපොලේදී හමුවෙන වෙළඳපල ක්‍රියාකාරීන් සමඟ ව්‍යාපාරික සබඳතා ආරම්භ කිරීමට දිරිගන්වනු ලැබේ
- ඒ වෙළෙඳ පොළ ගොවීන් තමන් විසින්ම රජයේ උදව් නොමැතිව නිතිපතා සමීක්ෂණ අඛණ්ඩව සිදු කළ යුතු බව තේරුම් ගත යුතුය.





## පියවර - ක්‍රියාත්මක කිරීමේ ක්‍රියා පටිපාටි (අවශ්‍ය කාලය: පැය 3-4)

1. (සූදානම් වීම) වෙලදපොල සමීක්ෂණ පුහුණුව සදහා ගොවි කණ්ඩායමෙන් නියෝජිතයන් තිදෙනෙකු (සම්මුඛ පරීක්ෂකවරයෙකු, සටහන් කරන්නෙකු සහ කාලරකින්නා -ගොවීන් තිදෙනෙකුගේ එකතුවක්) තෝරා ගන්නා ලෙස ගොවි කණ්ඩායමට උපදෙස් දෙන්න. *__ඉඟිය! නියෝජිතයන් ලෙස ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයම තෝරා ගත යුතුය. පුහුණු කිරීමේ පහසුව සඳහා සාක්ෂරතාව ඇති ගොවීන් තෝරා ගත හැකිය. කෙසේ වෙතත්, සාක්ෂරතාවය ඇති සහෝදර ගොවීන්ගේ ප්‍රමාණවත් සහය ඇතිව, සාක්ෂරතාවය නැති ගොවීන්ට ද කණ්ඩායම් නියෝජිතයන් ලෙස වැඩ කළ හැකි බව අතීත අත්දැකීම් අනුව පෙනී ගොස් ඇත.__*

2. (සූදානම් වීම) ගොවීන් වෙළඳපල සමීක්ෂණ අභ්‍යාසයක් පැවැත්වීම සඳහා යන වෙළඳපොළේ කළමනාකරුගෙන් අවසරය ලබා ගත යුතුය. SHEP ක්‍රියාත්මක කරන්නන්ට සහ ව්‍යාප්ති කාර්ය මණ්ඩලයට වෙළඳපොලේ බෝග වෙළඳාම් කරන ආකාරය, එතරම් හුරුපුරුදු නැතිනම් ගොවීන් වෙලදපොල වෙත ගෙන යාමට පෙර ප්‍රාථමික වෙළඳපල සමීක්ෂණයක් ක්‍රියාත්මකකරන්නන් පමණක් යොදා ගෙන සිදු කල හැක. ගොවීන්ට අවශ්‍ය තොරතුරු කාර්යක්ෂමව රැස්කර ගත හැකි වන පරිදි විමසිලිමත්ව පරීක්ෂා කර බලා සතියේ වඩාත් සුදුසු දින(ය) හා දවසේ වේලාව තෝරා ගැනීම සුදුසු වේ.

3. වෙළඳපල සමීක්ෂණය පවත්වන්නේ කෙසේදැයි ඉගැන්වීම සඳහා පුහුණුවක් සංවිධානය කරන්න. (පළමුව දේශන සහ ඊලගට ආසන්නතම වෙළදපොලක ප්‍රායෝගික වෙළදපොල සමීක්ෂණ අභ්‍යාසය).

4. ගොවීන් සතු වෙළදපොලේ එකතු කරන ලද තොරතුරු නැවත සලකා බලන්න. නියෝජිතයන් ලබා ගත්තා තොරතුරු සියලුම කණ්ඩාමේ අනෙක් සාමාජිකයින් අතර වෙළඳපල සමීක්ෂණයෙන් පසුව නිශ්චිත කාල පරිච්ඡේදයක් ඇතුළත (උදා. සතියක් ඇතුළත) බෙදා ගන්නා ලෙස ඔවුන්ට උපදෙස් ලබා දෙන්න. ඉඟිය! වෙනත් ගොවීන් සමඟ තොරතුරු බෙදාගැනීම සඳහා පැහැදිලි කාල රාමුවක් සැකසීමට වග බලා ගන්න. නියෝජිතයන් තොරතුරු හුවමාරු කර ගැනීමේ රැස්වීම සංවිධානය කිරීමට ව්‍යාප්ති කාර්ය මණ්ඩලය උදව් කළ යුතුයි.



ඡායාරූපය කෙන්නියාව




ඡායාරූපය කෙන්යාව



## ආකෘතිය - වෙළඳපල සමීක්ෂණ ප්‍රශ්නාවලිය

ආදර්ශ වෙළඳපල සමීක්ෂණ ප්‍රශ්නාවලියක් පහත දැක්වේ. පහතින් පෙන්වා ඇති තීරු පිරවීමට අමතරව, ගොවීන් ඔවුන්ට වැදගත් යයි සිතන වෙනත් අදාළ තොරතුරු රැස් කිරීමට උනන්දු කරවනු ලැබේ. එවැනි අවස්ථාවක, ඔවුන් ලබාගත් තොරතුරු සටහන් කිරීමට ප්‍රශ්නාවලියේ ඇති හිස් අවකාශය භාවිතා කිරීමට උපදෙස් දෙන්න.

**වෙලදපොල සමීක්ෂණ ප්‍රශ්ණාවලිය**

| වෙළෙන්දාගේ නම හා සම්බන්ධතා විස්තර | නිෂ්පාදනය හා ප්‍රභේදය | නිෂ්පාදන ගුණාත්මය හා වෙළඳපොල අවශ්‍යතා | ඉහළම ඉල්ලුම (මාස) | සැපයුම් ප්‍රමාණය හා කාලාන්තරය (දිනපතාහා සතිපතා) | ඒකකයක (කි ග් ) මිල | ගෙවීම් කරන ආකාරය | ගෙවීම් කොන්දේසි | අලෙවි අභියෝග | කංඩායමෙන් නිෂ්පාදන මිල දී ගැනීමටවෙලෙන්දාගේ කැමැත්ත |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

## නවෝත්පාදනය - විවිධ රටවල්/ කලාපවල අභිරුචිකරණය

කෙන්යාවේ සමාජ-ආර්ථික තත්ත්වයන්ට වඩා වෙනස් විවිධ කලාපවල හා රටවල තත්වයන්ට ගැලපෙන ලෙස කරන ලද වෙනස් කිරීම් (innovative customization සඳහා උදාහරණ කිහිපයක් පහත දැක්වේ. මෙම වෙනස්කම් නිසා , ඔවුන් අපේක්ෂිත ප්‍රතිඵල ඉක්මවා යනු ඇත.

**කොටුව 9 වෙළඳපල සමීක්ෂණ වලදී විවිධ සමාගම් සහ සංවිධාන වෙත පැමිණීම**

### වෙළඳපල සමීක්ෂණ අතර තුළ විවිධ සමාගම් සහ සංවිධාන වෙත පැමිණීම (ලෙසෝතෝ, ටැන්සානියාව සහ සිම්බාබ්වේ).

<ඇයි?> SHEP ක්‍රියාත්මක කිරීමේ කණ්ඩායමට මූල්‍ය සහ මානව සම්පත් සම්බන්ධයෙන් සැලකිය යුතු සීමාවන් තිබුණි. සම්පත් සීමාවන් නිසා පාර්ශවකරුවන්ගේ සංසද සංවිධානය කිරීම අපහසු විය.

<කෙසේද?> වෙළඳපල සමීක්ෂණ අභ්‍යාසය අතරතුර, වෙළඳපලේම අනිවාර්යෙන් තිබීම අවශ්‍ය නොමැති වුවත් එකම හෝ ආසන්න නගරවල පිහිටා ඇති කෘෂිකාර්මික යෙදවුම් සමාගම්, අපනයන සමාගම්, රෝහල්, පාසල්, ලැගුම්හල්, සුපිරි වෙළඳසැල් යනාදිය වැනි විවිධ සමාගම් සහ සංවිධාන වෙත ක්‍රියාත්මක කරන්නන් විසින් සංචා ාළ ගැනුම්කරුවන්ට අමතරව ප්‍රධාන වෙළෙඳපොළ පාර්ශවකරුවන් වෙත ගොස් හමු විය.

<ප්‍රතිඵල?> අතිරේක මූල්‍ය හා මානව සම්පත් භාවිතා නොකර මෙම ක්‍රමය හරහා පාර්ශවකරුවන්ගේ සංසදයකට සඳහා ඇති කළ හැකි බලපෑම ලබා ගන්නා ලදී.

**කොටුව 10 වෙළඳපල සමීක්ෂණ අභ්‍යාසයට පෙර ගොවීන් විසින් කරන ලබන භූමිකා රංගනය**

**වෙළඳපල සමීක්ෂණ අභ්‍යාසයට පෙර ගොවීන් විසින් භූමිකා රංගනය (එල් සැල්වදෝරය)**

<ඇයි? > ඉලක්කගත ප්‍රදේශයේ, බහුතර ගොවීන් තම නිෂ්පාදන අලෙවි කළේ ඔවුන්ගේ එළවළු වගාවට පැමිණි අතරමැදියන්ට පමණි. ඔවුහු වෙළඳපොලේ කිසිවකු සමඟ කලින් අන්තර්ක්‍රියා සිදු කර නොතිබුණි. වෙළඳපොලේ දී මිනිස්සුගෙන් ප්‍රශ්න ඇසීම ගැන ඔවුන්ට මහත් චකිතයක් දැනුනි.



ඡායාරූපය: එල් සැල්වදෝරය

<කොහොමද? > වෙලදපොල සමීක්ෂණ සිදු කරන්නේ කෙසේදැයි ඉගැන්වීමෙන් අනතුරුව භූමි රංගනයක ආකාරයෙන් ප්‍රශ්ණ ඇසීම ප්‍රගුණ කරන ලෙස ගොවි නියෝජිතයන්ට උපදෙස් දී ඇත. සමහරු ගොවියක්ගේ භූමිකාව රග දැක්වූ අතර අනෙක් ගොවි නියෝජිතයන් වෙලදපොලේ ගැණුම්කරුවනාගේ භූමිකාව රග දැක් වූයේය.

<ප්‍රතිඵල? > වෙළඳපල සමීක්ෂණ අභ්‍යාසය අතරතුර දී ප්‍රශ්න ඇසීමට ගොවීන්ට වඩාත් පහසු සහ විශ්වාසයක් දැනුණි. විශ්වාසයෙන් යුතුව කුෂලතා පූර්ණව ඔවුන්ගේ ගැනුම්කරුවන්ගෙන් අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට ඔවුන්ට හැකි විය.

**කොටුව 11** **ක්‍රියාත්මක කරන්නන් සූදානම් කිරීමේ වෙළඳපල සමීක්ෂණයක් පවත්වයි**

### ක්‍රියාත්මක කරන්නන් සහභාගිත්ව වෙළඳපල සමීක්ෂණයක් පැවැත්වීම (එල් සැල්වදෝරය, දකුණු අප්‍රිකාව)

<ඇයි?> ක්‍රියාත්මක කරන්නන් ප්‍රාදේශීය වෙලදපොලවල තත්වයන් පිලිබදව එතරම් හුරුපුරුදු බවක් නොවීය.

<කොහොමද?> ක්‍රියාත්මක කරන්නන් කල්තියා වෙළඳපොළට ගොස් කුඩා පරිමාණ ගොවි කණ්ඩායම් වලින් එළවළු මිලදී ගැනීමට කැමැත්තෙන් සිටිනා එනම් අනාගත ගැනුම්කරුවන්, හඳුනාගන්නා ලදී. ගොවීන්ට සිතියම් බැලීම මගින් එම විභව ගැනුම්කරුවන් පහසුවෙන් සොයා ගත හැකි වන පරිදි වෙළඳපොලේ සරල සිතියම් ක්‍රියාත්මකකරන්නන් විසින් ඇද ගනු ලැබේ .



එල් සැල්වදෝරයේ SHEP ක්‍රියාත්මක කරන්නන් විසින් අඳින ලද / ලියා ඇති වෙළඳපල සහ විභවතාව ඇති ගැනුම්කරුවන් පැහැදිලි කිරමින් අඳින ලද සිතියමක්.

<ප්‍රතිඵල?> වෙළඳපල සමීක්ෂණය අභ්‍යාස අතරතුර දී සීමිත කාලයක් තුළ ඔවුන් සමඟ වෙළඳාම් කිරීමට කැමැත්තෙන් සිටි ගැනුම්කරුවන් සොයා ගැනීමට සහ හඳුනා ගැනීමට ගොවීන්ට හැකි විය.

**කොටුව 12** **විමර්ශනය කිරීම සඳහා ගොවීන් බෝග හයකට වඩා තෝරා ගැනීම**

### විමර්ශනය කිරීම සඳහා ගොවීන් බෝග හයකට වඩා තෝරා ගනී (එල් සැල්වදෝරය සහ දකුණු අප්‍රිකාව)

<ඇයි?> බෝග නිෂ්පාදනයේ දී ඉලක්ක ප්‍රදේශය දේශගුණය ආශ්‍රිත සහ පළිබෝධ/රෝග ආශ්‍රිත ඉහල අවදානම් මට්ටමකට මුහුණ දී තිබුනි. බෝග විවිධාංගීකරණය ප්රදේශය ගොවීන් ගේ තිබුනු ප්‍රධානතම ප්‍රමුඛතාවයන්ගෙන් එකක් විය. අවධානම කළමණාකරණය කර ගැනීමේ පරමාර්ථ සහිතව වගා කිරීමට විවිධ වර්ගයේ බෝග වල මූල්‍යමය හා තාක්ෂණික යෝග්‍යතාවය විමසා බැලීම සඳහා ඉලක්ක ගොවීන් උනන්දුවක් දැක්වීය.

<කෙසේද?> ආරම්භයේ දී වෙළඳපල සමීක්ෂණයේදී විමර්ශනය කිරීම සඳහා ඉලක්කගත භෝග පහක් තෝරා ගැනීමට ගොවීන්ට උපදෙස් දෙන අතරතුර, ක්‍රියාත්මක කරන්නන් විසින් බෝග විවිධාංගීකරනයේ වැදගත්කම අවබෝධකරගැනීමෙන් පසුව වෙළඳපල සමීක්ෂණයේදී බෝග වර්ග හයකට වඩා තෝරා ගන්නා ලෙස ගොවීන්ට උපදෙස් දෙනු ලදී. බැලිය යුතු භෝග බෝග විවිධාංගීකරණය සඳහා අවශ්‍යතාවය ක්‍රියාත්මක කරන්නන් විසින් අවබෝධ කරගත් පසු හයකට වඩා තෝරා ගැනීමට ඔවුන්ට උපදෙස් දෙන ලදී.


ඡායාරූපය කෙන්නියාව

<ප්‍රතිඵල?> සමීක්ෂණයෙන් පසුව ගොවීන්ට අවශෙ‍යයන්ම සම්පබවක් නැති වගා කැරීමට විභවයක් ඇත්තාවූ බෝග සොයා ගැනීමට ඔවුන්ට හැකි විය. ඉලක්ක බෝග ලෙස ගොවීන් තෝරා ගන්නා ලද අලුත් බෝග වලට අදාල නිෂ්පාදන තාක්ෂණයන් පිලිබදව පුහුණු ලබා දීමෙන් ක්‍රියාත්මක කරන්නන් ගෙවීන්ට උදව් කරනු ලබයි. එමනිසා ගොවීන්ට බෝග විවිධාංගීකරනයේ නිරත වීමට හැකියාව ලැබේ.

**කොටුව 13** වෙළඳපල සමීක්ෂණ සඳහා නියෝජිතයන් ලෙස නූගත් ගොවීන් තෝරාගෙන ඇත

## වෙළඳපල සමීක්ෂණ සඳහා නියෝජිතයන් ලෙස සාක්ෂරතාවය නැති ගොවීන් තෝරාගෙන ඇත (ඉතියෝපියාව සහ දකුණු අප්‍රිකාව)

<ඇයි?> ඉලක්කගත ප්‍රදේශයේ ඉලක්කගත ගොවීන්ගෙන් බහුතරය සාක්ෂරතාවය නැති ගොවීන් විය. කණ්ඩායමට නායකත්වය දිය හැකි අභිප්‍රේරණය වූ ගොවි කංඩායම් සාමාජිකයින් සාක්ෂරතාවය නැති පුද්ගලයින් විය.



ඡායාරූපය ඉතියෝපියාව

<කොහොමද?> වෙළඳපල සමීක්ෂණ අභ්‍යාසය සඳහා ගොවි කණ්ඩායමේ කණ්ඩායම් නියෝජිතයන් ලෙස සාක්ෂරතා ඇති සහ සාක්ෂරතාවය නැති ගොවීන් යන දෙකොටසම තෝරා ගන්නා ලදී.

<ප්‍රතිඵල?> සාක්ෂරතාව ඇති සහ සාක්ෂරතාවය නැති ගොවීන් වෙනස් වෙනස් ශක්තීන් ප්‍රදර්ශනය කලෝය. නිදසුනක් වශයෙන්, සාක්ෂරතාවයෙන් යුත් ගොවීන්ට තමන් නොදන්නා පුද්ගලයන් සමග අන්තර්ක්‍රියා කිරීමේ විශ්වාසයක් තිබුණි. ඔවුන් අපහසුවකින් තොරව සටහන් ලබා ගන්නා ලදී.

අනෙක් අතට සාක්ෂරතාවය නැති ගොවීන්, බොහෝ විට හොඳ මතකයක් සහිත වූ අතර ඉතා නිරීක්ෂණශීලී ද විය. ඔවුන් එකිනෙකා අනුපූරක වූ අතර සමීක්ෂකයන් ලෙස හොඳ කණ්ඩායම් සකස් කර ගැනීමට පුලුවන් වීය..

තවද, සාක්ෂරතාවය නැති ගොවීන් කණ්ඩායම් නියෝජිතයන් ලෙස තෝරා ගැනීම නිසා එසේ තෝරා ගත් ගොවීන් පමණක් නොව, කණ්ඩායමේ සිටින ඔවුන්ගේ සෙසු සාක්ෂරතාවය නැති සාමාජිකයන් ද . මනෝ විද්‍යාත්මකව සවිබල ගැන්වීම සිදු විය.

**කොටුව 14** විධිමත් සහ අවිධිමත් වෙලඳපොලවල වෙළඳපල සමීක්ෂණ පැවැත්වීම

## විධිමත් සහ අවිධිමත් වෙළඳපල තුළ වෙළඳපල සමීක්ෂණ පැවැත්වීම (දකුණු අප්‍රිකාව සහ සිම්බාබ්වේ)

<ඇයි?> සුපිරි වෙළඳසැල් වැනි විධිමත් වෙළෙඳපොළ සහ දේශීය එළිමහන් වෙළෙඳපොළ වැනි අවිධිමත් වෙළඳපල ලෙස සුවිශේෂී වෙලදපොල දෙකක් ඉලක්කගත ප්‍රෙද්ශයේ තිබුනි. මේ දෙකේ වෙළඳපල ක්‍රියාකරුවන් සහ වෙළෙඳපොළ අවශ්‍යතා එකිනෙකට වෙනස් විය.



ඡායාරූපය එල් සැල්වදෝරය

<කොහොමද?> ක්‍රියාත්මක කරන්නන් වෙළඳපල සමීක්ෂණ අභ්‍යාස සැසි දෙකක් සූදානම් කරන ලදී; එකක් විධිමත් වෙළඳපොළ සඳහා සහ අනෙක අවිධිමත් වෙළෙඳපොළ සඳහා ය. ඔවුන් මුලින්ම ගොවීන් වඩාත් හුරුපුරුදු වූ අවිධිමත් වෙළඳපොළක සහ පසුව විධිමත් වෙලදපොලක ලෙස වෙළඳපල සමීක්ෂණයක් සංවිධානය කලේය..

<ප්‍රතිඵල?> බෝග වර්ගය, ගුණාත්මය, ප්‍රමාණය, ආදී ලෙස විවිධ වෙලදපොල වලට ආවේනික වූ මනාපයන් ඇති බව එහි දී ගොවීන්ට අවබෝධ කර ගැනීමට හැකි වීය. විධිමත් වෙළෙඳපොළට හුරුපුරුදුව නොසිටි ගොවීන් විධිමත් සහ අවිධිමත් වෙලදපොලවල ඇති අවස්ථා දෙකම ප්‍රවේශමෙන් සංසන්දනය කරමින්, සුපර් මාර්කට් වැනි විධිමත් වෙළඳපොල විනිවිද යාමේ හැකියාව විමර්ශනය කිරීමට පටන් ගත්තේය.

81

**පිරික්සුම් ලැයිස්තුව - මෙම ක්‍රියාකාරකමෙන් පසු තහවුරු කළ යුතු කරුණු**

- අභ්‍යාසයට සහභාගි වූ කණ්ඩායම් නියෝජිතයන් විසින් වෙළඳපොල සමීක්ෂණයේ ප්‍රතිඵල පිළිබඳව අනෙක් කණ්ඩායම් සාමාජිකයන්ට දැනුම් දී තිබීම.
- මෙවර පවත්වන ලද වෙළඳපොල සමීක්ෂණය ප්‍රායෝගිකයක් ලෙස කරන ලද්දක් බවත්, සත්‍ය වශයෙන් කරන වෙළඳපොල සමීක්ෂණය ගොවීන් විසින්ම රජයේ කිසිදු උපකාරයක් නොමැතිව විටින් විට පැවැත්විය යුතු බව.
- වෙළඳපොල සමීක්ෂණය අතරතුර දී හමු වූ වෙළඳපොල පාර්ශවකරුවන් සමග ඉලක්කගත ගොවීන් සම්බන්ධතා පවත්වා ගෙන යන බව.
- කණ්ඩායමේ නියෝජිතයින්ගේ පිරිමි සහ ගැහැණු අනුපාතය සමතුලිත බව.
- ගොවි කණ්ඩායම සංවිධානය කරන ලද ප්‍රතිපෝෂණ රැස්වීමට සහභාගිවන්නන්ගේ පිරිමි-කාන්තා අනුපාතයේ සමබර බව.

**දෝෂ ගවේෂණය - නිතර ඇතිවන ගැටළු සඳහා විසඳුම්**



ඡායාරූපය: ටකේෂි කුනෝ/ජයිකා කෙන්නියාව

ප්‍ර: **ඉතා කුඩා ප්‍රාදේශීය වෙළෙඳපොළ** - ඉලක්ක ගොවීන්ට ආසන්නයේ ඇති ප්‍රාදේශීය වෙළෙඳපොළ ඉතා කුඩා වන අතර අල සහ ලූණු පමණක් අලෙවි කරයි. වෙළඳපල සමීක්ෂණය පැවැත්වීමෙන් පසුව අලුත් දෙයක් ඉගෙන ගන්න බැරි වූ නිසා ගොවීන් නොසතුටට පත් වී ඇත. මම මේ තත්ත්වය කොහොමද විසඳන්නේ?

පි: කුඩා ප්‍රාදේශීය වෙළෙඳපොළකට පවා ගොවීන්ට ප්‍රයෝජනවත් තොරතුරු බොහෝ දේ ලබා දිය හැකිය. උදාහරණයක් ලෙස, වෙළඳපොල පාර්ශවකරුවන් සමග සුදුසු පරිදි සම්මුඛ සාකච්ඡා කළේ නම්, කන්න අනුව ඉල්ලුම වෙනස් වීම, වාර්ෂික මිල උච්චාවචනය, කන්නය අනුව රදා පවතින නිෂ්පාදනවල සම්භවයේ වෙනස්කම්, කැමති හැඩය, විවිධත්වය, ප්‍රමාණය, ආදිය වැනි තොරතුරු ගොවීන්ට ලබා දිය හැක. ගොවීන්ට නිතිපතා වෙළඳපල සමීක්ෂණ පැවැත්වීමෙන් ප්‍රාදේශීය වෙළඳපල ක්‍රියාකාරීන් සමඟ ඔවුන්ගේ සබඳතා ශක්තිමත් කර ගත හැකිය. එම නිසා, <u>වෙළඳපල සමීක්ෂණය අභ්‍යාසයක් ලෙස කිරීමේ අරමුණින් ළඟම ඇති දේශීය වෙළඳපොළට පැමිණීම සාමාන්‍යයෙන් හොඳ ආරම්භයක් වේ.</u> කෙසේ වෙතත්, උදාහරණයක් ලෙස විශාල නගර අසල විවිධ වෙලඳපොලවල් නැරඹීම වඩාත් ප්‍රයෝජනවත් වනු ඇතැයි ඔබට සහ ගොවීන්ට හැඟේ නම් එසේ කිරීම ද අනුමත කල හැක . වෙළඳපොළ සමීක්ෂණය පැවැත්වීමෙන් පසුව එය එවැනි වෙලඳපොලවල් වලට පැමිණීමේ කාලය සහ ප්‍රවාහන වියදම් වලට වඩා වටිනා බව ඔවුන්ට ඒත්තු යන්නේ නම් අඛණ්ඩව එම වෙළඳපොල වල සමීක්ෂණය පැවැත්වීමට කටයුතු කල හැක. තවත් වැදගත් කරුණක් වන්නේ "වෙළඳපොල" යන්නෙන් භෞතික වෙළඳ ස්ථානයක් අදහස් නොවීමයි. වීදි වෙළෙන්දන් හෝ දේශීය පාසල්, රෝහල්, බන්ධනාගාර වැනි ආයතන වෙළඳපලවල් විය හැකිය. අවට වෙළඳපලවල් එවැනි බොහෝ ප්‍රයෝජනවත් තොරතුරු ලබා නොදෙන බව ගොවීන්ට දැනේ නම්, ඔවුන්ගේ ප්‍රදේශයේ තිබෙන විභව ගැනුම්කරුවන් සම්බන්ධ කර ගැනීමට උත්සාහ කල හැක.


ප්‍ර: **මිල පිළිබඳ තොරතුරු ලබා ගැනීමට අපහසු වීම** - වෙළෙඳපොළේ සිටින වෙළෙන්දෝ සැබෑ විකුණුම් මිල හෝ මිලදී ගැනීමේ මිල පිළිබඳ තොරතුරු ලබා නොදේ. ඔවුන් තමන් ලබන ලාභය ඉතා රහසිගතව තබා ගනී. මිල පිළිබඳ නිවැරදි තොරතුරු ලබා ගැනීමට ක්‍රමයක් තිබේද?

පි: වෙළෙඳුන් තම ලාභය පිළිබඳ තොරතුරු හෙළි කිරීමට මැලිවීම ස්වභාවිකයි. ඒ වෙනුවට ඔබේ ප්‍රශ්න ඔවුන් උපයන මුදල ගැන අවධානය යොමු කරනවාට වඩා, ඔබට උපායශීලීව විශේෂිත නිෂ්පාදනයක වාර්ෂික මිල උච්චාවචනයන් වැනි සාමාන්‍ය ප්‍රශ්න ඇසීමට අවශ්‍ය විය හැකිය. වෙළඳපොලට නිෂ්පාදන මිල දී ගැනීමට එන්නන්ගෙන් (shoppers) ඔබ විමර්ශනය කරන බෝග සඳහා ඒවා වෙලදපොලෙන් මිල දී ගැනීමේ දී කොපමණ මුදලක් ගෙවන්නේ දැයි ඇසීමටද ඔබට හැකියි.

**ප්‍ර: ගොවි කණ්ඩායම තුළ විවිධ මට්ටමේ අභිප්‍රේරණයන්** - වෙළඳපල සමීක්ෂණ අභ්‍යාසය සාර්ථකව නිම කිරීමෙන් පසුව වෙළඳපල ඉල්ලීම් සහ අවශ්‍යතා පිලිබදව කණ්ඩායම් නියෝජිතයින් ඉතා හොඳින් දන්නා අතර , අනෙක් කණ්ඩායම් සාමාජිකයන් අභිප්‍රේරණය වී ඇති බවක් නොපෙනේ. ඒ මන්ද?

පි: කණ්ඩායම් නියෝජිතයින් ඔවුන් වෙළඳපල සමීක්ෂණය අතරතුර ලබාගත් තොරතුරු කණ්ඩායම් අනෙකුත් සාමාජිකයින් සමඟ බෙදාහදා ගත් බව ඔබ සහතික කර ගත්තා ද?. කණ්ඩායම් නියෝජිතයින් විසින් වෙලදපොල සමීක්ෂණයේ දී ලබා ගත් ප්‍රයෝජනවත් තොරතුරු ඒකාධිකාරී ලෙස රදවා තබා නොගෙන අනෙක් සාමාජිකයන්ට බෙදා දීම අනිවාර්ය. කරුණාකර රීතියක් සැකසීම කෙරෙහි සැලකිලිමත් වන්න. උදාහරණයක් ලෙස, එම වෙළඳපල සමීක්ෂණයේදී ඔවුන් සොයාගත් දේ බෙදා ගැනීම සඳහා වෙළඳපල සමීක්ෂණයෙන් සතියකට පසු නියෝජිතයින්, කණ්ඩායම් රැස්වීමක් පැවැත්විය යුතුය.

## තීරුව 4: SHEP වෙළඳපල සමීක්ෂණයේ මූලධර්ම තුන




ස්වාධීනත්වය සහ නිපුණතාවය සඳහා ගොවීන්ගේ මනෝවිද්‍යාත්මක අවශ්‍යතාවන්ට සහාය වීම අවධාරණය කරන්නා වූ ඉතා වැදගත් "මූලධර්ම" තුන SHEP හි වෙළඳපල සමීක්ෂණය මගින් පෙන්නුම් කරයි. මූලධර්ම තුන නම්:


(1) ගොවීන්ගේ තත්වයන්ට ගැලපෙන පරිදි,
(2) ගොවීන්ගේ දෘෂ්ටි කෝණයෙන්,
(3) ගොවීන් විසින්ම

ව්‍යාපාරික අවස්ථා හා විකල්පයන් ගවේශනය කිරීම පිණිස තොරතුරු එකතු කිරීමයි. වෙළඳපල සමීක්ෂණ පිළිබඳ සාම්ප්‍රදායික සංකල්පය මෙන් නොව, SHEP හි වෙළඳපල සමීක්ෂණය වෙළඳපල මිල ගනන් ලබා ගැනීම සඳහා පමණක් නොව, ව්‍යාපාර විභවයන් සහ විකල්පයන් සොයා ගැනීම පිණිසයි.

වෙළඳපල සමීක්ෂණ වල SHEP මූලධර්ම තුන පහත රූපසටහනින් පෙන්වා ඇත. එහි එක් එක් මූලධර්මයට අනුකූල වීම සහ අනුකූල නොවන උදාහරණ විස්තර කර ඇත.



මූලධර්ම තුන අතරින්, සියල්ලටම වඩා වැදගත් සමීක්ෂණ අංගය වන්නේ "ගොවීන් විසින්ම" සමීක්ෂණය පැවැත්වීමයි. ගොවීන්ගේ "ස්වාධීනබව" හා "වෙලදපොල සමීක්ෂණයේ අයිතිය" යන ඒවා SHEP කටයුතු වල සාර්ථකත්වය සඳහා අතිශයින්ම තීරණාත්මක වෙයි.




වෙළඳපල මිල පමණක් නොව බහුමාන වෙළඳපල තොරතුරු රැස් කර ගැනීමට උත්සාහ කරන SHEP හි වෙළඳපල සමීක්ෂණය ඇත්ත වශයෙන්ම සැලසුම් කොට ඇත්තේ වෙළඳපොලට අයත් සැඟවුනු දැනුම අනාවරණය කර ගැනීමටය. සැඟවුනු දැනුම වෙත ප්‍රවේශ වීමට, දැනීමට හා තේරුම් ගැනීමට එබදු සැඟවුනු දැනුම සතු පුද්ගලයන් සමග සංවාදශීලී වීම හා අත්දැකීම් බෙදා ගැනීම අවශ්‍ය වේ. මේ කාරණයේ දී ගොවියන් වෙළඳපොල වෙත ගොස් ඔවුන් විසින්ම, ගැනුම්කරුවන්, අතරමැදියන්, හා වෙළඳ කුටි හිමියන් වැනි වෙළඳපොල ක්‍රියාකාරීන් සමග කෙලින්ම සංවාදයේ යෙදීම හා/හෝ නිරීක්ෂණයේ යෙදීම ඉතා වැදගත්වේ. ගොවීන් ඔවුන් විසින්ම වෙළඳපොල සමීකෂණය පැවැත්වීම වැදගත් වන්නේ ඒ නිසාය.

වෙළඳපොල සමීක්ෂණය සිදු කරන්නේ ඉලක්ක ගොවීන් සඳහා අදාල වන හා ප්‍රයෝජනවත් වන වෙළඳපොල සතු මෙම සැඟවුන දැනුම අනාවරණය කර ගැනීමයි. වෙනත් වචන වලින් පවසතොත්, SHEP වෙළඳපොල සමීක්ෂණය සිදු කරන්නේ ගොවීන් සතු සැඟවුනු දැනුම, වෙළඳපොල සතු සැඟවුනු දැනුම සමග හුවමාරු කර ගැනීම හා ඒවා ප්‍රයෝජනයට ගැනීමටයි. වෙලදපොල සමීක්ෂණ කාර්යාවලියේ දී මෙම දෙයාකාරයේ සැඟවුනු දැනුම් වර්ග එකට ඒකාබද්ධ කොට නව දැනුමක් නිර්මාණය කර ගනී.

මූලධර්ම තුන අනුගමනය කරමින් වෙළඳපල සමීක්ෂණ සාර්ථකව සිදු කළ ගොවීන්ගේ අදහස් කිහිපයක් පහත දැක් වේ.

- අපි සාමාන්‍යයෙන් කරනවාට වඩා කලින් කැරට් අස්වැන්න නෙලා ගත යුතු බව අපට වැටහුණා. කුඩා කැරට් වල වඩා හොඳ රසයක් ඇති අතර විශාල ප්‍රමාණ කැරට් වලට වඩා වැඩි මිලකට විකුණනු ලැබේ.
- උදේ පාන්දරින්ම පිටත තවමත් අඳුර පවතින විට කැරට් අස්වැන්න ලබාගත යුතු බව අපි සොයා ගනු ලැබුවා . ඒ ආකාරයට අස්වැන්න නෙළන විට කැරට් දිගු කාලයක් පවතී. එවැනි කැරට් මිලදී ගෙන අපට වඩා හොඳ මිලක් ලබා දීමට ගැනුම්කරුවන් කැමැත්තෙන් සිටිති.
- නිෂ්පාදන වෙළෙඳපොළට කන්නය පුරා නිරන්තරයෙන් සැපයීම, ඒවා විශාල ප්‍රමාණය වශයෙන් එක් වරකට සැපයීමට වඩා අවදානම් අඩු බව අපි අවබෝධ කරගෙන තිබේ.



ඡායාරූපය කෙන්නියාව

- සහතික කළ බීජ සහ දෙමුහුන් බීජ මඟින් වඩා හොඳ තත්ත්වයේ එළවළු නිෂ්පාදනය කළ හැකි බව අපට ඒත්තු ගොස් ඇත. ඒ කියන්නේ අපිට ඒවා වැඩි මිලකට විකුණන්න පුළුවන්.

- පැළ සිටුවීමේ කාලය වැදගත් බව අපි තේරුම් ගනිමු. අපි නියම වේලාවට බීජ සිටුවිය යුතුයි, එසේත් නැතිනම් ඉක්මනින් පරිණත වන ප්‍රභේදවල බීජ භාවිතා කළ යුතු අතර එමඟින් අපට ඉල්ලුම උපරිම මාසවලදී අස්වැන්න ලබා ගත හැකිය.

- තොග වෙළඳපොලේ දී, දිගු රාක්ක ආයු කාලයක් (long shelf-life) ඇති විවිධ ගෝවා වර්ග වලට වඩාත් කැමති බව අපි සොයා ගත්තෙමු. ඊට වෙනස්ව, කෙටි රාක්ක ආයු කාලයක්(short self-life) තිබුණත්, පැණිරස හා ඉස්ම සහිත (succulent) සලාද වලට වඩාත් සුදුසු ගෝවා වර්ගයකට සිල්ලර වෙළඳපොලේ වැඩි කැමැත්තක් පවතී .

- වෙළඳපොල සමීක්ෂණය අතරතුර අපට අතරමැදියෙකු හමු විය. අතරමැදියා කැමති අර්තාපල් වල ප්‍රමාණය ගැන අපි තොරතුරු ලබා ගත්තේය. ඉන්පසු අතරමැදියා අපගේ අර්තාපල් ඉහළ මිලකට මිලදී ගැනීම සඳහා අපගේ ගොවිපලට නිතිපතා එන්න පටන් ගත්තේය.

- විවිධ කෙසෙල් නිෂ්පාදන අතරින්, මෙම ප්‍රදේශයේ වඩාත් ජනප්‍රිය වූයේ කෙසෙල් බිස්කට් බව අපි අවබෝධ කර ගත්තෙමු. ඊට පසුව, දැනට වෙළෙඳපොලේ නැති කුඩා කෙසෙල් බිස්කට් පැකේජයක් නිෂ්පාදනය කිරීමට අපි පටන් ගත්තෙමු. පැකේජය අපගේ කණ්ඩායමට අයත් ගබඩාවේ වැඩියෙන්ම විකුණුනු අයිතමය බවට පත් විය. බොහෝ ප්‍රාදේශීය ළමයින් මෙම බිස්කට් පැකේජයට කැමත්තක් දක්වන ලදී.




ඡායාරූපය කෙන්නියාව

- සිල්ලර වෙළෙන්දා අපට පවසා සිටියේ සුළු පරිමාණ ගොවීන්ගේ ගොවිබිම් වලට නිෂ්පාදන මිල දී ගැනීම සඳහා ගිය විට, ඔහුන් බෝග වාහන වලට පටවා ගැනීමට උදව් නොකරන නිසා සුළු පරිමාණ ගොවීන්ගෙන් බෝග නිෂ්පාදන මිල දී ගැනීමට ඔහුට අවශ්‍ය නොවන බවයි. අනෙක් අතට, මධ්‍යම පරිමාණ හා මහා පරිමාණ ගොවීන්ගේ ගොවිබිම් වලට ගිය විට හැම විටම උදව් කිරීමට කෙනෙකුන් ලබා දෙයි. මෙම කතාන්දරයට සවන් දීමෙන් අනතුරුව, මෙම සිල්ලර වෙලළන්දා බෝග මිල දී ගැනීමට පැමිණි විට කණ්ඩායම් සාමාජිකයින් කීප දෙනෙකු පැටවීමේ කාර්යයට උදව්වට යෙදවීමට කටයුතු කරන ලදී. සිල්ලර වෙලෙන්දා දැන් අපෙන් බෝග මිල දී ගනියි.

සමහරුන්ට, ඉහත පෙන්වා ඇති පරිදි වෙළඳපල සමීක්ෂණයේදී ගොවීන් ලබාගත් තොරතුරු නොවැදගත් ලෙස පෙනෙන්නට පුළුවන. කෙසේ වෙතත්, ඔබ තොරතුරුවල ස්වභාවය දෙස සමීපව බැලුවහොත්, ගොවීන් ලබා ගන්නා තොරතුරු ගොවීන්ට (1) වහාම සහ (2) අවම අතිරේක සම්පත් භාවිතා කල හැකි බව ඔබට වැටහේ. එබැවින් එවැනි තොරතුරු ගොවීන් සඳහා කුඩා සාර්ථකත්වයන් සඳහා පහසුවෙන්ම හේතු විය හැක. කාලයත් සමඟ විශාල ඉලක්ක කරා ළඟා වීමට කුඩා වර්ධක සාර්ථකත්වයන් වැදගත් වේ.

ගොවීන්ගේ කුඩා කුඩා
සාර්ථකත්වයන් එකතු වීමෙන්
විශාල සාර්ථකත්වයකට
මග පෑදෙයි



# වෙලදපොල සමීක්ෂණ ප්‍රශ්ණාවලිය

දිනය:
දිස්ත්‍රික්කයේ නමt: ග්‍රාම සේවා කොට්ටාශයේ නම:
ගොවි කංඩායමේ නම:
වෙලදපොල සමීක්ෂණය පැවැත්වූයේ (ගොවි නියෝජිතයින්ගේ නම්) :

| වෙලෙන්දා ගේ නම හා සම්බන්ධ තා විස්තර | නිෂ්පාද නය හා ප්‍රෙභේදය | නිස්පාදන ගුණාත්මය හා වෙලදපොල අවශ්‍යතා | ඊහලම ඉල්ලුම (මාස) | සැපයුම් ප්‍රමාණය හා කාලාන්ත රය (දිනපතා හා සතිපතා) | ඒකකය ක (කි ග් ) මිල | ගෙවීම් කරන ආකාර ය | ගෙවීම් කොන්දේ සි | අලෙවි අභියෝග | කංඩාය මෙන් නිෂ්පාදන මිල දී ගැනීමට වෙලෙ න්දාගේ කැමැත්ත |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

# වෙළඳපොළ සමීක්ෂණ ප්‍රශ්ණාවලිය

දිනය:
දිස්ත්‍රික්කයේ නමt: ග්‍රාම සේවා කොට්ඨාශයේ නම:
ගොවි කංඩායමේ නම:
වෙළඳපොළ සමීක්ෂණය පැවැත්වූයේ (ගොවි නියෝජිතයින්ගේ නම්) :

| වෙළෙන්දාගේ නම හා සම්බන්ධතා විස්තර | නිෂ්පාදනය හා ප්‍රභේදය | නිෂ්පාදන ගුණාත්මය හා වෙළඳපොළ අවශ්‍යතා | ඉහලම ඉල්ලුම (මාස) | සැපයුම් ප්‍රමාණය හා කාලාන්තරය (දිනපතා හා සතිපතා) | ඒකකයක (කි ග්) මිල | ගෙවීම් කරන ආකාරය | ගෙවීම් කොන්දේසි | අලෙවි අභියෝග | කංඩායමෙන් නිෂ්පාදන මිල දී ගැනීමට වෙළෙන්දාගේ කැමැත්ත |
|---|---|---|---|---|---|---|---|---|---|
| ගුණතිලක මයා (0722----------) | තක්කාලි (ඕනෑම විශේෂයක්) | මධ්‍යම ප්‍රමාණය අර්ධ වශයෙන් ඉදුණු | මාර්තු, අප්‍රේල්, මැයි | කි.ග්.1000/ සතියට | ඩොලර් 1 | මුදල් | මුදල් ගෙවා භාර දීම | ප්‍රමාණවත් නොවන ගබඩා පහසුකම් | කැමැත්තෙන් |
| බණ්ඩා මයා (0762------) | තක්කාලි (කැල් ජේ) | ප්‍රමාණයෙන් විශාලයි. අර්ධ වශයෙන් ඉදුණු | පෙබරවාරි, මාර්තු | කි.ග්.2500/ සතියට | ඩොලර් 1.2 | මුදල් | සති දෙකකට පසු භාරදීම | ප්‍රමාණවත් නොවන ගබඩා පහසුකම් | කැමැත්තෙන් |
| කමලා මිය (0772-----) | තක්කාලි (කැල් ජේ) | මධ්‍යම ප්‍රමාණය අර්ධ වශයෙන් ඉදුණු | දෙසැම්බර්, ජනවාරි | කි.ග්.2500/ සතියට | ඩොලර් 1.15 | මුදල් | සතියකට පසු භාරදීම | කිසිවක් නැත | අකැමැත්තෙන් |

## පියවර 3. -ගොවීන් විසින් තීරණ ගැනීම:

පියවර 2 හි ව්‍යාපාරික අවස්ථා අවබෝධ කර ගැනීමෙන් පසුව, 03 වන පියවර වෙත ගොවීන් යොමු කල යුතු අතර එහිදී ඔවුන් තම උද්‍යාන බෝග ව්‍යාපාර පිළිබඳ වැදගත් තීරණ ගනී. කුමන බෝග, කුමන වේලාවක, කුමන ප්‍රමාණයකින් සහ කුමන ගුණාත්මකභාවයෙන් වගා කළ යුතුද යන්න පිළිබඳ ඔවුන්ගේ සැලැස්මේ තීරණවලට ඇතුළත් වන අතර ගනු ලබන තීරණ කණ්ඩායමේ එකගතාවය සහ සාමූහිකත්වය මත පදනම් වේ. කාර්යක්ෂම නිෂ්පාදනය සහ අලෙවිකරණය සඳහා පහසුකම් සැලසීමේ ක්‍රියාමාර්ග පිළිබඳව ගොවි කණ්ඩායම් සාමාජිකයන් සාකච්ඡා කර එකඟ වනු ඇත. SHEP ක්‍රියාත්මක කරන්නන්ගේ කාර්යභාරය වන්නේ ගොවීන් වෙනුවෙන් තීරණ ගැනීම නොව, ගොවීන්ට නිවැරුදි තීරණ ගැනීම සඳහා උදව් කිරීමයි. ක්‍රියාත්මකකරන්නන් විසින් ඒ සඳහා කල යුත්තේ හා කෘෂිකර්මය පිලිබඳ සුදුසු මගපෙන්වීම් සහ විශේෂඥ ඥාණය ගොවීන් වෙත ලබා දීමයි.

## 3.*1 ඉලක්ක ගත බෝග තේරීම*

| පියවර 4 | කටයුතු |
|---|---|
| **1. ගොවීන් සමඟ ඉලක්කය බෙදා ගැනීම.** | සංවේදීකරණ වැඩමුළුව |
| **2. ගොවීන් දැනුවත් කිරීම.** | සහභාගීත්ව මූලික සමීක්ෂණය<br>-පාර්ශවකරුවන්ගේ රැස්වීම/සංසදය (අනිවාර්ය නොවේ)<br>වෙළඳපල සමීක්ෂණය |
| **3. ගොවීන් තීරණ ගැනීම.** | **ඉලක්කගත බෝග තේරීම** (අපි මෙතැන)<br>බෝග කැලැන්ඩර සෑදීම |
| **4. ගොවීන් කුසලතා ලබා ගැනීම.** | ක්ෂේත්‍රයේ පුහුණුවීම් |
| පසු විපරම් සහ අධීක්ෂණය (සහභාගී අවසාන සමීක්ෂණය ඇතුළුව) | |

### ඇයි? - අරමුණු

ඉලක්කගත බෝග තෝරාගැනීමේදී වෙළඳපල තුල ඉහල ඉල්ලුමක් පවතින විශේෂිත බෝග වර්ග පිළිබඳව ගොවි කණ්ඩායම් මගින් සාමූහිකව හඳුනාගත හැකි වන පරිදි සිදු කෙරේ. හදුනා ගත් බෝග කණ්ඩායමක් ලෙස නිෂ්පාදනයට හා අලෙවිය සිදු කිරීමට ගොවීන් එකග වේ.

### කුමක්ද ? දළ සටහන

ගොවි කණ්ඩායම් විසින් සිදු කරන ලද වෙළඳපල සමීක්ෂණයේ දත්ත මත පදනම්ව ඉලක්කගත උද්‍යාන බෝග තෝරා ගැනීම සිදු කරයි. ගොවීන් ඔවුන්ගේ කැමැත්ත අනුව වගා කල යුතු බෝග පිළිබඳ කණ්ඩායම් තුල සාකච්ඡා කර එකඟතාවයක් ගොඩ නඟා ගනී. බෝග තෝරා ගැනීමේ ක්‍රියාවලියේදී ව්‍යාප්ති කාර්ය මණ්ඩලය, බෝග නිෂ්පාදනය ක්‍රියාවලියේ විශේෂඥයෙකු ලෙස අවශ්‍ය මග පෙන්වීම කණ්ඩායම වෙත සිදු කරනු ලබයි.

## කෙසේද?- ක්‍රියාත්මක කිරීමේ ඉඟි




- විශේෂයෙන් වෙළඳපල සමීක්ෂණය හා පෙර සිදුකරන ලද SHEP ක්‍රියාකාරකම් පදනම් කර ගනිමින් ගැඹුරින් සාකච්ඡා කර අනාගත කෘෂිකාර්මික අවස්ථා හා ඉලක්ක ගත බෝග ගැන තීරණ ගැනීම කර සිදු කරයි.
- ගොවීන්ට ඉලක්ක ගත බෝග තෝරා ගැනීම සඳහා වඩාත් සුදුසු තීරණ ගැනීමට හැකියාව ලැබෙන පරිදි විශේෂයෙන් අදාල ප්‍රදේශයට අයත් කෘෂි-පාරිසරික කලාපයට ගැලපෙන බෝග තෝරා ගැනීමට ව්‍යාප්ති කාර්ය මණ්ඩලය අවශ්‍ය උපදෙස් හා යෝජනා ලබා දෙයි.

## පියවර - ක්‍රියාත්මක කිරීමේ ක්‍රියා පටිපාටි (අවශ්‍ය කාලය: පැය 2-3)

1. ගොවි කණ්ඩායමේ රැස්වීමක් සංවිධානය කර, හැකියාවක් පවතී නම්., සාමාජිකයින්ට මෙන්ම ඔවුන්ගේ කලත්‍රයන්ටද (බිරිඳ/සැමියා) ආරාධනා කරන්න. *ඉඟිය! සාමාජිකයින්ගේ කලත්‍රයන් එළවළු නිෂ්පාදන ක්‍රියාවලියේ ප්‍රබල කොටස් කරුවන් වන බැවින් රැස්වීමට ඔවුන්ට ආරාධනා කිරීම තුළින් ඵලදායි තීරණ ගැනීම සඳහා පහසු වේ.*

2. වෙලදපොල සමීක්ෂණයෙන් ලබා ගත් තොරතුරු සාකච්ඡා කර ඉලක්ක බෝග තෝරා ගැනීමේ පත්‍රිකාව සම්පුර්ණ කිරීමට ගොවි කණ්ඩායමට අවස්ථාව ලබා දෙන්න.*ඉඟිය! අදාල පත්‍රිකාව පිරවීමේදී මූලික සමීක්ෂණයේ හා වෙළඳපල සමීක්ෂණයේ ප්‍රතිපල ලේඛන ගොවීන් අත තිබිය යුතු අතර ඔවුන් විසින් ඒවා අධ්‍යනය කර තිබීම අවශ්‍ය වේ.*

3. ඉලක්කගත බෝගයක් ලෙස ලැයිස්තුගත බෝග තෝරාගැනීමේ වාසි සහ අවාසි පිළිබඳව ගොවි කණ්ඩායම සාකච්ඡා කරයි. මෙම ඉලක්කගත බෝග වගා කිරීමට පහසු විය යුතුය. එමෙන්ම මේවා ප්‍රදේශයට උචිත විය යුතු අතර වගා කිරීමට අවශ්‍ය තාක්ෂණයන් පහසුවෙන් ලබා ගත හැකි විය යුතුය. *ඉඟිය! තම ලාභය මත පමණක් බෝග තෝරා නොගත යුතු අතර එහිදී බෝග තෝරාගැනීම සඳහා නිෂ්පාදන යෝග්‍යතාවය හා තාක්ෂණික ව ඇති විය හැකි තත්වයන් පිළිබඳව ව්‍යාප්ති කාර්යය මණ්ඩලය විසින් උපදෙස් ලබා දිය යුතුය.*

4. එක් එක් කණ්ඩායම් සාමාජිකයන් තම තමන් කැමැති බෝග සඳහා ඡන්දය දමනු ඇත (රහස් ඡන්දයක්). ඔහු/ඇය කැමැති 1 වැනි බෝගයේ හා 2 වැනි බෝගයේ නම් ඡන්ද පත්‍රිකාවේ ලියන්න. කණ්ඩායමේ සාමාජිකයන් අතර එකගතාවයක් ඇති කර ගැනීමට නම් ඡන්දය දීමේ ක්‍රියාවලිය සඳහා බහුතරයක් එනම් බොහෝ විට 70% කට වඩා සහභාගි වියුතුය. ඊ ලගට 2 වැනි බෝගය සදහා ද ඉහත ක්‍රියා පටිපාටිය නැවත අනුගමනය කල යුතුය. එක් එක් බෝගයට ලැබුනු ඡන්ද ගණන අනුව බෝග ශ්‍රේණි ගත කර 2 වැනි හා 3 වැනි බෝග තෝරන්න. <u>*ඉගිය! කණ්ඩායම් නායකයන්, වැඩිහිටියන්, හා උගත් සාමාජිකයන් වැනි බලවත් පුද්ගලයන් කණ්ඩායම් තීරණයට බලපෑම් නොකරන බවට ව්‍යාප්ති කාර්යය මණ්ඩලය වග බලා ගත යුතුය.*</u>




ඡායාරූපය මලාවි

## ආකෘතිය - ඉලක්කගත බෝග තෝරා ගැනීමේ පත්‍රිකාව

ඉලක්කගත බෝග තෝරා ගැනීමේ පත්‍රිකාව පහත පරිදි වේ. වෙළඳපල සමීක්ෂණයේ ප්‍රතිපල මත විශ්ලේෂණය කළ යුතු බෝග/ප්‍රභේද සංඛ්‍යාව තීරණය වේ. එහිදී වෙළඳපල සමීක්ෂණය තුලින් තෝරා ගන්නා ලද සියලු බෝග සඳහා විශ්ලේෂණය කිරීමට ගොවීන්ට වැඩි කාලයක් ගතවන අතර එවන් අවස්තාවක අදාල බෝග අතරින් වඩාත් ගැලපෙන බෝග කීපයක් සඳහා සවිස්තරාත්මක විශ්ලේෂණයක් සිදු කරන්න . කෙසේ වෙතත් ගතවන කාල සීමාව පිලිබඳ සැලකිලිමත් වන්න.

## ඉලක්ක බෝග තේරීමේ පත්‍රිකාව

දිනය:_____/_____/______

දිස්ත්‍රික්කයේ නම:______________________________ ග්‍රාම සේවා කොට්ඨාශයේ නම:______________________________

ගොවි කංඩායමේ නම:________________________________________

| බෝගය/ ප්‍රභේදය | පාරිබෝජනය කරන්නේ ප්‍රාදේශීය අයද වෙනත් අයද | බෝගය වගා කිරීමේ පලපුරුද්ද | සිටුවන මාසය/ මේරීමේ කාලය | ප්‍රධාන නිෂ්පාදන අභියෝග | අපේවි කල හැකි සාමාන්‍ය අස්වැන්න (කි ග්/හෙක්) | සාමාන්‍ය ඒකක මිල (රු/කි ග්) | මුලු ආදායම (රු) | නිෂ්පාදන වියදම (රු/හෙක්) | ඇස්තමේන්තු කල ශුද්ද ආදායම (රු/හෙක්) | ප්‍රධාන වෙලදපොල (වල්) | අපේවි කොන්දේසි | වෙනත් | ශ්‍රේණිගත කිරීම Ranking |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |

## නවෝත්පාදනය - විවිධ රටවල්/ කලාපවල අභිරුචිකරණය

ඉලක්කගත බෝග තෝරා ගැනීමේදී විවධ රටවල හා කලාප වල භාවිතා කල විවිධ උපක්‍රමයන් සඳහා උදාහරණ පහත දක්වා ඇත.

**කොටුව 16**

**කොටුව 15 වෙනස් කන්න දෙකක් සඳහා ඉලක්කගත බෝග තෝරා ගැනීම**

### වෙනස් කන්න දෙකක් සඳහා ඉලක්කගත බෝග තෝරා ගැනීම (රුවන්ඩාව)

<ඇයි?> එළවළු වගාව සඳහා රුවැන්ඩාවේ ප්‍රධාන කන්න දෙකක් ඇති අතර එම කන්න දෙක තුල වගා කරන බෝග එකිනෙකට බොහෝ වෙනස් වේ

<කොහොමද?> කන්න දෙක සඳහා ගැලපෙන ඉලක්කගත බෝග තෝරා ගන්නා ලෙස ක්‍රියාත්මක කරන්නන් විසින් ගොවි කණ්ඩායමට පවසන ලදී.



ඡායාරූපය රුවැන්ඩාව

<ප්‍රතිඵල?> කන්න දෙක සඳහා වඩාත් ගැලපෙන බෝග තෝරා ගැනීමට ගොවීන්ට හැකි වුනා දැන් ඔවුන්ට පෙරට වඩා හොඳින් සැලසුම් කළ හැකිය.

## box16 බෝග නිෂ්පාදන අය වැය සකස් කිරීම

### බෝග නිෂ්පාදන අය වැය සකස් කිරීම (පලස්තීනය)

<ඇයි?> නිවැරදි ව ඉලක්ක ගත බෝග තෝරා ගැනීම සඳහා ප්‍රධාන බෝග කීපයක් වගා කිරීමෙන් ලැබෙන ලාභය පිලිබඳ සවිස්තරාත්මකව දැන ගැනීමට ගොවීන්ට අවශ්‍ය විය.

<කෙසේද?> ව්‍යාප්ති කාර්ය මණ්ඩලයේ සහයෝගය ඇතිව ගොවීන්ගේ සාක්ෂරතාවය හා ගණිතමය හැකියාව පදනම් කර ගෙන ප්‍රධාන බෝග කීපයක් සඳහා, බෝග විශේෂිත ලාභදායිතා විශ්ලේෂණයක් වන්නාවූ ආදායම හා වියදම ගණනය කරන ලද අතර අය-වැය ගණනය කිරීම කරන ලදී.



ඡායාරූපය පලස්තීනය

<ප්‍රතිඵල?> නිවැරදි ඉලක්කගත බෝග තෝරා ගැනීම පිළිබඳව ගොවීන් වැඩි විශ්වාසයක් ඇති කර ගත්හ. ගණනය කිරීමේ අභ්‍යාසය ගොවීන්ගේ ව්‍යාපාර කළමනාකරණ කුසලතා ද වැඩි දියුණු කළේය.

**පිරික්සුම් ලැයිස්තුව - ක්‍රියාකාරකමෙන් පසු තහවුරු කළ යුතු කරුණු**

- ගොවීන් ඉලක්කගත බෝග තෝරා ගැනීමේ ක්‍රම තේරුම් ගෙන ඇති බව.
- වගා කිරීමට බෝග තෝරාගැනීමේදී ලාභදායිත්වය පමණක් නොව කෘෂි-පාරිසරික තත්වයන් මෙන්ම ඔවුන්ගේ තාක්ෂණික කුසලතා සහ මූල්‍ය හැකියාවන් ද සැලකිල්ලට ගත යුතු බව ගොවීන් තේරුම් ගෙන තිබීම.
- ගොවි කණ්ඩායම් සිදු කල ඉලක්කගත බෝග තෝරා ගැනීමේ ක්‍රියාවලිය අනාගතයේදී ද ඔවුන් විසින්ම සිදු කිරීමට එකඟ වී තිබෙන බව
- සහභාගිවන්නන්ගේ කාන්තා හා පිරිමි අනුපාතය සමතුලිතබව.
- තීරණ ගැනීමේ දී පිරිමි සහ කාන්තා සාමාජිකයින්ගේ සහභාගීත්වයේ ගුණාත්මය සහතික කෙරෙන බව.
- සාමාජිකයින්ගේ කලත්‍රයන් තීරණ ගැනීමේදී සම්බන්ධ වන බව (විකල්පයකි).

**දෝෂ නිරාකරණය - නිතර ඇතිවන ගැටළු සඳහා විසඳුම්**

ප්‍ර: **සමාන ඡන්ද ලැබීම** - ඉලක්කගත බෝග කිහිපයකට සමාන ඡන්ද සංඛ්‍යාවක් ලැබෙන්නේ නම් මා කළ යුත්තේ කුමක්ද?

පි: සමාන ඡන්ද ලැබුණු බෝග සඳහා පමණක් නැවත ඡන්දය ලබා දීමට ගොවීන්ට අවස්ථාව ලබා දෙන්න .

ප්‍ර: **අධි සැපයුම ගැන සැලකිලිමත් වීම** - දේශීය වෙළඳ පොලට අධි සැපයුමක් ඇතිවීම හේතුවෙන් මිල පහළ යාමේ අවදානමක් ඇති නිසා ඉලක්ක ගත බෝග ලෙස බෝග දෙක තුනක් තෝරා ගැනීමට මට බියක් දැනෙනවා.

පි: අදාල බෝගයන් පිළිබඳ සියලු තොරතුරු හා ඉලක්ක ගත වෙළපොළ සඳහා කොතරම් ප්‍රමාණයක් අවශ්‍ය වෙනවද යන්න වෙළඳපල සමීක්ෂණය තුලින් ගොවීන් දැන ගන්නා ලදී. එම නිසා යම් අවස්ථාවක දී යම්කිසි වෙළඳපොලට කොපමණ ප්‍රමාණයක් සැපයුවහොත් වැඩිවෙනවා ද තීරණය කිරීමට ගොවීන්ට හැකියාව ලැබෙනවා.

ප්‍ර: **තෝරා නොගත් බෝග** - ගොවි කණ්ඩායම විසින් තෝරා නොගන්නා ලද බෝග වගා කිරීමට අවස්ථව ලබා දෙනවා දැයි විමසන ලදී, මගේ පිළිතුර විය යුත්තේ කුමක්ද?

පි: ඉලක්කගත බෝග තෝරා ගැනීමෙන් ගොවීන්ට ඉහල මට්ටමේ බෝග නිෂ්පාදන පුහුණුවක් ව්‍යාප්ති කාර්යය මණ්ඩලයෙන් ලබා ගත හැකියි. එමෙන්ම ගොවි කණ්ඩායමට තෝරා ගන්නා ලද බෝග සඳහා සමුහ අලෙවිකරණයක් සැලසුම් කර ගත හැකි ය. ගොවීන්ට තම කැමැත්ත පරිදි ඕනෑම බෝගයක් වගා කිරීමට නිදහස තිබෙන අතර එවන් අවස්ථා වලදී ඉලක්ක බෝග විශේෂිත පුහුණු හා සමුහ අලෙවිකරණ අවස්ථා නොලැබේ.

# ඉලක්ක බෝග තේරීමේ පත්‍රිකාව

දිනය:______/______/________

දිස්ත්‍රික්කයේ නම:________________________________ ග්‍රාම සේවා කොට්ඨාශයේ නම:________________________________

ගොවි කංඩායමේ නම:____________________________________________

| බෝගය/ ප්‍රභේදය | පාරිබෝජනය කරන්නේ ප්‍රාදේශීය අයද වෙනත් අයද | බෝගය වගා කිරීමේ පලපුරුද්ද | සිටුවන මාසය/ මේරීමේ කාලය | ප්‍රධාන නිෂ්පාදන අභියෝග | අලෙවි කල හැකි සාමාන්‍ය අස්වැන්න (කි ග්/හෙක්) | සාමාන්‍ය ඒකක මිල (රු/කි ග් ) | මුලු ආදායම (රු) | නිෂ්පාදන වියදම (රු/හෙක්) | ඇස්තමේන්තු කල ශුද්ධ ආදායම (රු/හෙක්) | ප්‍රධාන වෙළදපොල (වල්) | අලෙවි කොන්දේසි | වෙනත් | ශ්‍රේණිගත කිරීම Ranking |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |

# ඉලක්ක බෝග තේරීමේ පත්‍රිකාව

දිනය:______/______/________

දිස්ත්‍රික්කයේ නම:______________________________ ග්‍රාම සේවා කොට්ඨාශයේ නම:______________________________

ගොවි කණ්ඩායමේ නම:________________________________________

| බෝගය/ ප්‍රභේදය | පාරිබෝජනය කරන්නේ ප්‍රාදේශිය අයද වෙනත් අයද | බෝගය වගා කිරීමේ පලපුරුද්ද | සිටුවන මාසය/ මේරීමේ කාලය | ප්‍රධාන නිෂ්පාදන අභියෝග | අපේක්ෂිත කල හැකි සාමාන්‍ය අස්වැන්න (කි ග්/හෙක්) | සාමාන්‍ය ඒකක මිල (රු/කි ග්) | මුලු ආදායම (රු) | නිෂ්පාදන වියදම (රු/හෙක්) | ඇස්තමේන්තු කල ශුද්ධ ආදායම (රු/හෙක්) | ප්‍රධාන වෙළඳපොළ (වගී) | අපේක්ෂිත කොන්දේසි | වෙනත් | ශ්‍රේණි ගත කිරීම Ranking |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කැරට් | ඔව් | ඔව් | මාර්තු/ජූලි මාස 3 | කැරට් රෝස් ශ්‍රේණි (මුල් සඳහා බිහසංත පළිබෝධ | 10 000 | 0.20 | 2000 | 825 | 1175 | X වෙළඳපොළ<br>Y වෙළඳපොළ | X වෙළෙඳපොළ: 300kg මිලදීගනිත්දා<br>Y වෙළෙඳපොළ: 200kg සඳහා | කුඩා ඒකකවල ගම් තුළ විකිණිය හැකිය. රෝග ප්‍රතිරෝධී | 3 |
| ගිනිපි | ඔව් | ඔව් | මාර්තු මාස 3 | ඉහළ පිරිවැය කිස් වලින් | 22 500 | 0.15 | 3375 | 1000 | 2375 | Y වෙළඳපොළ<br>Z වෙළඳපොළ | Y වෙළෙඳපොළ: 500kg සඳහා<br>Z සිල්ලර වෙළෙන්දා: 100kg මිලදා | Z සිල්ලර වෙළෙන්දා නොබිඳලව පැමිණේ. | 1 |
| බණ්ඩි | ඔව් | ඔව් | පෙබරවාරි/ජූනි මාස 1 | කිසිවක් නැත | 5000 | 0.10 | 500 | 75 | 425 | X වෙළඳපොළ<br>Y වෙළඳපොළ | X වෙළෙඳපොළ: 600kg මිලදීගනිත්දා<br>Y වෙළෙඳපොළ: 400kg සඳහා | පහසුවෙන් විකා කල හැකිය. | |

## 3.2. *බෝග කැලැන්ඩර සෑදීම*

| පියවර 4 | කටයුතු |
|---|---|
| **1. ගොවීන් සමඟ ඉලක්කය බෙදා ගැනීම.** | සංවේදීකරණ වැඩමුළුව |
| **2. ගොවීන් දැනුවත් කිරීම.** | සහභාගීත්ව මූලික සමීක්ෂණය<br>-පාර්ශවකරුවන්ගේ රැස්වීම/සංසදය (අනිවාර්ය නොවේ)<br>වෙළඳපල සමීක්ෂණය |
| **3. ගොවීන් තීරණ ගැනීම.** | ඉලක්කගත බෝග තේරීම<br>**බෝග කැලැන්ඩර සෑදීම** අපි මෙතැන |
| **4. ගොවීන් කුසලතා ලබා ගැනීම.** | ක්ෂේත්‍රයේ පුහුණුවීම් |
| පසු විපරම් සහ අධීක්ෂණය (සහභාගී අවසාන සමීක්ෂණය ඇතුළුව) | |

**ඇයි? - අරමුණු**


බෝග කැලැන්ඩර සෑදීම මඟින් පෙර ක්‍රියාකාරකම්වලදී තෝරාගත් ඉලක්කගත බෝග නිෂ්පාදනය සහ අලෙවිය යන දෙඅංශයෙන්ම කණ්ඩායමක් ලෙස අනාගත ක්‍රියාමාර්ග සැලසුම් කිරීමට ගොවි කණ්ඩායමට හැකියාව ලැබේ.

**කුමක් ද? දළ සටහන**

ගොවි කණ්ඩායම් තමන් කලින් තෝරාගත් ඉලක්කගත බෝග කෙරෙහි අවධානය යොමු කරමින් කණ්ඩායමක් ලෙස වාර්ෂික නිෂ්පාදන සැලැස්මක් මෙන්ම අලෙවිකරණ කටයුතු සඳහා ද සැලැස්මක් සකස් කරයි. මෙම සැලැස්මට බෝග නිෂ්පාදනය සහ අලෙවි කිරීම සඳහා ගත යුතු සාමූහික ක්‍රියාමාර්ග මෙන්ම කණ්ඩායම්වල ගොවිතැන් ව්‍යාපාරයට පහසුකම් සපයන අනෙකුත් කණ්ඩායම් ක්‍රියාකාරකම් ඇතුළත් වේ.


## කෙසේද? - ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ඉඟි

- ඉලක්කගත බෝග සඳහා නිශ්චිත වාර්ෂික නිෂ්පාදන සහ අලෙවිකරණ සැලැස්මක් සකස් කිරීම තුළින් තිරසාර ගොවිතැන් ව්‍යාපාර සාක්ෂාත් කර ගැනීම සඳහා හොඳම ක්‍රමය ගොවි කණ්ඩායම් සාකච්ඡා කර තීරණය කරයි. උද්‍යාන බෝග වගාවෙන් වැඩි ආදායමක් උපයා ගැනීමට පහසුකම් සැලසෙන කණ්ඩායමක් ලෙස සිදු කළ යුතු අනෙකුත් ක්‍රියාකාරකම් ද සැලැස්මට ඇතුළත් වේ (රූපය 7).




- ව්‍යාප්ති කාර්ය මණ්ඩලය ගොවි කණ්ඩායමේ වත්මන් ධාරිතාව සැලකිල්ලට ගනිමින් සැලැස්ම යථාර්ථවාදී සහ ළඟා කර ගත හැකි බව සහතික කරයි.

**බෝග කැලැන්ඩර කණ්ඩායම් වැඩ සඳහා අක්ෂයක් ලෙස:**




**පියවර - ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාපටිපාටි (අවශ්‍ය කාලය: පැය 2-3)**

1. බෝග කැලැන්ඩරයේ ආකෘතියට අනුව, ගොවී කණ්ඩායම් තම ඉලක්ක ගත බෝග සම්බන්ධයෙන් කිරීමට අවශ්‍ය වෙනස්කම් පළමුවෙන්ම තීරණය කරනු ලබයි. නිෂ්පාදනය හා අලෙවිය යන අංශ දෙකේම කලයුතු වෙනස්කම් වලට බෝග/ප්‍රභේද, ගුණාත්මය, ප්‍රමාණය, අස්වනු නෙලන කාලය, ගැනුම්කරුවන් සහ ඇසුරුම් වැනි වෙනත් දේවල් වෙනස්කිරීම් හෝ/හා වැඩිදියුණු කිරීම් ඇතුලත් වේ.

2. ගොවීන් විසින් ඉටු කර ගැනීමට අවශ්‍ය වෙනස්කම් තීරණය කිරීමෙන් පසුව (1) නිෂ්පාදනය (2) අලෙවිකරණය හා ව්‍යාපාර කළමනාකරණය සහ (03) අනෙකුත් කණ්ඩායම් ක්‍රියාකාරකම් යන කරුණු ඔස්සේ ඉලක්ක ගත බෝග පදනම් කරගෙන මාසිකව සිදු කල යුතු ක්‍රියාකාරකම් සඳහන් කරමින් වාර්ෂික සැලස්මක් ගොවි කණ්ඩායම් විසින් සකසනු ලබයි. <u>*ඉඟිය! ව්‍යාප්ති කාර්ය මණ්ඩලය විසින් ගොවි කණ්ඩායම්වලට ඔවුන් පෙර සිදු කරන ලද SHEP ක්‍රියාකාරකම් අතරතුර දී ඉගෙන ගත් වෙළඳපල තොරතුරු, වාර්තා තබා ගැනීමේ කුසලතා ආදිය පිළිබඳ සිහිපත් කර ගැනීමට උපකාර කරයි. එමගින් ගොවීන්ට එම ලබා ගත් දැනුම භාවිතා කර වඩාත් සාර්ථක සැලස්මක් සැකසීමට හැකියාව ලැබේ.*</u>




ඡායාරූපය - මලාවි




## ආකෘතිය - බෝග කැලැන්ඩරය

බෝග කැලැන්ඩර ආකෘතිය මෙහි පහත දක්වා ඇත. කණ්ඩායම විසින් පළමුවෙන්ම, වෙනස් කල යුත්තේ හෝ වැඩිදියුණු කල යුත්තේ කුමක්ද යන්න තීරණය කර බෝග කැලැන්ඩරයේ ඉහළින් සටහන් කර ඇති කරනු වලට අනුරූපව සලකුණු කරන්න. ඉන්පසු, ඉලක්කගත බෝග නිෂ්පාදනය සහ අලෙවිය ට අදාල නිශ්චිත මාසික ක්‍රියාවන් සටහන් කරන්න.එමෙන්ම ඔවුන් බෝග නිෂ්පාදනය සහ අලෙවිය සඳහා දායක වන අනෙකුත් අදාල කණ්ඩායම් ක්‍රියාකාරකම් හදුනා ගනී. ඉලක්ක ගත බෝග 03 කට වඩා සැලසුම් කරන්නේ නම් පහත බෝග කැලැන්ඩරයට එක් කරන්න.

අපි දියුණු කරන්නේ සහ/හෝ වෙනස් කරන්නේ ❑බෝග/ප්‍රෙබේද, ❑ප්‍රමාණය, ❑ගුණාත්මය, ❑නෙලන කාලය, ❑මිල දී ගන්නන්,❑වෙනත් (:නම් කරන්න____________________________________________

| | මාසය | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| නිෂ්පාදනය | 1 බෝගය ( ) | | | | | | | | | | | | |
| | 2 බෝගය ( ) | | | | | | | | | | | | |
| | 3 බෝගය ( ) | | | | | | | | | | | | |
| අලෙවිකරණ හා ව්‍යාපාර කළමණාකරණය | | | | | | | | | | | | | |
| කංඩායම් ක්‍රියාකාරකම්/වෙනත් | | | | | | | | | | | | | |

**පිරික්සුම් ලැයිස්තුව - මෙම ක්‍රියාකාරකමෙන් පසු තහවුරු කළ යුතු කරුණු**

- බෝග කැලැන්ඩරය සකස් කිරීමේ ක්‍රම ඉලක්කගත ගොවීන් තේරුම් ගෙන තිබිම.
- කණ්ඩායමේ බෝග කැලැන්ඩරයට අනුව, කණ්ඩායමේ එක් එක් සාමාජිකයෙක් විසින් කල යුතු විශේෂිත කාර්යයන් හා භූමිකා ඔහු හෝ ඇය විසින් අවබෝධ කර ගෙන තිබෙන බව.
- බෝග කැලැන්ඩරය සැකසීම අඛණ්ඩව විටින් විට ඉදිරියටත් ඉලක්ක ගොවීන් විසින්ම සිදු කිරීමට ඔවුන් එකඟ වී ඇති බව.
- සහභාගිවන්නන්ගේ පිරිමි සහ ගැහැණු අනුපාතය සමාන බව.
- තීරණ ගැනීමේදී පිරිමි සහ කාන්තා සාමාජිකයින්ගේ සහභාගීත්වයේ ගුණාත්මකභාවය සහතික කර ගෙන තිබෙන බව.
- තීරණ ගැනීමේදී සාමාජිකයින්ගේ කලත්‍රයන් සම්බන්ධ වන බව (විකල්පයකි).

**නවෝත්පාදනය - විවිධ රටවල්/ කලාපවල අභිරුචිකරණය**

බෝග කැලැන්ඩරය සෑදීමේ දී විවිධ රටවල් හා කලාප වල් ඒවායේ තත්වයන්ට ගැලපෙන පරිදි සිදු කර ඇති වෙනස් කිරීම් (නව්‍යතා අභිරුචිකරණයන්) වලට අදාල උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

**කොටුව 17** උපරිම ඉල්ලුම් වගුව සැකසීම

**උපරිම ඉල්ලුම් වගුව සැකසීම (ටැන්සානියාව)**

<ඇයි?> වෙළඳපල තුල ඉහල මිලක් ලබා ගැනීම සඳහා බෝග නිෂ්පාදනය කළ යුත්තේ කුමන කාලයේද යන්න අවබෝධ කර ගැනීම සඳහා ප්‍රධාන භෝගවල වාර්ෂික මිල උච්චාවචනයන් පිළිබඳව ගොවීන් සමීක්ෂණය කොට ඇත.

<කොහොමද? >බෝගයකට වඩා වැඩි මිලක් ලබා දෙන්නේ කුමන මාසයේද යන්න දැක්වෙන සරල කැලැන්ඩරයක් සකසා ගැනීම සඳහා ව්‍යපති කාර්යමණ්ඩලය ගොවීන්ට සහයෝගය ලබා දුන්හ. ඔවුන් ඉහල ඉල්ලුම/ඉහළ-මිල සහිත කාලය කැලැන්ඩරයේ පැහැදිලිව දක්වන ලදී .

<ප්‍රතිඵල?> මෙම කැලැන්ඩරය ගමේ කාර්යාලයේ ප්‍රදර්ශනය කිරීම තුලින් බොහෝ ගොවීන්ට වසරක් පුරා අලෙවිය සඳහා විභව භෝග ඇතුළුව වගා කල යුතු ප්‍රබේද හා අස්වනු නෙලන කාලය හඳුනා ගැනීමට හැකි විය.

| ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තොම්බර් | නොවැම්බර් | දෙසැම්බර් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කැරට් | කැරට් | | | | | | | | | |
| | බ්‍රොකලි | බ්‍රොකලි | | | | බ්‍රොකලි | බ්‍රොකලි | බ්‍රොකලි | බ්‍රොකලි | බ්‍රොකලි | බ්‍රොකලි |
| | කෝලි ප්ලවර් | කෝලි ප්ලවර් | | | | කෝලි ප්ලවර් | කෝලි ප්ලවර් | කෝලි ප්ලවර් | කෝලි ප්ලවර් | කෝලි ප්ලවර් | කෝලි ප්ලවර් |
| | සලාද කොල | සලාද කොල | සලාද කොල | | | සලාද කොල | සලාද කොල | සලාද කොල | සලාද කොල | සලාද කොල | සලාද කොල |
| | රාබු | රාබු | | රාබු | රාබු | රාබු | රාබු | රාබු | රාබු | රාබු | රාබු |
| ගෝවා | ගෝවා | ගෝවා | ගෝවා | ගෝවා | | | | | | | ගෝවා |
| | තක්කාලි | තක්කාලි | තක්කාලි | තක්කාලි | තක්කාලි | | | | | | |
| මෑ | මෑ | මෑ | මෑ | මෑ | මෑ | | | | | | මෑ |
| බීට් රූට් | බීට් රූට් | බීට් රූට් | බීට් රූට් | බීට් රූට් | | | | | | | |
| | | | හරිත ගම්මිරිස් | හරිත ගම්මිරිස් | හරිත ගම්මිරිස් | | | | | | |
| | ප්‍රංශ බෝංචි | ප්‍රංශ බෝංචි | | | | | ප්‍රංශ බෝංචි | ප්‍රංශ බෝංචි | | | |
| වර්ණ ගම්මිරිස් | වර්ණ ගම්මිරිස් | වර්ණ ගම්මිරිස් | වර්ණ ගම්මිරිස් | වර්ණ ගම්මිරිස් | වර්ණ ගම්මිරිස් | වර්ණ ගම්මිරිස් | වර්ණ ගම්මිරිස් | වර්ණ ගම්මිරිස් | වර්ණ ගම්මිරිස් | වර්ණ ගම්මිරිස් | වර්ණ ගම්මිරිස් |
| බැසිල් සහ මින්ට් | බැසිල් සහ මින්ට් | බැසිල් සහ මින්ට් | බැසිල් සහ මින්ට් | බැසිල් සහ මින්ට් | බැසිල් සහ මින්ට් | බැසිල් සහ මින්ට් | බැසිල් සහ මින්ට් | බැසිල් සහ මින්ට් | බැසිල් සහ මින්ට් | බැසිල් සහ මින්ට් | බැසිල් සහ මින්ට් |

උපරිම ඉල්ලුම වගුව ලුෂෝටෝ දිස්ත්‍රික්කය, ටැන්සානියාව

**කොටුව 18. කණ්ඩායම් සහ පුද්ගලයන්ගේ ගොවිබිම් දෙකම සඳහා බෝග කැලැන්ඩය**

**ගොවිබිම් කණ්ඩායම් සහ තනි පුද්ගලයන් යන දෙඅංශයෙන්ම බෝග දින දර්ශන සංවර්ධනය කිරීම** (**එල් සැල්වදෝරය සහ නේපාලය**)



ඡායාරූපය නේපාලය

**<ඇයි?>** එල් සැල්වදෝරයේ සහ නේපාලයේ ගොවි කණ්ඩායම්වලට එළවළු වගා කිරීම සඳහා කණ්ඩායම් ගොවිපලවල් සහ ගොවීන්ගේ තනි ගොවිබිම් යන දෙකම තිබුණි. ගොවීන්ට අවශ්‍ය වූයේ ගොවිබිම් දෙකටම සැලසුම් සකස් කිරීමටය

**<කොහොමද?>** ගොවීන් වර්ග දෙකේම බෝග කැලැන්ඩර සකස් කරන ලදී: එකක් සමූහ ගොවිබිම් සඳහා, අනෙක තනි ගොවි බිම් සඳහා.

**<ප්‍රතිඵල?>** භෝග දින දර්ශන වර්ග දෙක භාවිතා කරමින් සඵලදායී ලෙස ගොවිතැන් කටයුතු සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට ගොවීන්ට හැකි විය.

## දෝෂ නිරාකරණය - නිතර ඇතිවන ගැටළු සඳහා විසඳුම්

ප්‍ර: එකම වේලාවක සිටුවිම අවශ්‍ය ද**?** බෝග කැලැන්ඩරය සෑදීම යන්නෙන් අදහස් කරන්නේ සියලුම කණ්ඩායම් සාමාජිකයින් එකම බෝග එකවර වගා කිරීම අවශ්‍ය ද**?**

පි: අනිවාර්ය නොවේ. නිදසුනක් වශයෙන්, සාමාජිකයින් අතර දිගු කාලයක් සඳහා ස්ථාවර නිෂ්පාදන ප්‍රමාණයක් නෙළා ගත හැකි වන පරිදි සාමාජිකයන් අතර සිටුවන කාලය යම් පරතරයක් තබා සිදු කිරීමට කණ්ඩායමට එකඟ විය හැකිය. ගොවීන් විසින් ඉලක්ක වෙළඳපොලට හොඳම සැපයීමක් දීමට හැකි වන පරිදි, මෙවැනි සැලසුම් කිරීම කල යුත්තේ කණ්ඩායම් සාමාජිකයින් විසින් බෝග කැලැන්ඩරය සකස් කිරීමේ ක්‍රියාවලිය අතරේ දීය.

ප්‍ර: දැනටමත් සිටුවන කාලය පසු වී තිබීම **-** ගොවීන් කැලැන්ඩරය සාදන විට, ඉලක්කගත බෝග කිහිපයක් සඳහා සිටුවන කාලය දැනටමත් ගෙවී ගොස් තිබුණි. මම කුමක් කරන ලෙස ගොවීන්ට පැවසිය යුතුද**?**

පි: සිටුවන කාලය ආරම්භ වීමට පෙර බෝග කැලැන්ඩරය සකස් කිරීම වඩාත් සුදුසුය. කෙසේ වෙතත්, විවිධ පරිපාලන හෝ තාක්ෂණික හේතූන් මත එය කළ නොහැකි වීමට පුලුවන. මේ කන්නයේ එය කල නොහැකි නම්, ඊළඟ කන්නයේ දී බෝග නිෂ්පාදනය කිරීමට ගොවීන් දිරිමත් කරන්න. ඔවුන් නියම වේලාවට තෝරාගත් සියලුම බෝග පිළිබඳ නිෂ්පාදන තාක්ෂණික පුහුණුව ලබා දීමට වග බලා ගන්න.

# බෝග කැලැන්ඩරය -Crop Calendar

දිනය:______/______/_______

දිස්ත්‍රික්කයේ නම:______________________________ ග්‍රාම සේවා කොට්ඨාශයේ නම:______________________________

ගොවි කණ්ඩායමේ නම:________________________________________

අපි දියුණු කරන්නේ සහ/හෝ වෙනස් කරන්නේ ☐බෝග/ප්‍රෙභේද, ☐ප්‍රමාණය, ☐ගුණාත්මය, ☐නෙලන කාලය, ☐මිල දී ගන්නන්,☐වෙනත් (:නම් කරන්න__________________________________________________

| | මාසය | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| නිෂ්පාදනය | 1 බෝගය ( ) | | | | | | | | | | | | |
| | 2 බෝගය ( ) | | | | | | | | | | | | |
| | 3 බෝගය ( ) | | | | | | | | | | | | |
| අලෙවිකරණ හා ව්‍යාපාර කළමණාකරණය | | | | | | | | | | | | | |
| කණ්ඩායම් ක්‍රියාකාරකම්/වෙනත් | | | | | | | | | | | | | |

<උදාහරණ>

## බෝග කැලැන්ඩරය Crop Calendar

දිනය:______/______/________

දිස්ත්‍රික්කයේ නම:__________________________________ ග්‍රාම සේවා කොට්ඨාශයේ නම:___________________________________

ගොවි කංඩායමේ නම:__________________________________________

අපි දියුණු කරන්නේ සහ/හෝ වෙනස් කරන්නේ, ❑බෝග/ප්‍රෙබේද, ❑ප්‍රමාණය, ❑ගුණාත්මය, ❑නෙලන කාලය, ❑මිල දී ගන්නන්,❑වෙනත් (:නම් කරන්න 1st මතුපිට පොහොර ____________________________________

| | මාසය | මාර්තු | අප්‍රේල් | මැයි | × ජූනි | × ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | × නොවැම්බර් | දෙසැම්බර් | ජනවාරි | පෙබරවාරි |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| නිෂ්පාදනය | 1බෝගය (තක්කාලි) | | ↔ බිම් පිලියෙල කිරීම<br>↔ තවාන | ↔ සිටුවීම | ↔<br>↔ රෝග පලිබෝධ පාලනය<br>↔ වල් පාලනය | ↔ 2nd මතු පිට පොහොර | ↔ අස්වනු නෙලීම/පිරිසිදු කිරීම/ශ්‍රේණිගත කිරීම/ ඇසිරීම | | | | | | |
| | 2 බෝගය (ගෝවා) | | | | | | | | | | | | |
| | 3 බෝගය (බතල) | | | | | | | | | | | | |
| අලෙවි හා ව්‍යාපාර කළමණාකරණය | | x හා y වෙලද පොල වල වෙ/සමීක්ෂණය | වාර්ථා තැබීම ආරම්භ කිරීම | ↔ වෙලෙන්දන් සමග නිරන්තර සම්බන්ධතා පැවැත්වීම | | | ප්‍රවාහන පහසුකම් පිලියෙල කිරීම් ↔ කංඩායම් අලෙවිය | ලාභ විශ්ලේෂණය | | | | | |
| කංඩායම් ක්‍රියාකාරකම්/ වෙනත් | | බඩ ඉරිගු එළවලු වලට හැරවීම | බීජ පොහොර කංඩායම ක් ලෙස මිල දීගැ | ඇළ මාර්ග පිරිසිදු කිරීම | | | කංඩායම් සාමාජික ගාස්තු එකතු කිරීම | | | | | | |

## පියවර 4-ගොවීන් කුසලතා ලබා ගැනීම.

වෙළදපොල විසින් ඉල්ලුම් කරන බෝග නිෂ්පාදනය සදහා අවශ්‍ය දැනුම සහ කුසලතා ගොවීන්ට ලබා දීම සදහා ඇති SHEP ප්‍රවේශයේ අවසන් අදියර 4වැනි පියවරයි. මේ වන විට, ගොවීන් දැනටමත් තෝරා ගෙන ඇති බෝග සම්බන්ධව තිබෙන වෙළදපල ඉඩ ප්‍රස්ථා මනාව අවබෝධ කර ගෙන සිටින බැවින්, නව දැනුම ලබා ගැනීම සදහා ගොවීන් තුල ඇති කැමැත්ත ඉහල මට්ටමක පැවතිය යුතුයි. ගොවීන්ට ඔවුන්ගේ වගා කටයුතු වලදී තාක්ෂණයන්ට පහසුවෙන් හා ඉක්මනින් අනුවර්තනය වීමට සහ භාවිත කිරීමට හැකි වනු පිණිස, ගොවීන්ගේ අවශ්‍යතා විශේෂයෙන් සපුරා ලීමට තාක්ෂණික පුහුණු වැඩ සටහන් වල අන්තර්ගතය, සමත් විය යුතුය. තවත් විධියකට පවසතොත්, සැපයුම මත පදනම් වූ පුහුණු (supply driven training) වෙනුවට ඉල්ලුම මත පදනම් වූ පුහුණු (demand driven training) බවට පත් කිරීම එහි සාර්ථකත්වය සදහා වන යතුර වන්නේය.

### *4.1. ක්ෂේත්‍ර පුහුණු*

| පියවර 4 | කටයුතු |
|---|---|
| **1. ගොවීන් සමඟ ඉලක්කය බෙදා ගැනීම.** | සංවේදීකරණ වැඩමුළුව |
| **2. ගොවීන් දැනුවත් කිරීම.** | සහභාගීත්ව මූලික සමීක්ෂණය<br>-පාර්ශවකරුවන්ගේ රැස්වීම/සංසදය (අනිවාර්ය නොවේ)<br>වෙළදපල සමීක්ෂණය |
| **3. ගොවීන් තීරණ ගැනීම.** | ඉලක්කගත බෝග තේරීම<br>බෝග කැලැන්ඩර සෑදීම |
| **4. ගොවීන් කුසලතා ලබා ගැනීම.** | **ක්ෂේත්‍රයේ පුහුණුවීම්** — අපි මෙතැන |
| පසු විපරම් සහ අධීක්ෂණය (සහභාගී අවසාන සමීක්ෂණය ඇතුළුව) | |

**ඇයි? -අරමුණු**

ගොවීන් විසින් තෝරා ගන්නා ලද ඉලක්ක බෝග ප්‍රායෝගිකව නිෂ්පාදනය කිරීම සදහා අවශ්‍ය කුසලතා සහ දැනුම බෙදා දීම සදහා ක්ෂේත්‍ර පුහුණු (in-field training)සැලසුම් කරනු ලැබේ.

## කුමක්ද? – දළ සටහන


ඉලක්ක බෝග නිෂ්පාදනය සඳහා අවශ්‍ය කුසලතා, තාක්ෂණය සහ දැනුම ඉගැන්වීම සඳහා පුහුණු සැසි ව්‍යාප්ති කාර්ය-මණ්ඩල මගින් සංවිධානය කරනු ලැබේ. මෙම පුහුණුව ප්‍රායෝගික විය යුතු අතර ගොවීන්ගේ ක්ෂේත්‍ර වල හෝ ඒ ආසන්නයේ විශාල ආදර්ශන සහ අභ්‍යාස සහිතව සිදු කල යුතුය.

## කෙසේද? -ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන ඉගි

- ගොවීන්ගේ අවශ්‍යතා සැපිරෙන පරිදි පුහුණුව පැවැත් විය යුතුය. ගොවීන්ට වැඩිපුර පුහුණු අවශ්‍ය අවස්ථා වලදී වැඩිපුර කාලයක් යෙදවිය යුතු අතර ගොවීන් දැනටමත් අදාල මාතෘකා පිලිබදව දැනුමක් තිබේ නම් අඩු කාලයක් ද වැය කල යුතුය.




- පිටු පෙරලන (flip charts), පෝස්ටර්ස් (posters), අත් පත්‍රිකා (leaflets) වැනි ගොවීන්ට වඩාත් පහසුවෙන් අවබෝධ කර ගත හැකි පුහුණු ද්‍රව්‍ය භාවිතා කරමින් පුහුණුව ක්‍රියාත්මක කල යුතු වේ.
- ඉල්ලුම පදනම් කර ගත් ප්‍රවේශයක් ඔස්සේ පුහුණුව සිදු කරන්නේ නම්, අදාළ නව තාක්ෂණයන්ට ගොවීන් අනු වර්ථනය වීමේ වේගය, සැපයුම මත පදනම් වූ පුහුණු වලට වඩා සැලකිය යුතු මට්ටමකින් වැඩි විය යුතුය.





ඡායාරූපය 8-සැපයුම් හා ඉල්ලුම පදනම් කර ගත් පුහුණු සංසන්දනය

## පියවර -ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේද (අවශ්‍ය කාලය පැය 6-7)

1. (සූදානම් වීම) පුහුණුව සදහා අවශ්‍ය දැනුමෙන් හා කුසලතා වලින් ව්‍යාප්ති කාර්ය මණ්ඩලය මනාව සන්නද්ධ විය යුතුය. ඔවුන්ට තව දුරටත් පුහුණුවක් අවශ්‍ය නම් ක්‍රියාත්මක කරන්නන් විසින් ගොවි පුහුණු පැවැත්වීමට පෙර පුහුණුකරුවන් පුහුණු කිරීමේ සැසි (TOT) සංවිධානය කළ යුතුය.

2. ව්‍යාප්ති කාර්යය මණ්ඩල විසින් සෑම මාතෘකාවක් සදහාම පුහුණු සැසි සංවිධානය කල යුත්තේ දේශන, ප්‍රායෝගික, අභ්‍යාස, ආදර්ශන ආදිය යොදා ගැනීමෙන් සපලවත් ඉගැන්වීමේ ද්‍රව්‍ය භාවිතා කරමිනි. *ඉඟිය! සාමාජිකයින්ගේ කලත්‍රයන් උද්‍යාන බෝග නිෂ්පාදනයේ යෙදී සිටින්නේ නම් පුහුණුවට ආරාධනා කරන්න.*

3. පු හුණුවට අදාළ මාතෘකා ඉලක්ක බෝග නිෂ්පාදන අවශ්‍යතා වලට හා ගොවීන්ගේ හැකියා සංවර්ධන අවශ්‍යතා වලට හරිටම ගැලපිය යුතුය. පුහුණු මාතෘකා ක්ෂේත්‍ර 3 කට වර්ගීකරණය කර ගත හැකිය. (1) සාමාන්‍ය උද්‍යාන බෝග නිෂ්පාදනය සහ පසු අස්වනු පරිහරන තාක්ෂණයන් (2) බෝග විශේෂිත නිෂ්පාදන තාක්ෂණයන් (3) පොත් තැබීම, බෝග අය-වැය,සහ ගොවිපල වාර්තා තබා ගැනීම වැනි කළමණාකරණ කුසලතා.







## නිදසුන් - පුහුණු පාඨමාලාවන් සදහා නිදසුන

මෙම නිදසුන බෝග දෙකක් තෝරා ගෙන ඇති ගොවි කණ්ඩායමකට ක්ෂේත්‍ර පුහුණු පාඨමාලාවක් සදහා යි.

| | |
|---|---|
| සැසිය 1 | පළමුවෙන් තෝරා ගන්නා ලද බෝගය නිෂ්පාදනයට අදාළ තාක්ෂණික ක්‍රම |
| සැසිය 2 | දෙවැනියට තෝරා ගන්නා ලද බෝගය නිෂ්පාදනයට අදාළ තාක්ෂණික ක්‍රම |
| සැසිය 3 | වගාවට ප්‍රථම සුදානම් වීම. පාංශු පරීක්ෂාව , ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය තෝරා ගැනීම |
| සැසිය 4 | බිම් සැකසීම: බිම් සැකසීමේ ක්‍රමවේද, බෝග අවශේෂ පාලනය ,මූලික පොහොර සැපයීම |
| සැසිය 5 | බෝග ස්ථාපනය: තවාන් පැළ සිටුවීම,පොහොර යෙදීම,පරතරය |
| සැසිය 6 | බෝග පාලන කටයුතු: වල් මර්දනය,මතු පිට පොහොර යෙදීම,ඒකාබද්ධ පළිබෝධ පාලනය ,ජලය සැපයීම |
| සැසිය 7 | අස්වැන්න නෙළීම සහ පසු අස්වනු කටයුතු<br>අස්වනු දර්ශක, ඇසුරුම් කිරීම,අගය එකතු කිරීම |
| සැසිය 8 | කළමනාකරණ කුසලතා<br>පොත් තැබීම, ආදායම්- වියදම් වාර්තා සැකසීම |

## පරීක්ෂක ලැයිස්තුව - මෙම ක්‍රියාකාරකමෙන් පසු තහවුරු කර ගත් කරුණු

- පුහුණු වැඩමුළුවේදී උගන්වන ලද තාක්ෂණික දැනුම සහ කුසලතා ඉලක්ක ගොවීන් විසින් මනාව අවබෝධ කර ගෙන ඇති බව.
- පුහුණුවේදි උගන්වනු ලැබූ තාක්ෂණයන් භාවිතයේදි ගොවීන්ට තාක්ෂණික,මුල්‍යමය හෝ සමාජීය දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදු නොවන බව.(එසේ දුෂ්කරතා ඇති වන්නේ නම්, එම ප්‍රශ්න හදුනා ගෙන ඔවුන් හමු වී සුදුසු මගපෙන්වීම් ලබා දෙන්න. ඒවගේම SHEP ක්‍රියාත්මක කරන්නන් ඒ පිළිබදව දැනුවත් කල යුතු වේ.එවිට ඔවුන්ට පුහුණු ද්‍රව්‍ය හා මොඩියුල වැඩි වශයෙන් දියුණු කල හැකිය.)
- සහභාගිවන්නන්ගේ ස්ත්‍රී හා පුරුෂ දෙපාර්ශවයේ සමතුලිත බව
- සහභාගිවන්නන්ගේ භාර්යාව/ස්වාමිපුරුෂයා සහභාගි කර වීම උනන්දු කරවන බව.
- පුහුණු ක්‍රම සැලසුම් කිරීමේ දී සාක්ෂරතාවය ඇති ගොවීන් හා සාක්ෂරතාවය නැති ගොවීන් කෙරෙහි ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වන බව.
- ශ්‍රමය අඩුවෙන් භාවිත වන ක්‍රමවේද හා උපකරණ භාවිතය හදුන්වා දෙනු ලබන බව.

## නව්‍යයෝත්පාදනය- විවිධ රටවල භාවිතා කරන ක්‍රමවේද හදුන්වා දීමයි.

පහත දැක්වෙන්නේ ක්ෂේත්‍ර පුහුණු වල නව්‍යකරණයට ලක් වූ ක්‍රමවේද සදහා උදාහරණ කිහිපයකි.

**කොටුව 19- නිෂ්පාදන තාක්ෂණයන් සදහා ගොවියාගෙන් ගොවියාට ව්‍යාප්තිය (රුවන්ඩා ,ඉතියෝපියා)**

**ගොවියාගෙන් ගොවියාට ක්‍රමය හරහා පුහුණුව (රුවැන්ඩා, ඉතියෝපියා)**

< ඇයි? > ගොවීන්ට නිෂ්පාදන තාක්ෂණයන් බෙදා හැරීම සදහා ගොවි ක්ෂේත්‍ර පාසැල් ප්‍රවේශය රුවැන්ඩා රජය විසින් ප්‍රවර්ධනය කලේය. මෙහිදී සියලුම ඉලක්ක ගොවීන් ආවරණය කිරීම සදහා ව්‍යාප්ති කාර්යය මංඩල සංඛ්‍යාව ප්‍රමාණවත්තරම් නොවීමේ ගැටලුවක් ද තිබිනි.



ඡායාරූපය ලෙසොතො

<කෙසේද> එක්එක් කණ්ඩායමෙන් ගොවි නියෝජිතයින් කිහිප දෙනෙක් එකතුවී නව කුසලතා ඉගෙන ගත් අතර, පසුව ගොවි ප්‍රජාව වෙත ගොස් සෙසු ගොවීන්ට තමන් ඉගෙන ගත් දේ ආදර්ශණ ක්ෂේත්‍ර වලදී උගන්වන ලදී.

<ප්‍රතිඵල> ව්‍යාප්ති කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම ගැන නොසලකා ඉලක්ක ගොවීන්ට ඔවුන්ගේ ගොවි නියෝජිතයන් මාර්ගයෙන් නිෂ්පාදන තාක්ෂණයන් පිලිබදව ඉගෙනගැනීමට හැකි විය.

### කොටුව 20-ආදර්ශන ක්ෂේත්‍ර හෝ පුහුණු ගොවිපලවල් පිහිටුවීම

**ආදර්ශන ක්ෂේත්‍ර හෝ පුහුණු ගොවිපලවල් පිහිටුවීම (නේපාලය,ඉතියෝපියාව,දකුණු අප්‍රිකාව, සිම්බාබ්වේ)**

<ඇයි> ආදර්ශණ හෝ පුහුණු ක්ෂේත්‍රනක දී ගොවීන් පලමුව නිෂ්පිදන තාක්ෂණයන් දැක අත් දැකීම් ලැබීමෙන් ගොවීන් ඒවාට අනුවර්ථනය වීමට පෙලෙබෙන බව රජයේ අත්දැකීම් අනුව අදහස් කෙරිනි.



ඡායාරූපය කෙන්නියාව

<කෙසේද> ක්‍රියාත්මක කරන්නන් ගොවි ප්‍රජාවට අයත් ක්ෂේත්‍රය තුලම ආදර්ශන ක්ෂේත්‍රයක් පිහිටුවා නව තාක්ෂණයන් ප්‍රදර්ෂණය කරන ලදී. .බිම් සැකසීමේ සිට අස්වනු නෙළීම දක්වා ආදර්ශණය රැක බලා ගැනීමේ වගකීම ගොවීන් වෙත පවරන ලදී. රජය විසින් ආදර්ශන පිහිටුවීමට පුද්ගලික අංශයේ සංවිධාන වලට ආරාධනා කරන ලදී

**<ප්‍රතිඵල>** මෙම ආදර්ශන ක්ෂේත්‍ර හා පුහුණු ගොවිපලවල් වලින් ලැබුනු ධනාත්මක ප්‍රතිඵල නිරීක්ෂණය කිරීමෙන් පසුව ගොවීන් ඔවුන් පුහුණුවේ දී ඉගෙන ගත් නව තාක්ෂණයන් භාවිතා කිරීමට පටන් ගත්තේය.

### කොටුව 21-පුද්ගලික අංශයේ ව්‍යාප්ති සේවාවන් සමග සහයෝගීතාවය (ලෙසතෝ,දකුණු අප්‍රිකාව,සිම්බාබ්වේ)

**පුද්ගලික අංශයේ ව්යාප්ති සේවාවන් සමග සහයෝගීතාවය (ලෙසතෝ,දකුණු අප්රිකාව,සිම්බාබ්වේ)**

<ඇයි> රාජ්‍ය නොවන සංවිධාන, බෝග සංවිධාන, බීජ සමාගම්, අපනයකරුවන් ආදී පුද්ගලික අංශයේ ව්‍යාප්ති සේවාවන් බොහෝ රට වල බහුලව දකින්නට ඇත. ඔවුන් ව්‍යාප්ති කටයුතු සිදු කිරිමට විශේෂයෙන් උද්‍යාන බෝග නිෂ්පාදනය සම්බන්ධව කැමැත්තක් දක්වයි.



ඡායාරූපය කෙන්නියාව

<කෙසේද> ක්‍රියාත්මක කරන්නන් විසින් ක්ෂේත්‍ර පුහුණුවේ කොටසක් ලෙස පුහුණු සැසි කිහිපයක් පැවැත්වීමට පුද්ගලික අංශයට ආරාධනා කරන ලදී.

< ප්‍රතිඵල> රජය විසින් පුහුණු වැඩසටහන් පැවැත්වීමට දේශියව ලබා ගත හැකි සම්පත් ලබා දීමට හැකි වූ නිසා, සමහර පුහුණු වැඩසටහන් සැසි ඉක්මනින් ක්‍රියාත්මක කිරීම හැකි විය.

## දෝෂ නිරාකරණය -නිතර ඇති වන ප්‍රශ්ණ වලට විසදුම්

ප්‍ර-**ගොවීන්ට තේරුම් ගැනීමේ අපහසුතා තිබීම -** සමහර ගොවීන්ට ඔවුන්ට අළුත් තාක්ෂණයන් අවබෝධ කර ගැනීමේ අපහසුතාවයක් ඇති බව පෙනීයයි. ඒවා හොදින් තේරුම් ගැනීමට මම එම ගොවීන්ට උදව් කරන්නේ කෙසේද?

පි--පුහුණුව හැකි තරම් ප්‍රායෝගික කිරීමට උත්සාහ ගන්න. උදාහරණ ලෙස ඔවුන්ට පහසුවෙන් තේරුම් ගත හැකි පහසු භාෂාවක් භාවිතා කරන්න. භාවිතා කරන්නාට මිත්‍රශීලී පුහුණු ද්‍රව්‍ය තෝරා ගන්න. දේශණ පැවැත්වීම සදහා කාලය වැඩි කාලයක් වැය කරනවාට වඩා ආදර්ශණයන් ගණනාවකින් තාක්ෂණයන් පෙන්වා දෙන්න. පුහුණු පැවැත්විමට අවශ්‍ය වන්නේ කෙලෙසදැයි ගොවීන්ගෙන් අසා දැන ගෙන ඉගැන්වීමේ ක්‍රම සංශෝධණය කරන්න.

ප්‍ර -**පුහුණු වලට සහභාගි වීමට නොහැකි තරම් ගොවීන් කාර්යය බහුල වීම** පුහුණු වලට සහභාගි වීමට ගොවීන් තුල කැමැත්තක් තිබුණත් ඔවුන් වගා කටයුතු වල නියැලීමේ හේතුවෙන් කාර්යබහුල වී සිටීම නිසා සහභාගිත්වයේ එතරම් වැඩි වීමක් නොවේ.

පි -ඉලක්ක එලවළු බෝග වගා කිරීමට වහාම පෙර නිෂ්පාදන තාක්ෂණයන් පිලිබද පුහුණු පවත්වන ලෙස උපදෙස් දෙනු ලැබේ. ගොවීන්ගේ ගොවි බිම් වල පුහුණුවේ දී ඉගෙන ගත් තාක්ෂණයන් වහාම භාවිතා කිරීමට හැකි වන නිසා ඔවුන් ආශාවෙන් පුහුණුවට සහභාගි වේ. එලෙස යොදා ගැනීමට නොහැකි අවස්ථා වලදී ගොවීන් පුහුණුවට සහභාගි කර ගත හැකි අවස්ථාවක දී පුහුණුව සංවිධානය කිරීමට උනන්දු වන්න.


### තීරුව 5-නිෂ්පාදන තාක්ෂනයන් සදහා විවිධ පුහුණු ද්‍රව්‍යය

උද්‍යාන බෝග නිෂ්පාදනය හා සම්බන්ධ පුහුණු ද්‍රව්‍යය රාශියක් SHEP ක්‍රියාත්මක කරනු ලබන රට වල් බොහොමයක සංවර්ධනය කර ඇත. අදාල රට වල ඉලක්ක ගොවීන්ගේ අවශ්‍යතා වලට හොදින්ම ගැලපෙන සේ මෙම ද්‍රව්‍යය සැලසුම් කොට ඇත. ඒ සදහා උදාහරණ කිහිපයක් පහත දක්වා ඇත.

1. **කමිෂිබායි (ලැමිනේට් කරන ලද A4 ප්‍රමාණයේ පිංතූර කාඩ්පත්)-කෙන්යාව**

කමිෂිබායි යනු ජපන් වචනයකි.පිටු පෙරලනයක් (ප්ලිප් චාට්) වැනි පෙනුමක් ඇති පිංතූර සහිත කතන්දර පුවරුව යන්න එහි තේරුමයි. ඕනෑම කාලගුණ තත්වයකට ඔරොත්තු දෙන සම්පූර්ණයෙන්ම වර්ණවත් කමිෂිබායි කාඩ්පත් කෙන්යාව නිර්මාණය කල අතර මුල් පිටුව රූපසටහන් රාශියකින් සමන්විතය. පසු පිටුවේ සදහන් වන්නේ එම පිංතූර වල විස්තරාත්මක තොරතුරුය. එම නිසා ව්‍යාප්ති කාර්යය මණ්ඩලයට එම විස්තර ගොවීන්ට ශබ්ද නගා කියවිය හැකිය.

3.10.4. ප්‍රධාන රෝග සහ කායික විද්‍යාත්මක ආබාධ



ඉදිරිපස පිටුව

3.10.4. ප්‍රධාන රෝග සහ කායික විද්‍යාත්මක ආබාධ




පිටුපස පිටුව

## 2. පොත් පිංචවල් හා අත්පත්‍රිකා-නේපාලය, පලස්තීනය, රුවැන්ඩා, සහ ඉතියෝපියා

නේපාලය,පලස්තීනය,රුවන්ඩාව, යන රටවල් බෝග නිෂ්පාදනය පිලිබදව කුඩා පොත් පිංචවල් ගණනාවක් සහ අත්පත්‍රිකා නිර්මාණය කල අතර , එම රටවල් වල SHEP ක්‍රියාත්මක කරන්නන් මෙම පොත්පත් පුහුණුවෙන් පසුව ඉලක්ක ගොවීන් අතර බෙදා දෙන ලදී. එවිට ඒවා නිවෙස් වෙත ගෙන ගොස් පුහුණු වැඩසටහන් වලදී ඉගෙන ගත් දෑ නැවත මතක් කර ගත හැකිය .සාක්ෂරතාවය නැති ගොවීන්ට ඒවා නිවෙස් වෙත ගෙන ගොස් සාක්ෂරතාවය ඇති ඔවුන්ගේ පවුලේ සාමාජිකයකු මාර්ගයෙන් අවශ්‍ය විට කියවා ගත හැකිය.



අත්පත්‍රිකා -රුවැන්ඩාව අත්පත්‍රිකා - නේපාලය අත්පත්‍රිකා -ඉතියෝපියාව

ඡායාරූපය 10 - රුවැන්ඩාව, නේපාලය හා ඉතියෝපියාව හි සංවර්ධනය කර ඇති අත්පත්‍රිකා

## 3.පෝස්ටර්ස් -පලස්තීනය

පලස්තීන් SHEP වැඩසටහන ක්‍රියාත්මක කරන්නන් අත් පත්‍රිකා මෙන්ම පෝස්ටර්ස් ද නිර්මාණය කර ඇත. පුහුණු වැඩසටහන් වලදී පෝස්ටර් භාවිතා කල අතර, ගොවීන්ට පහසුවෙන් දැක ගත හැකි වන පරිදි රජයේ ආයතන වලත් මෙම පෝස්ටර් ප්‍රදර්ශනය කෙරිනි.




ඡායාරූපය 13 පලස්තීනයේ පෝස්ටරය

## 4. දැනට පවතින ඉලෙක්ට්‍රොනික පුහුණු ද්‍රව්‍යය සහ මාර්ග ගත දත්ත පද්ධතිය -දකුණු අප්‍රිකාව

“මාර්ගගත ව්‍යාප්ති කට්ටලය (Extension Suite Online)” යන නමින් බෝග නිෂ්පාදනය පිලිබදව වූ ඉලෙක්ට්‍රොනික පුහුණු ද්‍රව්‍යය හා මාර්ගගත දත්ත පද්ධතියක් දකුණු අප්‍රිකාවේ හොදින් ස්ථාපිත කොට ඇත. දේශීය ක්‍රියාත්මක කරන්නන් හා ව්‍යාප්ති කාර්යය මණ්ඩලය ඇතුලුව පද්ධතිය භාවිතා කරන්නන්ට විවිධ පුහුණු ද්‍රව්‍යය මාර්ගගත පදනම් පැලැට්පෝමයෙන් බා ගත කර ගත හැකිය. SHEP සදහා මුල සිට පුහුණු ද්‍රව්‍යය සකස් කිරීම වෙනුවට දකුණු අප්‍රිකාවේ SHEP ක්‍රියාත්මකකරන්නන් විසින් මෙම පවතින ද්‍රව්‍යය භාවිතයට ගනී.

## 5. පසු විපරම සහ ඇගයීම/අධීක්ෂණය (සහභාගීත්ව අවසන් සමීක්ෂණයද ඇතුළුව)

| පියවර 4 | කටයුතු |
|---|---|
| **1. ගොවීන් සමඟ ඉලක්කය බෙදා ගැනීම.** | සංවේදීකරණ වැඩමුළුව |
| **2. ගොවීන් දැනුවත් කිරීම.** | සහභාගීත්ව මූලික සමීක්ෂණය<br>-පාර්ශවකරුවන්ගේ රැස්වීම/සංසදය (අනිවාර්ය නොවේ)<br>වෙළඳපල සමීක්ෂණය |
| **3. ගොවීන් තීරණ ගැනීම.** | ඉලක්කගත බෝග තේරීම<br>බෝග කැලැන්ඩර සෑදීම |
| **4. ගොවීන් කුසලතා ලබා ගැනීම.** | ක්ෂේත්‍රයේ පුහුණුවීම් **අපි මෙතැන** |
| **පසු විපරම් සහ අධීක්ෂණය (සහභාගී අවසාන සමීක්ෂණය ඇතුළුව)** | |

### ඇයි? අරමුණු-

ගොවීන් පුහුණු වැඩසටහන් වලදී ලබා ගත් දැනුම සහ තාක්ෂණයන් සත්‍ය වශයෙන් භාවිතා කිරීම සහතික කර ගැනීම පසු විපරම් කිරීමේ හා ඇගයීමේ චාරිකා වල අරමුණ වෙයි. මෙම චාරිකා වලදී ගොවීන්ගේ නිෂ්පාදන පිළිවෙත් පමණක් නොව, අලෙවියේ සහ කණ්ඩායමක් ලෙස අනෙකුත් සාමූහික ක්‍රියාකාරකම් පිළිබඳව ඔවුන්ගේ ප්‍රගතිය ද සොයා බැලීම කරයි.


### කුමක්ද? -දළ සැකැස්ම-

SHEP පුහුණු අතරතුර දී ගොවීන් ඉගෙන ගනු ලැබුවා වූ දැනුම ඔවුන් විසින් භාවිතයට ගන්නවාදැයි සහතික කර ගැනීමට විටින් විට පසු විපරම් කිරීමේ සහ ඇගයීම් කිරීමේ චාරිකා (follow-up and monitoring visits) විටින් විට පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. ක්‍රියාත්මකකරන්නන් විසින් කණ්ඩායමේ බෝග කැලැන්ඩරයේ විස්තර කෙරෙන ක්‍රියාකාරකම් පිළිබඳව ද අධීක්ෂණය කරයි. යම් කිසි කාල සීමාවකට පසුව, සහභාගිත්ව මූලික සමීක්ෂණය සඳහා යොදා ගත් සමීක්ෂණ ආකෘතියම භාවිතා කරමින් සහභාගිත්ව අවසන් සමීක්ෂණය පවත්වනු ලැබේ. අවසන් සමීක්ෂණයෙන් ලැබුනු ප්‍රතිපල මූලික සමීක්ෂණයේ ප්‍රතිපල සමග සංසන්දනය කිරීමේ අදහසින් විශ්ලේෂණයකට ලක් කෙරේ.

**කෙසේද -ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ඉඟි**

- ගොවීන්ට ඔවුන්ගේම මූලාරම්භයක් සහිතව වෙළඳපොළ පාදක කර ගත් කෘෂිකර්මාන්තයක් කල හැකි ස්වයං විශ්වාසී ගොවීන් බවට පත් කිරීමට ගොවි කණ්ඩායමට උදවු කෙරෙන විධියට පසු-විපරම් කිරීමේ හා අධීක්ෂණය කිරීමේ චාරිකා සිදු කල යුතුය (රූපය 12).
- SHEP වලට සහභාගි වීමෙන් ගොවීන් ලබා ගත්තා වූ අත්දැකීම් තුලින් කොතරම් දුරට ඔවුන් වැඩි දියුණු වී ඇති දැයි ස්ථිර කර ගැනීමට සහභාගිත්ව අවසන් සමීක්ෂණයෙන් ගොවීන්ට අවස්ථා ලබා දිය යුතුය.




රූප සටහන 12. පසු විපරම් සහ නිරීක්ෂණ මගින් "ඉවත් කරනවා" සහතික කිරීම

## පියවර - ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේද (කාලය පැය 3-4)

1. ව්‍යාප්ති කාර්යය මණ්ඩලය හා ක්‍රියාත්මක කරන්නන් කණ්ඩායම විටින් විට, ගොවි කණ්ඩායම් හමුවී උපදෙස් ලබා දෙන අතර ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඇගයීමට ලක් කරයි.
2. මූලික සමීක්ෂණය -2 කොටසේ කෘෂිකාර්මික තාක්ෂණයන් වෙත අවධානය යොමු කොට එම තාක්ෂණයන්ට අනුවර්තනය වීමේ පැත්තෙන් ගොවීන් කොපමණ ප්‍රගතියක් ලබා ගෙන ඇතිදැයි විනිශ්චය කරන්න. යම් දුර්වලතා තිබේ නම්, නව තාක්ෂණයන් භාවිතයට ගැනීමට තවමත් අපහසුතා තිබෙන ගොවීන්ට උදව් ලබා දෙන්න.
3. ඉලක්ක ගොවීන් විසින් සකස් කරන ලද බෝග කැලැන්ඩරයට අවදානය යොමු කර, ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඇගයීමට ලක් කරන්න. අවශ්‍ය තැන් වලදී උපදෙස් ලබා දෙන්න.
4. ස්ත්‍රී/පුරුෂ භාවයට අදාළ ගුණාත්මක තොරතුරු එකතු කරන්න. එනම් සාර්ථක සිද්ධි, ගොවි කණ්ඩායමේ පරමාර්ථ ඉෂ්ට කර ගැනීමෙහිලා ස්ත්‍රී/පුරුෂ සමතුලිතතාවය සහ කාන්තා බල ගැන්වීම කොතරම් දුරට ඉවහල් වී ඇත් දැයි බැලීම.
5. ක්‍රියාත්මක කරන්නන් කණ්ඩායම විසින් ප්‍රකාශිත යම් කිසි කාල සීමාවකට පසුව, (1) අවසන් සමීක්ෂණය-1 කොටස: නිෂ්පාදනය, ආදායම, වියදම සහ (2) අවසන් සමීක්ෂණය -2 කොටස: කෘෂිකාර්මික තාක්ෂණයන් යන මූලික සමීක්ෂණයේ දී භාවිතා කල ආකෘතිම යොදා ගනිමින් සහභාගිත්ව අවසන් සමීක්ෂණය සිදු කරන්න.
6. ක්‍රියාත්මක කරන්නන් විසින් දත්ත ඇතුලත් කොට, සකසා විශ්ලේෂණය කල යුතුයි. ව්‍යාප්ති කාර්යය මණ්ඩලය විසින් ගොවීන්ට ප්‍රතිපෝෂණයක් ලබා දෙන්න. (විශේෂයෙන්ම මූලික සමීක්ෂණයෙන් පසු ගොවීන්ගේ ප්‍රගතිය සහ වැඩි දියුණු වීම් පිළිබද)




ඡායාරූපය:සිම්බාබ්වේ

ආකෘතිය - **අවසන් සමීක්ෂණයේ ප්‍රශ්නාවලි පත්‍රිකා**

සහභාගීත්ව අවසන් සමීක්ෂණයේ ආකෘති සහභාගීත්ව මූලික සමීක්ෂණයේ ඒවාට බොහෝ දුරට සමාන වන අතර ඊට අමතරව SHEP ක්‍රියාකාරකම් වලින් පසු ගොවීන්ගේ සිදුවූ වෙනස්කම් පිළිබඳ තොරතුරු ඇතුලත් කිරීමේ තීරු පවතී.

පිරික්සුම් ලැයිස්තුව - **මෙම ක්‍රියාකාරකමෙන් පසු තහවුරු කල යුතු කරුණු**

- ඉලක්ක ගොවීන් ඔවුන්ගේ ශක්තීන් සහ දුර්වලතා හදුනාගැනීම සහ ඔවුන්ගේ නිෂ්පාදන සහ වෙළඳපොළ තවදුරටත් වැඩිදියුණු කර ගැනීම සඳහා දෙනු ලබන විශේෂිත උපදෙස් දීම හා මඟ පෙන්වීම් කිරීම සිදු වන බව.
- ''SHEP'' ක්‍රමවේදය තුලින් තමන් ඉහළ මට්ටමකට පැමිණෙන ආකාරය හා අවස්ථාව ඉලක්ක ගොවීන් විසින් තේරුම් ගෙන තිබෙන බව.
- ඉලක්ක කණ්ඩායම් විසින් වෙළඳපොළ සමීක්ෂණ, ඉලක්ක බෝග තෝරා ගැනීම ,බෝග කැලැන්ඩරය සෑදීම සහ උකහා ගත් නිෂ්පාදන තාක්ෂණයන් අනාගතයේදී අඛණ්ඩව භාවිතා කිරීම ආදී ක්‍රියාකාරකම්වලට එකඟතාව පල කිරීම, කැමැති වීම, හා ඒවා භාවිතා කිරීම සිදු කරන බව
- සහභාගීවන්නන්ගේ ගැහැණු - පිරිමි අනුපාතය සමබරව පැවතීම පිලිබදව.
- ගැහැණු සහ පිරිමි සාමාජිකයින්ගේ සහභාගීත්ව ගුණාත්මය සමාලෝචනය කරන බව.
- අවසන් සමීක්ෂණයේදී ලබා ගත් ස්ත්‍රී පුරුෂ භේදය මත පදනම්වූ දත්ත එකතු කර සහ විශ්ලේෂණය කිරීම සිදු කල බව.
- බිරිද සහ ස්වාමි පුරුෂයා අතර ස්ත්‍රී පුරුෂ භූමිකා වල වෙනස්කම් සමාලොචනය කල බව
- බිරිද සහ ස්වාමි පුරුෂයා අතර තීරණ ගැනීමේ දී වන වෙනස්කම් සමාලෝචනය කල බව.

දෝෂ නිරාකරණය - **නිතර පැන නගින ගැටළු සඳහා විසදුම්**

**ප්‍ර:** බෝග වගා අසාර්ථක වීමෙන් අධෛර්යමත් වීම? බෝග වගාව අසාර්ථක වීමෙන් ගොවීන් අධෛර්යමත් වුවහොත් මා කුමක් කල යුතුද?

**පි:** ස්වාධීනත්වය සදහා වන ගොවීන්ගේ මනෝ විද්‍යාත්මක අවශ්‍යතාවයන්ට උදව් කිරීම, සහ කෘෂි ව්‍යාපාර අඛණ්ඩව පවත්වාගෙන යාම ඉදිරියට තල්ලු කරගෙන යාමේදී අනාගතය ගැන සිතා ක්‍රියාත්මක වීමට ඔවුන්ට සහාය වීමත් SHEP ප්‍රවේශය මගින් ඉටු කරයි. ගොවීන්ගේ SHEP අත්දැකීම් තුලින්, උද්‍යාන බෝග නිෂ්පාදනයේ දී හා අලෙවියේ දී

සැලසුම් කිරීම, තීරණ ගැනීම, අවදානම් ගැනීම, ස්ථාවරව ක්‍රියාත්මක වීම යන සමස්ථ ක්‍රියාවලිය පිලිබදව ඔවුන්ට අයිතියක් ඇති බව ගොවීන්ට හැගෙයි. එමනිසා කෘෂිකර්මයට ආවේනික වන්නාවූ වගාවන් අසාර්ථක වීම් වැනි පොදු විපත්ති වලින් අධෛර්ය නොවීමට තරම් දැනටමත් ඔවුන්ගේ අභිප්‍රේරණය ඉතා ශක්තිමත් නිසා ඔවුන් ලෙහෙසියෙන් අධෛර්යමත් තත්වයට පත් නොවේ.

**ප්‍ර : නිෂ්පාදන තාක්ෂණයන්ට ප්‍රමාණවත් ලෙස අනුවර්තනය නොවීම** -පසු විපරම් කිරීමේදී පෙනී ගිය කරුණක් වන්නේ, ගොවි පුහුණු වැඩසටහන් වලදී කියාදෙනු ලැබූ තාක්ෂණික ක්‍රියාකාරකම් සමහර ඉලක්ක ගොවි කණ්ඩායම් විසින් තවමත් අනුගමනය නොකරන බවයි.

**පි:** එක් එක් පුද්ගලයාට නව තාක්ෂණයන්ට අනුවර්තනය වීමට ගත වන කාලය හා ඒ සදහා වන ක්‍රියාවලිය පෞරුෂය හා අවට පරිසරය අනුව වෙනස් වේ. තාක්ෂණයන් නිවැරදිව අවබෝධ කර ගෙන අනුවර්තනය වීමට සමහර ගොවීන්ට අනෙක් ගොවීන්යන්ට වඩා වැඩි කාලයක් ගැනීමට ඉඩ තිබේ. නව තාක්ෂණයන් හා කුසලතා හදුන්වා දීමේ දී ගොවීන්ට ඒත්තු ගැන්වීමට ඇති සපලවත්ම මාර්ගයන්ගෙන් එකක් වන්නේ අසල්වැසියන්ගේ සාර්ථක කතන්දර (සිද්ධි) සියැසින් දැකීමයි. අපි සිද්ධි ගැන අවධානය යොමු කොට ගොවීන්ට ඒවා ඉගෙන ගැනීමට ඉඩ සැලසීමට අවස්ථා නිර්මාණය කර දිය යුතුය. පසු විපරම් කිරීමේ පරමාර්ථය වන්නේ කටයුතු ඉදිරියට කර ගෙන යාම සදහා එබදු ගොවීන්ට සහයෝගය ලබා දීමයි. අවශ්‍ය පරිදි අමතර උපදෙස් හෝ පුහුණු ලබා දෙමින් ගොවීන් දිරි ගැන්වීම දිගටම කර ගෙන යා යුතුය.

**ප්‍ර: ගොවීන් කණ්ඩායම විසිරී යාම. ඒ සදහා මම කුමක් කල යුතුද?**

**පි:** කොතැන දී කුමක් වැරදී ගියේ දැයි විමර්ශනශීලී වීමට උත්සහවත් වන්න. වැඩි ලාභයක් උපයා ගැනීමට ගොවීන්ගේ ඇති කැමැත්ත කණ්ඩායම බෙදා ගත හැක්කේ කෙසේදැයි ගවේෂණය කිරීමත් හොද අදහසක් වෙයි. ව්‍යාපාරයේ ලාභදායකත්වය වැඩි කර ගැනීමට කුඩා පරිමාණ ගොවීන්ට අත්‍යාවශ්‍ය සාධකයක් නම්, යම් නිෂ්පාදන ප්‍රමාණයක් සුරක්ෂිත කර ගැනීම බව ගොවීන් අවබෝධ කර ගැනීමත් වැදගත්ය. මේ සියලු සාකච්ඡා වලින් පසුව, කණ්ඩායම නැවත සංවිධානය කිරීම අනිවාර්ය බව දැනේ නම්, කණ්ඩායමේ සාමාජිකත්වය ගැන නැවත සලකා බලන්න.



# අවසන් සමීක්ෂණය 1 කොටස- නිෂ්පාදනය, ආදායම සහ පිරිවැය

දිනය: //
දිස්ත්‍රික්කයේ නම:______________________________උප දිස්ත්‍රික්කයේ නම:______________________________
ගොවි කණ්ඩායමේ නම:________________________________________
ගොවියාගේ නම:________________________පිරිමි ගැහැණු:_____දුරකථන නොම්බරය:___________________________

කරුණාකර පසුගිය බෝග කන්නයේ උද්‍යාන බෝග පිළිබඳ තොරතුරු (ඉරිඟු සහ උක් වැනි අනෙකුත් බෝග ඇතුළත් නොකරන්න) සඳහන් කරන්න.

| 1. බෝග නම සහ විවිධත්වය | 2. වගාව යටතේ ඇති ප්‍රදේශය මීටර් x මීටර් ($m^2$) හෝ හෙක්ටයාරයකින් මීටර් $100^2$=0.01ha 1,000$m^2$ = 0.1ha 10,000$m^2$ =1ha | | 4. වෙළෙඳපොළේ අලෙවි කරන නිෂ්පාදනය කිලෝග්‍රෑම් වලින් (කිලෝග්‍රෑම් බවට පරිවර්තනය කර) | 7. දේශීය මුදලින් කිලෝග්‍රෑම් ඒකක සාමාන්‍ය මිල (කිලෝග්‍රෑම් බවට පරිවර්තනය වේ) . | 8.දේශීය මුදලින් මුළු ආදායම | 9.දේශීය මුදලින් මුළු නිෂ්පාදන පිරිවැය (ඇතුළත්. යෙදවුම්, ප්‍රවාහනය, ශ්‍රමය, ආදිය) | 10. දේශීය මුදලින් ශුද්ධ ආදායම (ලාභය). | 11. ශුද්ධ ආදායම (හෙක්ටයාර සඳහා ) ලාභය |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2a | 2b | 4 | කොටුව තුළ 6./ඒකක පරිවර්තනය | (4. x7.) | 9 | 8. - 9. | 10*2b |
| 1 වන බෝගය: | M x M ($m^2$) | හෙක්ටයාර් | k g | | | | | |
| 2 වන බෝගය: | M x M ($m^2$) | හෙක්ටයාර් | kg | | | | | |
| 3 වන බෝගය | M x M ($m^2$) | හෙක්ටයාර් | kg | | | | | |
| 4 වන බෝගය | M x M ($m^2$) | හෙක්ටයාර් | kg | | | | | |

**කරුණාකර පහත කොටුවේ ඒකක පරිවර්තන සඳහන් කරන්න. (** උදා) අයර්ලන්ත අර්තාපල් මල්ලක් = 110 kg, ගෝවා හිස 1 = 2 kg

| |
|---|
| |

**කරුණාකර SHEP ට පසු ඔබ කර ඇති වෙනස්කම් මොනවාදැයි ලියන්න.** ( උදා . විශාල ප්‍රමාණයක් මිලදී ගන්නා නව ගැණුම්කරුවන් හමු විය. පිරිවැය අඩු කිරීම සඳහා සහතික කළ බීජ සමූහයක් මිලදී ගැනීම ආරම්භ කරන ලදි)

| |
|---|
| |

<උදාහරණ>

# අවසන් සමීක්ෂණය 1 කොටස- නිෂ්පාදනය, ආදායම සහ පිරිවැය

දිනය: //

දිස්ත්‍රික්කයේ නම:__________________________උප දිස්ත්‍රික්කයේ නම:__________________________

ගොවි කණ්ඩායමේ නම:________________________________

ගොවියාගේ නම:______________________පිරිමි ගැහැණු:_____දුරකථන නොම්බරය:________________________

කරුණාකර පසුගිය බෝග කන්නයේ උද්‍යාන බෝග පිළිබඳ තොරතුරු (ඉරිඟු සහ උක් වැනි අනෙකුත් බෝග ඇතුළත් නොකරන්න) සඳහන් කරන්න.

| 1. බෝග නම සහ විවිධත්වය | 2. වගාව යටතේ ඇති ප්‍රදේශය මීටර් x මීටර් ($m^2$) හෝ හෙක්ටයාරයකින් මීටර් $100^2$=0.01ha 1,000$m^2$ = 0.1ha 10,000$m^2$ =1ha | | 4. වෙළෙඳපොළේ අලෙවි කරන නිෂ්පාදනය කිලෝග්‍රෑම් වලින් (කිලෝග්‍රෑම් බවට පරිවර්තනය කර) | 7. දේශීය මුදලින් කිලෝග්‍රෑම් ඒකක සාමාන්‍ය මිල (කිලෝග්‍රෑම් බවට පරිවර්තනය වේ) . | 8.දේශීය මුදලින් මුළු ආදායම | 9.දේශීය මුදලින් මුළු නිෂ්පාදන පිරිවැය (ඇතුළත්. යෙදවුම්, ප්‍රවාහනය, ශ්‍රමය, ආදිය) | 10. දේශීය මුදලින් ශුද්ධ ආදායම (වගා වපසරියෙන් ලැබුනු ලාභය). | 11. ශුද්ධ ආදායම (හෙක්ටයාර සදහා ) ලාභය |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2a | 2b | 4 | කොටුව තුළ 6./ඒකක පරිවර්තනය | (4. x7.) | 9 | 8-9 | 10*2b |
| 1 වන බෝගය: තක්කාලි කැල් ජේ | M x M ($M^2$) 20X100= මීටර් $2,000^2$ | හෙක්ටයාර 0.2 | 3,000 kg | රු. 350 කි | රු. 1,050,000 | රු. 450000 | රු. 600,000 | රු. 120,000 |
| 2 වන බෝගය: | M x M ($m^2$) | හෙක්ටයාර් | kg | | | | | |
| 3 වන බෝගය | M x M ($m^2$) | හෙක්ටයාර් | kg | | | | | |
| 4 වන බෝගය | M x M ($m^2$) | හෙක්ටයාර් | kg | | | | | |

**කරුණාකර පහත කොටුවේ ඒකක පරිවර්තන සඳහන් කරන්න.** ( උදා) අයර්ලන්ත අර්තාපල් මල්ලක් = 110 kg, ගෝවා හිස 1 = 2 kg

තක්කාලි පෙට්ටියක් = 20kg

**කරුණාකර SHEP ට පසු ඔබ කර ඇති වෙනස්කම් මොනවාදැයි ලියන්න.** ( උදා . විශාල ප්‍රමාණයක් මිලදී ගන්නා නව ගැණුම් කරුවන් හමු විය. පිරිවැය අඩු කිරීම සඳහා සහතික කළ බීජ සමූහයක් මිලදී ගැනීම ආරම්භ කරන ලදි)

මම විවිධ තක්කාලි වර්ග නිෂ්පාදනය කිරීමට පටන් ගත්තා, කැල් j , වෙළඳපොළ කැමති. එම විශේෂිත තක්කාලි ප්‍රභේදය වැඩි මිලකට අලෙවි කළ හැකිය.
ප්‍රවාහන වියදම් අඩු කර ගැනීම සඳහා මම මගේ කණ්ඩායමේ සාමාජිකයන් සමඟ ප්‍රවාහනය සංවිධානය කිරීමට පටන් ගතිමි.

# අවසාන සමීක්ෂණය 2 කොටස- කෘෂිකාර්මික ශිල්පීය ක්‍රම

දිනය: //

දිස්ත්‍රික්කයේ නම:______________________________ග්‍රාම සේවා කොට්ඨාශයේ නම:________________________

ගොවි කණ්ඩායමේ නම:__________________________________________

ගොවියාගේ නම:_________________________පිරිමි ගැහැණු:_____දුරකථන නොම්බරය:______________________

* කරුණාකර පහත ප්‍රශ්නවලට "ඔව්" හෝ "නැත" ලකුණු කරන්න. ආන්තිකයේ/මායිමේ ඕනෑම අමතර තොරතුරු ලියන්න.

| **වගා කිරීමට පෙර අදියර** | | **අයිතම** | **දරුකමට හදා ගැනීම සඳහා උද්‍යාන විද්‍යාත්මක ශිල්පීය ක්‍රම යෝජනා කරයි** | **ඔව්** | **නැත** |
|---|---|---|---|---|---|
| **1** | පෙර වගාව සකස් කිරීම | Q 1 | ඔබ එක් එක් කන්නයේ වගා කළ යුතු බෝග (ය) තීරණය කිරීම සඳහා **වෙළඳපල සමීක්ෂණයක් සිදු කරන්නේද?** | | |
| | | Q 2 | ඔබ වෙළඳපල සමීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව **බෝග දින දර්ශන(ය) සකස් කර භාවිතා කරන්නේද?** | | |
| | | Q 3 | ඔබ එළවළු/වාර්ෂික මල් සඳහා අවම වශයෙන් වසර දෙකකට වරක් **පාංශු පරීක්ෂණයක් සිදු කරන්නේද;** නැතහොත් පලතුරු ගස්/බහු වාර්ෂික මල් සිටුවීමට පෙරද? | | |
| | | Q 4 | ප්‍රධාන පෝෂ්‍ය පදාර්ථ සැපයීම සඳහා විවිධ කාබනික ද්‍රව්‍ය භාවිතා කරමින් ඔබ නිර්දේශිත **කොම්පෝස්ට් ක්‍රම භාවිතා කරනවාද: නයිට්‍රජන් (N), පොස්පරස් (P), සහ පොටෑසියම් (K) කොම්පෝස්ට්/පොහොර සකස් කිරීමේදී?** | | |
| | | Q 5 | ඔබ පහත සඳහන් ලක්ෂණ එකක් හෝ කිහිපයක් සහිත නිර්දේශිත **ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය(ය) භාවිතා කරන්නේද :** රෝග ප්‍රතිරෝධය සහ ඉවසීම, ඉහළ අස්වැන්නක්, මුල් පරිණතභාවය, වඩා හොඳ රස, ප්‍රමාණය සහ දිගු ආයු කාලය? | | |
| **2** | ඉඩම් සකස් කිරීම | Q 6 | **ඉඩම් සැකසීමේ පිළිවෙත්** එකක් හෝ කිහිපයක් සමඟ ඔබ භාවිතා කරන්නේද : සූර්යාලෝකය, කාලෝචිත සීසෑම, සුදුසු සීසෑමේ ගැඹුර සහ පසෙහි ව්‍යාප්තිය හැකි පළිබෝධ සහ රෝග පරීක්ෂා කිරීම සඳහා පස චලනය අවම කිරීම? | | |
| | | Q 7 | පෝෂ්‍ය පදාර්ථ ප්‍රතිචක්‍රීකරණය වැඩි දියුණු කිරීම සඳහා සීසෑමේදී ගොවිපල තුළ සිටුවීමට අවම වශයෙන් මාස දෙකකට පෙර ඔබ **බෝග අපද්‍රව්‍ය ඇතුළත් කරනවාද?** | | |
| | | Q 8 | ඔබ සිටුවීමට අවම වශයෙන් සති 1-2 කට පෙර **මූලික යෙදුමක් ලෙස කොම්පෝස්ට්/පොහොර හෝ කාබනික පොහොර ඇතුළත් කරනවාද?** | | |
| **3** | බෝග පිහිටුවීම (රෝපණ / බද්ධ කිරීම) | Q 9 | ඔබ එළවලු/වාර්ෂික මල් සඳහා **පැළ සිටුවීමේදී නිර්දේශිත පිළිවෙත් භාවිතා කරන්නේද** නැතහොත් **පිළිගත් තවාන්(යන්හි) සිට ඇතිකරන ලද පළතුරු ගස්/බහු වාර්ෂික මල් සඳහා බීජ පැල භාවිතා කරන්නේද?** | | |
| | | Q 10 | ඔබ නිර්දේශිත රෝපණ / බද්ධ කිරීමේ **පරතරය භාවිතා** කරන්නේද? | | |
| | | Q 11 | ඔබ නිර්දේශිත **පොහොර යෙදීම් අනුපාත භාවිතා කරමින් සිටුවන්න /** බද්ධ කරනවාද? | | |
| **4** | බෝග කළමනාකරණය | Q 12 | ඔබ පහත සඳහන් වාරිමාර්ග ක්‍රමවලින් එකක් හෝ කිහිපයක් හරහා **බෝග ජල අවශ්‍යතාවය සම්පූර්ණ කරන්නේද: අවම බෝග ජල අවශ්‍යතාවය සපුරාලීම සඳහා ජලය දැමීමේ කෑන්, උඩින්, බිංදු සහ විළි?** | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | Q 13 | **වල් පැලෑටි කළමනාකරණයේදී** කාලෝචිත වල් නෙලීම සහ සුදුසු වල් නෙලීමේ මෙවලම් භාවිතා කිරීම ඔබ සහතික කරනවාද? | | |
| | | Q 14 | ඔබ සුදුසු **දෙවනවර පොහොර යෙදීමේ** පිළිවෙත් අනුගමනය කරන්නේද: කාලෝචිතභාවය, වර්ගය සහ නිර්දේශිත අයදුම් කිරීමේ අනුපාතය සහ අයදුම් කිරීමේ ක්‍රමය? | | |
| | | Q 15 | ඔබ අවම වශයෙන් පහත සඳහන් **ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණ (IPM) භාවිතයන් දෙකක් භාවිතා කරන්නේද :** සංස්කෘතික, ජීව විද්‍යාත්මක, භෞතික සහ රසායනික? | | |
| | | Q 16 | **පළිබෝධනාශකවල ආරක්ෂිත සහ ඵලදායී භාවිතය** ඔබ නිරීක්ෂණය කරන්නේද : සුදුසු මාත්‍රා, නිර්දේශිත පළිබෝධනාශක සහ පෙර අස්වනු කාල පරතරය (PHI)? | | |
| **5** | අස්වැන්න | Q 17 | ඔබ අවම වශයෙන් පහත සඳහන් **අස්වනු දර්ශක වලින් එකක්වත් භාවිතා කරන්නේද** : වර්ණය, ප්‍රමාණය, හැඩය සහ තද බව? | | |
| **6** | පසු අස්වනු හැසිරවීම | Q 18 | ඔබ පහත සඳහන් ලක්ෂණ සහිත **අස්වැන්න/ගබඩා/ප්‍රවාහන බහාලුම්/සම්මත ඇසුරුම් ද්‍රව්‍ය භාවිතා කරන්නේද** : හොඳින් වාතාශ්‍රය ඇති, පිරිසිදු කිරීමට පහසු සහ සිනිඳු ලෙස හානි අවම කර ගැනීමටද? | | |
| | | Q 19 | ඔබ පහත නිර්දේශිත අගය එකතු කිරීමේ ක්‍රමවලින් එකක් යොදනවාද: නිෂ්පාදන **පිරිසිදු කිරීම, වර්ග කිරීම, ශ්‍රේණිගත කිරීම, ඇසුරුම් කිරීම හෝ සැකසීම ?** | | |
| **7** | පිරිවැය සහ ආදායම් විශ්ලේෂණය | Q 20 | ඔබ නිෂ්පාදන හා විකුණුම් පිරිවැය පිළිබඳ වාර්තා තබාගෙන **පිරිවැය සහ ආදායම් විශ්ලේෂණය සිදු** කරන්නේද? | | |
| **8** | සාමූහික ක්‍රියාව | Q21 | ඔබ බීජ, පොහොර සහ රසායනික ද්‍රව්‍ය වැනි කෘෂිකාර්මික යෙදවුම් මිලදී ගන්නේ කණ්ඩායමක් ලෙසද (සමූහ මිලදී ගැනීම්)? | | |
| | | Q22 | ඔබ නිෂ්පාදන සාමූහිකව ප්‍රවාහනය කිරීම හෝ ඔබේ නිෂ්පාදන සාමූහිකව විකුණනවාද (කණ්ඩායම් විකිණීම)? | | |
| | | Q23 | කණ්ඩායමක් ලෙස, ඔබ ඉලක්කගත බෝග තෝරාගෙන සැලසුම් කරන්න සමූහ සාමාජිකයින් සමඟ සාමූහිකව නිෂ්පාදන/ අලෙවිකරණ උපාය මාර්ග ? | | |

## 06. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ දැනුවත් කිරිමේ පුහුණුවේ උදාහරණයක්

කෙන්යාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ දැනුවත් කිරිමේ පුහුණුව “SHEP” පුහුණු පාඨමාලාවේ කොටසක් වී ඇති අතර එය සියළුම ඉලක්කගත ගොවි කණ්ඩායම් සඳහා පිරිනමනු ලැබේ[4]. උදාහරණයක් ලෙස කෙන්යාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ දැනුවත් කිරිමේ පුහුණුව මෙහි දී හඳුන්වා දෙනු ලැබේ. කෙන්යාවේ “SHEP”හි ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ දැනුවත් කිරිමේ පුහුණුව සහභාගිත්ව පුහුණුවක් ලෙස සිදුකිරිමට කටයුතු කරන අතර ප්‍රධාන අභ්‍යාස හතරකින් සමන්විත වේ. (1) කාර්යයන් හා වගකිම්. (2) සම්පත් වෙත ප්‍රවේශය හා පාලනය. (3) දෛනික ක්‍රියාකාරකම් කැලැන්ඩරය. (4) ගොවිපවුල් අය-වැය. මෙම අභ්‍යාස හතර හරහා ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටළු අවබෝධ කරගැනිම මත පදනම්ව, ගොවින්ගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ක්‍රියාකාරි සැලැස්මක් සකස්කර එය ක්‍රියාත්මක කළ යුතුය.

*ඉගිය! ප්‍රාදේශිය සමාජ සම්මතයන් නිසා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටළු කතා කිරිමට අපහසු නම්, ප්‍රජාවේ ආගමික නායකයින් වැනි ප්‍රාදේශිය/ග්‍රාමිය නායකයින් පුහුණුවට සම්බන්ධ කරගැනිම සලකා බලන්න. පුහුණුවේ වැදගත්කම පිළිබඳව ඔවුන් කල්තියා දැනුවත් කළ යුතුය.*

*ඉගිය! කණ්ඩායම් සාකච්ඡාව අතරතුර, යම් යම් ගැටළු සඳහා වගකිව යුත්තේ කවුරුන්ද යන්න පිළිබඳ වාද කිරිමකින් තොරව ගොවියාට එකිනෙකා සමඟ සුවපහසු ලෙස කටයුතු කලහැකි වන පරිදි මිත්‍රශිලි පරිසරයක් නිර්මාණය කිරිම පහසුකම් සපයන්නාට වැදගත් වේ.*

### (1) කාර්යභාර්ය සහ වගකිම් පිළිබඳ අභ්‍යාස

ගොවින් සහ ගෙවිලියන් වෙන වෙනම කණ්ඩායම් ලෙස සාකච්ඡා කිරීමට ඉඩ සලසා දී, කුමන නිෂ්පාදන කාර්යයන් (මෙම කාර්යයේ දී උද්‍යාන බෝග නිෂ්පාදනය) සහ කුමන දරුවන් රැක බලා ගැනීමේ කාර්යයන් (ගෘහස්ථ වැඩ) වල කුමන ලිංගිකයින් නියැලෙන්නේ දැයි අදාල එක පේලියක් සඳහා මුලු හරි සලකුණු (√) හතරක් භාවිතා කිරීමෙන් හඳුනා ගන්නා ලෙස දන්වන්න. කණ්ඩායමේ වැඩ අවසන් කිරීමෙන් පසු, පහත දැක්වෙන ආකෘති භාවිතා කරමින්, පිරිමි සහ කාන්තා කණ්ඩායම් ඔවුන්ගේ කණ්ඩායම් සාකච්ඡා ප්‍රතිඵල ඉදිරිපත් කිරීමට සලස්වන්න. එහි දී පිරිමින් සහ කාන්තාවන් ඔවුන්ගේ දෛනික බෝග වගා කටයුතු සහ ගෙදර දොර කාර්යයන්හි දි ස්ත්‍රී පුරුෂ භාවය අනුව වෙනස් ලෙස නියැලෙන ආකාරය සංසන්දනාත්මකව අවබෝධ කර ගැනීමට අවස්ථාව සැලසේ. ඉන්පසු ගැහැණු සහ පිරිමි එක්ව ගොවිපල සහ ගෘහය වඩාත් කාර්යක්ෂමව කළමණාකරණය කිරිම සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ භූමිකාවන්හි සිදුකළ යුතු වෙනස්කම් මොනවාදැයි සාකච්ඡා කිරීමට අවස්ථාව ලබා දෙන්න. සාක්ෂරතාවය අඩු සහභාගිවන්නන් සිටිනම්, ක්‍රියාකාරකම් පෙට්ටි වල අකුරු වෙනුවට පින්තූර භාවිතා කළ හැකිය.

## නිෂ්පාදන භූමිකාවන් (උදාහරණ)

| | ක්‍රියාකාරකම් | පුරුෂ | ස්ත්‍රී |
|---|---|---|---|
| 01 | බීජ තවාන් සංස්ථාපනය | √ | √√√ |
| 02 | බිම් සැකසීම | √√√ | √ |
| 03 | පැළ සිටුවීම | √√ | √√ |
| 04 | පොහොර යෙදීම | √ | √√√ |
| 05 | පළිබෝධනාශක යෙදීම | √√√√ | |
| 06 | වල්පැළෑටි පාලනය | | √√√√ |
| 07 | අස්වනු නෙළීම | √ | √√√ |
| 08 | පිරිසිදු කිරීම, ශ්‍රේණිගත කිරීම, ඇසුරුම් කිරීම | √ | √√√ |
| 09 | අලෙවිය | √√√ | √ |
| 10 | ආදායම් පාලනය | √√√√ | |

***4....*** *කෙන්යාවේ ඉලක්ක ගොවි පවුල්වල බිරිඳ සහ සැමියා යන දෙදෙනාම බෝග වගා කටයුතු වල එක සේ නියැලෙන අතර මෙහිදී සිදුකරන ස්ත්‍රීපුරුෂ සමාජභාවය පිළිබඳ පුහුනු වැඩසටහන් ගොවිපල ක්‍රියාකාරකම්වල ඵලදායී බව ඉහල දමමින් ඔවුන්ගේ ගොවි ආර්ථිකය නඟා සිටුවීමට මහත් පිටුවහලක් වී ඇත.*

## ගෘහස්ථ කාර්යයන් (උදාහරණ )

| අංකය | ක්‍රියාකාරකම් | පුරුෂ | ස්ත්‍රී |
|---|---|---|---|
| 01 | ආහාර පිළියෙළ කිරීම | | √√√√ |
| 02 | පිරිසිදු කිරීම | | √√√√ |
| 03 | දර සපයාගැනීම | √ | √√√ |
| 04 | වතුර සපයාගැනීම | | √√√√ |
| 05 | දරුවන් රැකබලා ගැනීම | √ | √√√ |
| 06 | රෝගීන්ට උපස්ථාන කිරීම | √ | √√√ |
| 07 | ඇඹරීම (ධාන්‍ය,තුනපහ) | | √√√√ |
| 08 | නිවස අලුත්වැඩියා කිරීම | √√√ | √ |
| 09 | ආරක්ෂාව | √√√√ | |

### 2. සම්පත්[5] ළඟා කරගැනීම සහ පාලනය පිළිබඳ අභ්‍යාස

පහත ආකෘති දෙක සම්පූර්ණ කිරීමට පිරිමි සහ කාන්තා කණ්ඩායම් දිගටම වැඩකරගෙන යනු ලබන අතර විවිධ නිෂ්පාදන වැඩ සඳහා වැදගත් සම්පත් සඳහා ප්‍රවේශය ඇත්තේ කුමන පාර්ශවයටද යන්න ඔවුන් හඳුනා ගනී. ඔවුන් එකම සම්පත් වඩා ඵලදායි ලෙස පාලනය කරන්නේ ගැහැණුද, පිරිමිද යන්නද හඳුනාගනී. පිරිමි සහ ගැහැණු සාකච්ඡා ප්‍රතිඵල සන්සන්දනය කරනු ලබන අතර, වැදගත් සම්පත් වෙත ප්‍රවේශවීම හෝ පාලනය කිරීම සම්බන්ධයෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත විශේෂිත සීමාකිරීම් ගොවිපල ජීවිතයට ඍණාත්මක බලපෑමක් ඇති කරන්නේ කෙසේදැයි ඔවුන් සාකච්ඡා කරනු ඇත. සාක්ෂරතාවය දුර්වල සහභාගිවන්නන් සිටිනම් ක්‍රියාකාරකම් පෙට්ටි වල අකුරු වෙනුවට පින්තූර භාවිතා කළ හැකිය.

### සම්පත් සඳහා ප්‍රවේශය[6] (උදාහරණ)

| අංකය | ක්‍රියාකාරකම් | පුරුෂ | ස්ත්‍රී |
|---|---|---|---|
| 01 | භූමිය | √√ | √√ |
| 02 | ගොවිපළ උපකරණ | √√√ | √ |
| 03 | වැඩිදියුණු කළ කිරි එළදෙන | √√√ | √ |
| 04 | දේශිය එළුවා | √ | √√√ |
| 05 | දේශිය කුකුළා | √ | √√√ |
| 06 | කෘෂිකාර්මික පුහුණුව | √√√ | √ |
| 07 | තක්කාලි (ප්‍රධාන බෝගයක් ලෙස) | √√ | √√ |
| 08 | ගම්මිරිස් (ප්‍රධාන බෝගයක් ලෙස) | √√ | √√ |

### සම්පත් පාලනය[7]

| **අංකය** | **ක්‍රියාකාරකම්** | **පුරුෂ** | **ස්ත්‍රී** |
|---|---|---|---|
| 01 | භූමිය | √√√√ | |
| 02 | ගොවිපළ උපකරණ | √√√√ | |
| 03 | වැඩිදියුණු කළ කිරි එළදෙන | √√√ | √ |
| 04 | දේශිය එළුවා | √√√ | √ |
| 05 | දේශිය කුකුළා | √√ | √√ |
| 06 | කෘෂිකාර්මික පුහුණුව | √√√√ | |
| 07 | තක්කාලි (ප්‍රධාන බෝගයක් ලෙස) | √√√√ | |
| 08 | ගම්මිරිස් (ප්‍රධාන බෝගයක් ලෙස) | √√√√ | |

---

*6.සම්පත් : ගොවිපල කටයුතු සඳහා භාවිතා කරන ගොවින් සතු දේවල් උදා, ඉඩම්, ආයුධ, බෝග, සතුන් ආදී ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ගොවියා විසින් අයිති කර ගත හැකි හෝ භාවිතා කල හැකි ඕනෑම දෙයක්*

*7.ප්‍රවේශය: සම්පතක් භාවිතා කිරීමට ඇති අවස්ථාව*

*8.පාලනය : සම්පතක් භාවිතා කරන්නේ කෙසේද?, එයට ප්‍රවේශ විය හැක්කේ කාටද?, එය අලෙවි කල හැක්කේ කවදා ද? ආදිය පිලිබදව තීරණය කිරීමේ බලය*


## 3. දෛනික ක්‍රියාකාරකම් දින දර්ශනයට අනුව වැඩකිරීම

පිරිමි සහ ගැහැණු යන දෙදෙනාම සාමාන්‍ය සතියේ දිනක ඔවුන්ගේ ක්‍රියාකාරකම් කැලැන්ඩර සකස් කරනු ලැබේ. ක්‍රියාකාරකම් අතර ගොවිපල වැඩ, ඉවුම්පිහුම් සහ පිරිසිදු කිරීම වැනි ගෘහාශ්‍රිත වැඩ මෙන්ම විවේක ගැනීම, නිදාගැනීම යනාදිය ද ඇතුලත් වේ. පූර්ණ සාකච්ඡාවේදි, පිරිමින් සහ කාන්තාවන් ඔවුන්ගේ දෛනික ක්‍රියාකාරකම් දින දර්ශන සන්සන්දනය කර බිරිඳ සහ පුරුෂයා යන දෙදෙනාටම වඩා යහපත් ලෙස කාලය යොදාගැනීම ගැන අවධානට යොමු කරති.

**පුරුෂයින්ගේ දෛනික ක්‍රියාකාරකම් කැලැන්ඩරය (උදාහරණයක්)**




**කාන්තාවන්ගේ දෛනික ක්‍රියාකාරකම් කැලැන්ඩරය (උදාහරණයක්)**




## 4 ගොවි පවුල්වල අයවැය පිළිබඳ අභ්‍යාස

පිරිමි සහ කාන්තාවන් වෙන වෙනම කණ්ඩායම් ලෙස ඔවුන්ගේ සාමාන්‍ය වාර්ෂික වියදම් රටාව මත පදනම්ව “ගොවිපල පවුල් අයවැය ලේඛනයේ” සෑම මසකම වියදම් ප්‍රමාණය පිරවීමට ක්‍රියා කරයි. සාක්ෂරතා අභියෝග හේතුවෙන් ගොවින්ට අංක ලිවීමේ ගැටළුවක් තිබේනම්, යම් මුදලක් නියෝජනය කිරීම සඳහා ඇටවර්ග, කුඩාගල් ආදිය භාවිතා කරන ලෙස ක්‍රියාත්මක කරන්නන් විසින් ඔවුන්ගෙන් ඉල්ලා සිටිය හැක. අභ්‍යාසය අවසන් වූ පසු,පිරිමි සහ ගැහැණු කණ්ඩායම් එකිනෙකාගේ පත්‍රිකාව පෙන්වමින් ගෘහයේ අයවැය සම්බන්ධයෙන් ස්වාමිපුරුෂයා සහ භාර්යාව අතර සන්නිවේදනයේ අඩුකම, මුල්‍ය සම්පත් අකාර්යක්ෂම ලෙස භාවිතා කිරීම යනාදිය නිසා ඇතිවන ගැටළු සාකච්ඡා කරති. මෙම ක්‍රියාවලිය හරහා පවුලේ අයවැය වඩා හොඳින් කළමණාකරණය කිරීම සඳහා ඔවුන්ට කළ හැකි දේ හඳුනාගැනීමට කණ්ඩායමට මඟ පෙන්වනු ලැබේ.

## ගොවි පවුල් අයවැය ලේඛණය

| | වියදම් ආයිතම | ජන. | පෙබ. | මාර් . | අප්‍රේ . | මැයි | ජුනි | ජූලි | අගෝ . | සැප් . | ඔක්. | නොවැ. | දෙසැ . | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | | | | | | | | | | | | | | |
| 2 | | | | | | | | | | | | | | |
| 3 | | | | | | | | | | | | | | |
| 4 | | | | | | | | | | | | | | |
| 5 | | | | | | | | | | | | | | |
| 6 | | | | | | | | | | | | | | |
| 7 | | | | | | | | | | | | | | |
| 8 | | | | | | | | | | | | | | |
| 9 | | | | | | | | | | | | | | |
| 10 | | | | | | | | | | | | | | |
| | එකතුව | | | | | | | | | | | | | |



ඡායාරූපය කෙන්නියාව

### 5.ස්ත්‍රී පුරුෂභාවයට අදාල ක්‍රියාකාරකම් සැලැස්ම

අකාර්යක්ෂම ස්ත්‍රී-පුරුෂභාව භූමිකාවක් සාක්ෂාත් කරගැනිම, අසමතුලිත තිරණ ගැනීමේ බලය සහ ස්වාමිපුරුෂයා සහ භාර්යාව අතර විශ්වාසය හා සන්නිවේදනය දුර්වලතා යනාදිය මෙම ගැටළු මඟහරවා ගතහැකි ආකාරය පිළිබඳව කණ්ඩායමේ තවදුරටත් සාකච්ඡා කිරීමට පොළඹවනු ලබයි. ඔවුන්ගේ දැනුවත් භාවය ඉහළයාම මත පදනම්ව ස්ථිර ක්‍රියාමාර්ග ගැනීමට ඔවුන්ට සහායවීම සඳහා පහත දැක්වෙන පරිදි ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාලව ක්‍රියාකාරි සැලැස්මක් සකස් කරනු ලැබේ. පෙර අභ්‍යාස හතර හරහා හඳුනාගත් ගැටළු කිහිපයක් විසඳිමට උපකාරිවන ක්‍රියාකාරි අයිතම මෙම සැලැස්මෙහි දක්වා ඇත. “SHEP” වැඩපිළිවෙළ හරහා ක්‍රියාකාරි සැලැස්ම ක්‍රියාත්මක කිරීමට ගොවි කණ්ඩායම් අපේක්ෂා කෙරේ.

## ස්ත්‍රී පුරුෂභාවයේ ක්‍රියාකාරකම් සැලැස්ම (උදාහරණය)


| අරමුණ | වඩාත්ම වෙහෙස කර වැඩ | ක්‍රියාකාරකම් | සම්පත් | සැලැස්ම | ක්‍රියාත්මක කරන්නා | අධික්ෂණ දර්ශනය | අධික්ෂණය | වෙනත් |
|---|---|---|---|---|---|---|---|---|
| කාන්තාවන්ගේ අධික වැඩබර අඩු කිරීම | දර ගෙන ඒම | වැඩිදියුනු කරනලද උදුනක් මිලදී ගැනීම | මුදල් (රු.800) මුළුතැන්ගෙය සැදීමට යන ශ්‍රමය | දෙසැම්බර් 2018 | එක් එක් කණ්ඩායම් සාමාජික | කණ්ඩායම් සාමාජිකයින්ගෙන් 70%කට වඩා ක්‍රියාත්මක කර තිබීම | කණ්ඩායම් පහසුකම් සපයන්නා/ විධායක කමිටුව | ඊළඟ කන්නයේ උද්‍යාන වගා බෝග නිෂ්පාදන අලෙවිය සිදුකරනවිට ඉටු කිරීම |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

## යෝජනාව : උපමා කථා භාවිතා කරමින් සාකච්ඡා සැසි සංවිධානය කිරීම

1-5 දක්වා පැහැදිලි කර ඇති පුහුණු මොඩියුල කෙන්යාවේ පවත්වන ලද ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණුවීම් වේ. කෙසේ වෙතත්, සමහර රටවල් එවැනි පුහුණු සැසි සංවිධානය කිරීම සඳහා මූල්‍ය හා මානව සම්පත් සීමාවන්ට මුහුණ දිය හැකිය. එවැනි අවස්ථාවක කෙන්යාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පුහුණු කිරීමේ ක්‍රමය සංවිධානය කරනවා වෙනුවට, ඉලක්ක ගත ගොවින් ප්‍රධාන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සිද්ධීන් කිහිපයකට නිරාවරණය කිරීම සඳහා සාකච්ඡා රැස්වීමක් පැවැත්වීම සමහර විට ප්‍රයෝජනවත් විය හැකිය. එවැනි රැස්වීමකදී උදාහරණයක් ලෙස ගොවිපල කලමණාකරණය සඳහා තිරණ ගැනීමේදී ස්වාමිපුරුෂයා සහ භාර්යාව යන දෙදෙනාම එක්ව තිරණ ගැනිම කෙතරම් වැදගත්දැයි ගොවින්ට පහසුවෙන් අවබෝධ වන පරිදි පහත දැක්වෙන ආකාරයේ සැබෑ ජිවිත කතන්දර කිහිපයක් ගොවින්ට හඳුන්වා දිම කළ හැකිය. ක්‍රියාත්මක කරන්නන්ට මෙම කතා හඳුන්වාදීමෙන් පසු සාකච්ඡා සැසි සංවිධානය කළ හැකි නම්, එය ගොවින් දැනුවත් කිරීමේ හොඳ උපාය මාර්ගයක් විය හැකිය.

## තීරුව 6- ගොවි ගෙදරක සැමියෙකුගේ කතාවකි.

දවසක් මම උදෙන්ම ගෙදරින් පිටත්වුනේ අස්වැන්න නෙලීමට තිබූ මගේ තක්කාලි වලට වෙලඳපොලක් හොයන්න. මම වෙලඳපොළක් සොයමින් කාර්යබහුලව සිටියදී ගැණුම්කරුවකු මගේ නිවසට පැමිණ මගේ බිරිඳ හමුවෙලා තිබුණා. ඇයගෙන් තක්කාලි විකිණීමට හැකිදැයි ඔහු ඇසු නමුත් ඇයට තීරණ ගැනීමට කිසිදු බලයක් නොමැති නිසාත්, මගේ සැලසුම් කිසිදා නොදැන සිටි නිසාත්, ඇය එය ප්‍රතික්ෂේප කළාය. මා වෙළඳපොළක් සෙවීම අසාර්ථක වූ නිසා මම ගෙදර පැමිණි අතර එහිදී මගේ බිරිඳ දවසේ සිදුවීම් මට වාර්තා කළේය. මට හරිම කණගාටුවක් දැනුනා, අන්තිමේ තක්කාලි විකුණගන්න තැනක් නැතිව ඒවා නරක්වී ගියා.



පහත පරිදි ගොවීන්ගෙන් ප්‍රශ්න කරන්න.

- ✓ මෙවැනි තත්ත්වයන් ඔබ අත්දැකිම් තිබේද?
- ✓ මෙවැනි ගැටළුවක් ඇති වූයේ ඇයි කියලද ඔබ සිතන්නෙ?
- ✓ ඔබට කියන්න පුළුවන්ද මෙවැනි තත්ත්වයක් වලක්වා ගන්නේ කොහොමද කියා?

## තීරු 07 -ගොවි ගෙදරක බිරිදකගේ කතාවකි


දවසක් මගේ සැමියා මට කිවුවා “මම අහලා තියෙනවා මල් ගෝවා ලාභයි කියලා. ඒ නිසා අපි අපේ මුළු ඉඩමෙම මල් ගෝවා සිටවමු” කියලා. “හොඳයි, නමුත් අපි මුළු ඉඩමේ නොවෙයි ඉඩමෙන් භාගයක වගා කරමු” යැයි පවසමින් මම ඔහුට විරුද්ධ වුනා. මක්නිසාදයත්, තවත් බොහෝ ගොවීන් දැනටමත් මල්ගෝවා වගා කර ඇති බව මම දැක්කා. තවද බොහෝ ගොවීන් ඔවුනුත් මල් ගොවා වගා කිරීමට ඕනෑ කරන බවපවසනු මට ඇසී තිබුනා. ඒ නිසා අස්වනු නෙළන අවස්ථාව වන විට මිළ අඩුවන බව මම දැන ගෙන හිටියා. මගේ සැමියා මට ඇහුම්කන් නොදී ඔහුට අවශ්‍ය දේ කළා. ඒ කන්නයේ අපි විශාල පාඩුවක් ලැබුවා. කෙසේ වෙතත් මෙම කටුක අත්දැකීමෙන් පසු මගේ සැමියා මගෙන් ඇසීමට පටන් ගත්තා, මෙම කන්නයට වගා කරන්න හොඳ බෝගය මොකක්ද කියලා.



ඡායාරූපය: දකුණු අප්‍රිකාව

පහත පරිදි ගොවීන්ගෙන් ප්‍රශ්න කරන්න.

- ✓ ඔබට මෙවැනි අත්දැකීම් තිබේද?
- ✓ මෙවැනි ගැටළුවක් ඇති වූයේ ඇයි කියලද ඔබ හිතන්නේ?
- ✓ මෙවැනි ගැටළු ඇති වීම වලක්වා ගත හැක්කේ කෙසේ කියාද ඔබ හිතන්නේ?


මම වැසිකිළියේ රහසිගතව මුදල් ගණන් කිරීම පුරුද්දක් ලෙස කලා.
ගොවිතැනට හා පවුලට සම්බන්ධ ගිණුම් ගැටළු ගැන මා සමග සාකච්චා කරනවා. දැන් ඔබ යහපත් ස්වාමි පුරුෂයෙක් වෙලා.
හරි, ඔබ සමග ඒකට වැඩ කරන ඒක මට සතුටක්.
අපි කණ්ඩායමක් ලෙස ඒකිනෙකා විශ්වාස කරමු.

# “3 කොටස: මග පෙන්වීම”

**SHEP ප්‍රවේශය ක්‍රියාත්මක කිරීම**

**සඳහා ප්‍රයෝජනවත් අමතර තොරතුරු “3 කොටස: මග පෙන්වීම” සපයයි.**

# 1. නිතර අසන ප්‍රශ්ණ:

ලෝකය පුරා SHEP ක්‍රියාත්මක කරන්නන් නිතර අසන ප්‍රශ්ණ සමහරක් මෙහි දැක්වේ. කෙන්නියාවේ හා ඉන් පිටත SHEP ක්‍රියාත්මක කරන්නන්ගේ හා සැලසුම්කරුවන්ගේ පුළුල් පළපුරුදු පදනම් කර ගෙන, පහත දැක්වෙන සමහර උත්තර සකස් කර ඇත. මෙවැනි වර්ගයේ ප්‍රශ්ණ වලට සැපයිය හැකි තනි එක පිළිතුරක් පමණක් නොමැති බව අමුතුවෙන් පැවසිය යුතු නොවේ. බිම් මට්ටමේ ගොවීන් සමග වැඩ කිරීම තුළින් තමන්ගේම පිළිතුරු සොයා ගැනීමට පාඨකයා දිරිමත් කරනු ලැබේ.

1.1. SHEP ක්‍රම හා භාවිතය සම්බන්ධ ප්‍රශ්ණ

ප්‍ර1. SHEP ප්‍රවේශය උද්‍යාන බෝග වගාව සඳහා පමණක් ද? ධාන්‍ය නිෂ්පාදනය, පශු සම්පත් නිෂ්පාදනය ආදී අනෙකුත් කෘෂිකාර්මික කටයුතු සඳහා ඒය භාවිතා කල හැකි ද?

පි1. කෘෂිකර්මයේ අනෙකුත් උප අංශ සඳහා ද SHEP ප්‍රවේශය භාවිතා කල හැකියි. අප්‍රිකාවෙන් පිටත අනෙකුත් රටවල් වල මෙන්ම විවිධ කෘෂිකාර්මික උප අංශ සඳහා ද SHEP ප්‍රවේශය භාවිතා කිරීම ජයිකා ආයතනය මගින් ප්‍රවර්ථනය කරනු ලැබේ. උදාහරණ විදියට, මැඩගස්කරයේ වී වගා ව්‍යාපෘතියට SHEP ප්‍රවේශය භාවිතා කරයි. SHEP ප්‍රවේශය යොදා ගෙන නැමීබියාවේ පශු සම්පත් සංවර්ධනය කිරීම සඳහා සැලසුම් සකස් කරමින් සිටී. පකිස්තානයේ ඉලක්ක ගොවීන් පශු සම්පත් ක්ෂේත්‍රයට අදාල වෙලඳපොල අවශ්‍යතා තේරුම් ගෙන වෙලඳපොල කැමැත්ත අනුව ඔවුන්ගේ පශු සම්පත් ව්‍යාපාර පිළිවෙත් වැඩි දියුණු කිරීමට උත්සහ දරමින් සිටී. විවිධ ධාන්‍ය වර්ග ප්‍රවර්තනය, ධීවර කර්මාන්තය, හෝ කෘෂි-සැකසීම් කර්මාන්තය ආදී උප-අංශ වල ද සංවර්ධනයට සම්බංධ ක්‍රියාකරුවන්ගේ අභිප්‍රේරණය ඉහල නැංවීම හරහා නිෂ්පාදකයින් හා වෙලඳපොල පාර්ශ්වකරුවන් අතර තොරතුරු වල හිඩැස පිරවීමට මූලාරම්භ කරනතාක්කල් SHEP ප්‍රවේශය භාවිතාකරන්නන් සිටිය හැකිය. ඇත්ත වශයෙන්ම, SHEP ගොවීන් බොහොමයක් ඔවුන් SHEP වලදී ලබා ගත් දැනුම රාජ්‍ය අංශයේ මැදිහත් වීමකින් තොරව පශු සම්පත් නිෂ්පාදනය, ආහාර සැකසීමේ කර්මාන්තය ආදී වෙනත් ආදායම් උපයන කටයුතු සඳහා යොදා ගනිමින් සිටී.

ප්‍ර 2. SHEP පුහුණු පාඨමාලාව ක්‍රියාත්මක කිරීම සම්පූර්ණ කිරීමෙන් පසු ගොවීන් අධෛර්යට පත් නොවන්නේ ද? SHEP මැදිහත් වීමෙන් පසු ගොවීන්ගේ ධෛර්යය ඉහල මට්ටමක පවත්වා ගැනීම මා විසින් කල හැක්කේ කෙසේද?

පි2.SHEP පුහුණුව හදාරා "SHEP කටයුතු සම්බන්ධව ප්‍රවීණත්වයක්" ලබා ගත් ගොවීන් සාමාන්‍යයෙන් අධෛර්යට පත් නොවේ. SHEP පුහුණු පාඨමාලාවේ දැඩි මැදිහත්වීමෙන් පසුව, ව්‍යාප්ති කාර්ය මණ්ඩලය කණ්ඩායම් වෙත පැමිණීම අඩුවෙන බව සත්‍යයකි. කෙසේ වෙතත්, ගොවියා අතර ඇති සම්බන්ධය නිසා කණ්ඩායම් සහ ව්‍යාප්ති කාර්ය මණ්ඩලය පෙරට වඩා බොහෝ සෙයින් ශක්තිමත්, ඔවුන්ට දුරකථනයෙන් නිතර සන්නිවේදනය කිරීමටත් සමීප සබඳතාවක් පවත්වා ගැනීමටත් හැකිය.



ටකේෂි කුනෝ/ජයිකා, කෙන්නියා

තවද, ගොවි කණ්ඩායම් ගැනුම්කරුවන්, කෘෂිකාර්මික යෙදවුම් සපයන්නන්, ආහාර සැකසුම් සමාගම්, මූල්‍ය ආයතන, පර්යේෂණ ආයතන, සමඟ ව්‍යාපාරික ජාල පිහිටුවා ඇති බැවින්. සහ අනෙකුත් SHEP හි ඔවුන්ගේ සහභාගීත්වය හරහා, ඔවුන්ට ව්‍යාප්ති කාර්ය-මණ්ඩලයේ තනි සහායකින් තොරව ඔවුන් සමඟ අන්තර් ක්‍රියා සහ ව්‍යාපාරික ගනුදෙනු දිගටම කරගෙන යා හැකිය. SHEP යනු පුහුණුව ආරම්භයේදී ම ස්වයං විශ්වාසී ලෙස ගොවිපල ව්‍යාපාර සාක්ෂාත් කර ගැනීම බව, ඉලක්කගත ගොවීන්ට පැහැදිලි කිරීම SHEP ක්‍රියාත්මක කරන්නන්ට වැදගත් වේ.

ප්‍ර3.ගොවි ව්‍යාපාරික පාසල (FBS) වැනි අනෙකුත් ප්‍රවේශයන්ගෙන් SHEP වෙනස් වන්නේ කෙසේද? මෙම දෙවර්ගයම වෙළඳපල ඉලක්ක කරගත් කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය නොකරන්නේද?

පි3. SHEP සහ FBS යන ක්‍රමවේද දෙවර්ගයම "ගොවිතැන ව්‍යාපාරයක් ලෙස" ප්‍රවර්ධනය කිරීමට උත්සාහ කරන බව සත්‍යයකි. සාමාන්‍යයෙන් FBS ක්‍රමවේදයේදී, කණ්ඩායමකින් නියෝජිතයින්ට ආරාධනා කර ඔවුන්ට  පුහුණු සැසි ලබා දෙයි. FBS පුහුණුවීම් වලට සහභාගී වීමෙන් පසු ගොවි නියෝජිතයන්ගෙන් බලාපොරොත්තු වන්නේ කණ්ඩායම් සාමාජිකයින්ට දැනුම බෙදා හැරීමයි. එසේම SHEP ක්‍රමවේදය මගින්, සියලුම කණ්ඩායම් සාමාජිකයින්ට පුහුණු අවස්ථා ලබා දෙන අතර "කරමින් ඉගෙනීම" හරහා ඔවුන්ට නව කුසලතා පුහුණු වීමට සහ ලගා කර ගැනීමට උපකාර කරයි.  ඇතැම් SHEP ක්‍රියාත්මක කරන්නන් පවසන ආකාරයට, SHEP මගින් ගොවීන් සහ ව්‍යාප්ති නිළධාරීන් සමීප කරවන අතර ඔවුන් අතර විශ්වාසය ගොඩනැංවීම සිදු කරයි. මෙය SHEP හි අතිරේක වාසියකි. එසේම අවසාන වශයෙන්, SHEP යනු වෙළඳපල ඉලක්ක කරගත් කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම පමණක් නොව ස්වයං  නිර්ණායක මත පදනම්ව එය ක්‍රියාත්මක කිරීමට ගොවීන් දිරි නංවන ක්‍රමවේදයකි. මෙය SHEP සදහා ඉතා ආවේණික වේ.

ප්‍ර4. SHEP ප්‍රවේශය අගය දාම සංවර්ධන ප්‍රවේශයට වඩා වෙනස් වන්නේ කෙසේද?

පි4. මෙම ප්‍රවේශයන් දෙකම අගය දාමය තුල යම්කිසි භාණ්ඩයක් සදහා පාර්ශවකරුවන් අතර ශක්තිමත් ව්‍යාපාරික සම්බන්ධතා ස්ථාපිත කිරීමෙන් කාර්යක්ෂම වෙළඳපල ආර්ථිකයක් සාක්ෂාත් කර ගැනීමට උත්සාහ කරයි. අගය දාම සංවර්ධන ප්‍රවේශය,  බොහෝ විට අගය දාමයේ සියලුම පාර්ශවකරුවන්ට අවධානය යොමු කරන අතර, SHEP ප්‍රවේශය, ගොවීන්ගේ ධාරිතා සංවර්ධනය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරයි. එවිට ගොවීන්ටම අගය දාමය තුල ඔවුන්ගේ ගොවිපල ව්‍යාපාරයට වඩාත්ම අදාළ වන වෙළඳපල කොටස්කරුවන් හඳුනා ගත හැකි අතර එම පාර්ශවකරුවන්ගේ මූලිකත්වයෙන් ව්‍යාපාර ජාලයන් ස්ථාපිත කර ගත හැකිය. කෙටියෙන් කිවහොත්, SHEP හි අවධානය යොමු වන්නේ ගොවීන්ගේ ස්වයං අභිප්‍රේරණය හා කුසලතා මගින් අගය දාමය තමන් විසින්ම ගොඩනගා ගැනීම සහ සංවර්ධනය  කිරීම වේ.

ප්‍ර 5. ගොවීන් සහ වෙළඳපොළ ක්‍රියාකාරීන් අතර තොරතුරු පරතරය පිරවීම එකම අරමුණ නම් වෙළඳපල සමීක්ෂණය සහ පාර්ශවකරුවන්ගේ සංසදය අතර ඇති ප්‍රධාන වෙනස්කම් මොනවාද?

පි 5. මෙම සිදුවීම් දෙකටම මූලික වශයෙන් ඇත්තේ එකම අරමුණක් වන තොරතුරු අසමමිතිය පිළිබඳ ගැටළුව විසඳීම වේ. කෙසේ වෙතත්, SHEP ක්‍රියාත්මක කරන්නන් සහ SHEP ක්‍රියාත්මක කරන රටවල ගොවීන් සමහර වෙනස්කම් හඳුනාගෙන ඇත. ඒවානම්



ඡායාරූපය සෙනගල්

(1) වෙළඳපල සමීක්ෂණයට වඩා පාර්ශවකරුවන්ගේ සංසදය තුලදී ගොවීන්ට, සුදුසු පරිසරයක් තුල  සවිස්තරාත්මක හා මාතෘකාවට අදාල වන සාකච්ඡා සඳහා වැඩි කාලයක් තිබේ.

(2) වෙළඳපල සමීක්ෂණයක්, රජයෙන් උදව්වක් නොමැතිව ගොවීන් විසින්ම සිදු කරන තුරු ගොවීන්ට අවශ්‍ය පරිදි එය නිතර සිදු කළ හැකිය. නමුත්, පාර්ශවකරුවන්ගේ සංසදය සාමාන්‍යයෙන් රජයක් මගින් සංවිධානය කරනු ලබන්නේ සම්පත් ඇති විට වසරකට වරක් පමණි. එබැවින් මෙම ක්‍රියාවලි දෙකෙහි එකිනෙකට වෙනස් වාසි සහ අවාසි ඇත.

## 1.2 අලෙවිකරණ අභියෝග සම්බන්ධ ප්‍රශ්න

ප්‍ර1. වැඩි ලාභයක් ලබා ගැනීම සඳහා, අතරමැදියන් සමඟ හොඳ ව්‍යාපාර සම්බන්ධයක් ඇති කර ගැනීමට ඔවුන් දිරිමත් කිරීමට වඩා  අතරමැදියන් මඟහැරීමට හා තොග වෙළෙන්දන් හෝ සිල්ලර වෙළෙන්දන් සමඟ කෙලින්ම වෙළඳාම් කිරීමට උපදෙස් දීම වඩා හොඳ නොවේද?

පි1. අතරමැදියන් මග හැරීමෙන් ගොවි කණ්ඩායම් ලාභය වැඩි කළ අවස්ථා ඕනෑ තරම් තිබෙන බව ඇත්තක් වේ. කෙසේ වෙතත්, දුෂ්කර ප්‍රදේශවල ජීවත් වන ගොවීන් සඳහා, ප්‍රවාහනය විශාල ප්‍රශ්නයක් වන අතර විකිණීමට ඇත්තේ කොතැනද යන්න සම්බන්ධයෙන් ඔවුන්ට විකල්ප කිහිපයක් තිබේ. එකම විකල්පය අතරමැදියන්ට විකිණීම විය හැකිය. එවැනි අවස්ථාවලදී අතරමැදියන් තුරන් කරනවාට වඩා ඔවුන් සමඟ හොඳ ව්‍යාපාරික සම්බන්ධයක් සෙවීමට ඔවුන්ට උපදෙස් දෙනු ලැබේ. වෙළඳපල සමීක්ෂණය අතරතුර ඔවුන් රැස්කරගත් තොරතුරු මත පදනම්ව ගොවි කණ්ඩායම් දෙකක් සංසන්දනය කරන වෙනත් අවස්ථාද ඇත. (1) ගොවිපල දොරටුවේ අතරමැදියන්ට විකිණීම හෝ (2) බෝග ප්‍රවාහනය කර වෙළඳපොලක තොග වෙළෙන්දන්ට විකිණීම.  අවස්ථා දෙක සංසන්දනය කිරීමෙන් පසු, ඔවුන් අවසානයේ ලාභදායිත්වය ඉහළ බැවින් හෝ අවදානම අඩු  බැවින් අතරමැදියන්ට විකිණීම තෝරාගනී. වැදගත්ම දේ වන්නේ ගොවීන් වෙළඳපල කොටස්කරුවන් යනු කවුදැයි හා ඔවුන්ට ඇති තේරීම් මොනවාද දැනුවත් වීමයි.

ප්‍ර2.කුඩා පරිමාණ ගොවියන්ගේ ප්‍රධානතම අභියෝගයක් වන්නේ වෙළඳපොළට නිරන්තරයෙන් බෝග සැපයීමට ඇති නොහැකියාවයි. SHEP ගොවීන් මෙම ගැටලුව ජය ගන්නේ කෙසේද?

පි2. SHEP, ගොවි කණ්ඩායම් සමඟ වැඩ කරන බැවින්, එය මෙම විධි විධානයෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට උත්සාහ කරයි. නිරන්තර සැපයුමේ ගැටලුව සම්බන්ධයෙන්, සාර්ථක ගොවි කණ්ඩායම් සැලසුම් කිරීම සහ කණ්ඩායම් සාමාජිකයින් අතර අස්වැන්න නෙළීමේ වේලාවන් සම්බන්ධීකරණය කිරීමෙන් ඔවුන්ට ඔවුන්ගේ බෝග වෙළෙඳපොළට නිරන්තරයෙන් සැපයිය හැකිය. SHEP ඔවුන්ට බෝග කැලැන්ඩරය සකස් කරන්නේ කෙසේද යන්න ඉගැන්වීමෙන් මෙම ක්‍රියාවලියට උපකාර කරයි.

ප්‍ර3. කුඩා වතු හිමියන් තම නිෂ්පාදන සුපිරි වෙළඳසැල් වෙත සැපයීම ආරම්භ කරන්නේ කෙසේද?

පි3. බොහෝ අවස්ථාවලදී සුළු පරිමාණ ගොවියන්ට සුපිරි වෙළඳසැල්වල පවතින දැඩි තත්ත්ව අවශ්‍යතා නිසා සුපිරි වෙළඳසැල් වෙත සැපයීම පහසු නැත. ගොවීන් දේශීය වෙළඳපොල සඳහා ආරම්භ කර සුපිරි වෙළඳපොලේ අවශ්‍යතා සපුරාලීම සඳහා ඔවුන්ගේ නිෂ්පාදන කුසලතා ක්‍රමයෙන් වැඩි දියුණු කරයි. වරකට කුඩා පියවරක් ගැනීම වඩාත් සුදුසුය.

## 1.3 සහයෝගීතා ආකාර සම්බන්ධ ප්‍රශ්න

ප්‍ර1. SHEP ගොවීන්ට මූල්‍යයමය හා ද්‍රව්‍යමය ආධාර ලබා නොදෙන බැවින් සැබවින්ම ඉහළ සහභාගීත්වයක් ලබා ගත හැකිද? මට බයක් තියෙනවා ගොවීන්ගේ පැමිණීම අඩු වෙයි කියල, අපි යනකොටත් අඩුයි



ටකේෂි කුනෝ/ජයිකා, කෙන්නියා

පි1. ස්වයං නිර්ණ න්‍යායට අනුව, " පුහුණුව සඳහා එන්න, ඔබට ද්‍රව්‍යමය ආධාර ලැබෙනු ඇත" කීම හොඳ ප්‍රවේශයක් නොවේ. මන්ද එවිට ස්වාධීනබව සඳහා වන ගොවීන්ගේ මානසික අවශ්‍යතාවය ව්‍යර්ථ විය හැකි අතර ඔවුන් පුහුණුවට පැමිනෙනනේ අත් පත්‍රිකා ලබා ගැනීම සඳහා පමණක්ම විය හැක.


SHEP ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර SHEP යනු සම්පූර්ණයෙන්ම හැකියා සංවර්ධනය සඳහා වන පුහුණුවක් බවත් කිසිදු ද්‍රව්‍යමය ආධාරයක් ලබා නොදෙන බවත් ගොවීන්ට පැහැදිලිව පැහැදිලි කිරීම මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන්නන් සඳහා අතිශයින් වැදගත් වේ. මෙම පැහැදිලි කිරීම ඇසීමෙන් පසු SHEP සඳහා සහභාගී වීමට කැමති

ගොවීන් තෝරා ගැනීමට වග බලා ගත යුතුය. මෙහිදී මූල්‍ය හිඟකම ලෙස අදහස් කරනුයේ ගොවීන්ගේ ප්‍රශ්නය විසඳීම සඳහා SHEP විසින් කිසිදු සහයෝගයක් නොදෙන බව නොවේ. SHEP මගින් ගොවීන්ට අවශ්‍ය ද්‍රව්‍ය හෝ මූල්‍ය පහුසුකම් කරා ප්‍රවේශය ලබා ගැනීමට උපකාර කරයි. එය සිදු කරනු ලබන්නේ රාජ්‍ය නොවන සංවිධාන, මූල්‍ය ආයතන, රජයේ දෙපාර්තමේන්තු, පාර්ශවකරුවන්ගේ සංසදය සහ වෙළඳපල සමීක්ෂණය වැනි අදාළ පාර්ශවකරුවන් හරහා ඔවුන් සම්බන්ධ කිරීම මගිනි. මෙහිදී විවිධ ද්‍රව්‍ය සැපයිය හැකි පාර්ශවකරුවන් සමඟ සබඳතා ඇති කර ගැනීමට ගොවීන් මූලිකත්වය ගැනීම වැදගත් වේ.

ප්‍ර2. සමහර අවස්ථා වලදී ද්‍රව්‍යමය ආධාර සැපයීම ගැමියන්ගේ පැවැත්ම සඳහා ඉතා වැදගත් වේ. නමුත් SHEP මගින් උත්සාහ කරනුයේ ගොවීන්ට අවශ්‍ය මූල්‍ය පහුසුකම් හෝ ද්‍රව්‍යමය ආධාර ලබා දීම නොවේ. SHEP මානුෂීය ආධාර ප්‍රතික්ෂේප කරනවාද?

පි2. ආපදා තත්ව වලදී හා ගැටුම්කාරී තත්ව වැනි හදිසි අවස්ථා වලදී මානුෂීය ආධාර නියත වශයෙන්ම අත්‍යවශ්‍ය වේ. SHEP සැලසුම් කර ඇත්තේ එවැනි හදිසි අවස්ථාවකදී ක්‍රියාත්මක කිරීම සඳහා නොව සාමාන්‍ය තත්වයන් යටතේ ක්‍රියාත්මක කිරීම සඳහායි. මක්නිසාද යත්, SHEP හි පරමාර්ථය වන්නේ තිරසාරව ගොවීන්ගේ වගා ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන්ගේ හැකියාව ගොඩනැගීමයි. එසේම SHEP මගින් යැපුම් මට්ටමට ඉහල ගොවීන් ඉලක්ක කිරීමත් කරයි. තවත් විධියකට කිවහොත්, උද්‍යාන බෝග වගා ව්‍යාපාර සඳහා ආයෝජනය කිරීමට යම් තරමක මූල්‍යමය හැකියාවක් ඔවුන්ට ඇති අතර SHEP හි ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට අවශ්‍ය ද්‍රව්‍යමය සහාය රජය විසින් සැපයීම අවශ්‍ය නොවේ. එසේම SHEP වලට වඩා වෙනස් ප්‍රවේශයකින් යැපුම් මට්ටමේ ගොවීන් හට උපකාර කිරීම අවශ්‍යයි.

ප්‍ර3.බොහෝ ගොවීන්ට ඔවුන්ගේ ගොවිතැන් ව්‍යාපාරය පුළුල් කිරීමට සහ කෘෂිකාර්මික නිෂ්පාදනයන් ආරම්භයක් සඳහා අවශ්‍ය මූලික යටිතල පහසුකම් හිඟ වේ. එසේම ඔවුන්ට ණය අවශ්‍ය වේ. SHEP මගින් ගොවීන්හට ණය ලබා දෙනවාද?



ටකේෂි කුනෝ/ජයිකා, කෙන්නියා

පි3. කෙලින්ම ණය ලබාදීමක් සිදුනොකරයි. නමුත් ගොවීන් සතුව ඇති පාර්ශවකරුවන්ගේ සංසද සහ වෙළඳපල සමීක්ෂණය වැනි පාර්ශවකරුවන් හරහා ණය ලබා දෙන ආයතන වන බැංකු, ක්ෂුද්‍ර මූල්‍ය ආයතන හෝ රාජ්‍ය නොවන සංවිධාන සමඟ සම්බන්ධ වීමට අවස්ථාවක් ඇත. කෙන්යාවේ බොහෝ SHEP ගොවීන්ට ඔවුන්ගේ උද්‍යාන බෝග වගා ව්‍යාපාර කටයුතු පුළුල් කිරීම සඳහා එවැනි ආයතනවලින් ණය ලබාදේ.

ප්‍ර 4. SHEP හි අගය ඉහළ නැංවීම සඳහා උද්‍යාන බෝග සැකසීම සහ අපනයනය පිළිබඳ අවධාරණය යොමුකළ යුතු නොවේද?

පි4. පාර්ශවකරුවන්ගේ සංසදය සදහා අපනයනකරුවන් සහ සැකසුම් සමාගම් වලට ආරාධනා කල හැකිය. එසේම වෙළඳපල සමීක්ෂණය අතරතුරදී ඒවා බැලීමට යා හැක. කෙන්යාවේ බොහෝ ගොවීන් යුරෝපයට එළවළු අපනයනය කිරීම සාර්ථකව සිදු කරන ලදී. කෙසේ වෙතත්, SHEP මගින් ගොවීන් සතු බෝග අපනයනය කිරීමට හෝ උද්‍යාන බෝග සඳහා අගය එකතු කිරීම අරමුණ නොවන බව මතක තබා ගැනීම වැදගත්ය. ගොවීන්ට ආදායම ලැබෙන්නේ අපනයනයෙන් හෝ දේශීයව අලෙවියෙන්ද යන්න කම් නැත. වැදගත්ම දෙය වන්නේ ගොවීන්ට ඔවුන්ගේ තත්වයන්ට වඩාත් ගැලපෙන ව්‍යාපාර කිරීමේ මාර්ගය සොයා ගැනීමට උදව් කිරීමයි.

## 1.4. ඉලක්ක කිරීම සම්බන්ධ ප්‍රශ්න

ප්‍ර**1.** බහුතරයක් ගොවීන් සාක්ෂරතාවය නැති අය නම් අපට SHEP ක්‍රියාත්මක කළ හැකිද?

පි1.ස්ථිරවම අපට හැකියි. ඇත්ත වශයෙන්ම, බොහෝ SHEP ක්‍රියාත්මක කරන රටවල්/කලාපවල ප්‍රතිලාභීන් ලෙස සාක්ෂරතාවය නැති ගොවීන් සැලකිය යුතු ප්‍රමාණයක් සිටී. කෙසේ වෙතත්, සාක්ෂරතාවය නැතිකමින් පැන නගින දුෂ්කරතා ජය ගැනීම සඳහා ක්‍රියාත්මක කරන්නන් හට දෘශ්‍යමය වශයෙන් ආකර්ෂනීය ඉගැන්වීම් ද්‍රව්‍ය සකස් කිරීම, කියවීමේ දී හා ලිවීමේ දී සාක්ෂරතාවය නැති කණ්ඩායම් සාමාජිකයන්ට, එම හැකියාව ඇති ගොවීන්ගේ උදව් ලබා දෙන ලෙස ඉල්ලීම වැනි විවිධ ක්‍රම හා විධි අනුගමනය කිරීමට සිදු වේ.

ප්‍ර**2. SHEP** හට එහි සාමාජිකයින් **100** ඉක්මවා යන විශාල ගොවි කණ්ඩායමක් ඉලක්ක කර ගත හැකිද**?**

පි2.ඉලක්ක කණ්ඩායමක් ලෙස 100ට වැඩි පිරිසක් සිටිය හැක. කෙසේ වෙතත්, තීරණ ගැනීම, කාර්යක්ෂමව සාමාජිකයින් අතර තොරතුරු බෙදාහැරීම සහ ප්‍රජාතන්ත්‍රවාදී තීරණ ගැනීම සහතික කිරීම වැනි කරුණු සම්බන්ධයෙන් අප වඩාත් ප්‍රවේශම් විය යුතුය. එම හේතුව නිසා, ඔබ එක් කණ්ඩායමක් ලෙස ඔවුන්ගේ එකමුතු හැඟීමට හානියක් නොවන පරිදි ප්‍රායෝගික අරමුණු සඳහා පුහුණු සැසිවලදී උප කණ්ඩායම් කිහිපයකට බෙදීමට කණ්ඩායමෙන් ඉල්ලා සිටීමට අවශ්‍ය විය හැකිය.

ප්‍ර**.3.** ඉලක්කගත ප්‍රදේශයේ සංවිධානාත්මක ගොවි කණ්ඩායම් නොමැති නම් කුමක් කළ යුතුද**?**

පි.3. කණ්ඩායම විධිමත් කණ්ඩායමක් විය යුතු නැත. කණ්ඩායමේ සාමාජිකයන් අතර සැබෑ සමගිය පිළිබඳ හැඟීමක් පවතිනතාක් කල් ලියාපදිංචි නොකළ කණ්ඩායම් හෝ අවිධිමත් කණ්ඩායම් ද SHEP හි ඉලක්කය විය හැකිය. ඉලක්කගත ප්‍රදේශයේ ගොවීන් කිසිදු ආකාරයක කණ්ඩායමකට අයත් නොවී තනි තනිව පමණක් වැඩ කරන්නේ නම් SHEP ප්‍රවේශය තනි තනි ගොවීන්ට ද ක්‍රියාත්මක කිරීමට ද හැකිය..

## 1.5. ව්‍යාප්ති කාර්ය මණ්ඩලය සහ පද්ධති සම්බන්ධ ප්‍රශ්න

ප්‍ර**1.** SHEP නිසා ව්‍යාප්ති කාර්ය මණ්ඩලයේ වැඩ ප්‍රමාණය වැඩි වෙයි ද**?**

පි.1.අත්දැකීම්වලින් පෙනී යන්නේ විශේෂයෙන් අලෙවිකරණ ක්ෂේත්‍රවල නව ක්‍රියාකාරකම් සිදු කරන විට කාර්ය මණ්ඩලයේ වැඩ ප්‍රමාණයේ සුළු වැඩිවීමක් ඇති විය හැකි බවයි. කෙසේ වෙතත්, බොහෝ ව්‍යාප්ති කාර්ය මණ්ඩලය පවසන්නේ ගොවීන්ගෙන් තවදුරටත් දුරකථන ඇමතුම් ලබා නොගන්නා නිසා ඔවුන්ගේ කාර්යය පහසු වූ බවයි. අස්වැන්න නෙළන මාසවලදී තම නිෂ්පාදන අලෙවි කිරීමට.



ඡායාරූපය ඉතියෝපියාව

ව්‍යාප්ති කාර්ය මණ්ඩලය ද පෙරට වඩා වැඩි රැකියා තෘප්තියක් ලබා ගන්නේ ගොවීන් ඔවුන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීම සහ ඔවුන්ගේ වැඩ කටයුතු ගොවීන් විසින් අගය කරනු ලැබීම නිසා ය. SHEP ඇත්ත වශයෙන්ම ගොවීන් දිරිමත් කරනවා පමණක් නොව ව්‍යාප්ති කාර්ය මණ්ඩලය ද දිරිමත් කරයි.

ප්‍ර **2.** ව්‍යාප්ති කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව ඉතා සීමිත නම් **SHEP** ක්‍රියාත්මක කළ හැකිද**?**

පි 2. ඔව්, ඔබ සම්මත ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියට යම් යම් වෙනස් කිරීම් කරන තාක් කල් එය කළ හැක. උදාහරණයක් ලෙස, නිෂ්පාදන තාක්ෂණයන් බෙදා හැරීම සඳහා ගොවියාගෙන් ගොවියාට ව්‍යාප්ත කිරීමේ ප්‍රවේශය ගොවියාට හඳුන්වා දීමෙන් රුවන්ඩාව මෙම ගැටලුව ජයගෙන ඇත.

## 1.6 මූල්‍ය සම්පත් සම්බන්ධ ප්‍රශ්න

ප්‍ර 1. රජය සතු මූල්‍ය සම්පත් ඉතා සීමිත නම් SHEP ක්‍රියාත්මක කළ හැකිද?

පි.1. ඔව්, පුළුවන්. මෙම අත්පොත සැලසුම් කර ඇත්තේ මූල්‍ය සම්පත් සීමිත අවස්ථාවන් යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා ය. ඔබ මෙම අත්පොතෙහි උපදෙස් අන්ගමනය කරන්නේ නම්, ක්‍රියාකාරකම් සරල සහ විධිමත් බව ඔබට වටහා ගත හැකිය. එබැවින් ඔවුන්ට විශාල අයවැයක් අවශ්‍ය නොවේ. ඇත්ත වශයෙන්ම, අමතර මූල්‍ය සම්පතක් නොමැතිව, ව්‍යාප්ති කටයුතු සඳහා SHEP ප්‍රවේශය සාමාන්‍යයෙන් ඇතුළත් කළ හැකිය.

## 1.7 ස්ත්‍රී-පුරුෂ භාවයට සම්බන්ධ ප්‍රශ්ණ

ප්‍ර 1. ස්ත්‍රී-පුරුෂ භාවය යනු සංවේදී මාතෘකාවක් වේ. මේ ගැටලුව සාකච්ඡා කිරීමට ගොවීන් කැමැති ද?

පි 1. කෙන්නියාවේ අත්දැකීම් වලට අනුව SHEP වල ස්ත්‍රී-පුරුෂ භාවයට සම්බන්ධ කටයුතු ගැන සාකචඡා කිරීමට ස්ත්‍රී හා පුරුෂ යන ගොවීන් දෙකොට්ටාශයම ඉතා සතුටු වන බව පෙනී ගොස් ඇත. ස්ත්‍රී-පුරුෂ භාවය, කෙන්නියාවේ SHEP ගොවීන් අතර ජනප්‍රිය පුහුණු මාතෘතා වලින් එකක් වේ. ස්ත්‍රී-පුරුෂ භාවයට අදාල ප්‍රශ්ණ පිලිබදව එකිනෙකා විවේචනය කර කර නොසිට, SHEP වල ස්ත්‍රී-පුරුෂ භාවයට අදාල මාතෘකා හැම විටම ගොවි ව්‍යාපාර වැඩි දියුණු කිරීමට යොමු වන බැවින් ඒවාට ගොවීන් කැමැතිය.

## 2.සම්පත්

For the promotion of the SHEP Approach, JICA has prepared various reference/ educational. materials. Here is the list of some of the materials you can access on the Internet. Should you require additional information, please contact the JICA office in your country.

▶ SHEP Website

https://www.jica.go.jp/english/our_work/thematic_issues/agricultural/shep/index.html




▶ SHEP Facebook

https://www.facebook.com/jicashep/




▶ SHEP YouTube Video "Smallholder Farmers Make Changes for Success at Market-SHEP Approach Spreading to the Whole Africa"

https://www.youtube.com/watch?v=idGw6xLljH8&feature=youtu.be



▸ JICA-Net multimedia-based Learning Material SHEP Approach (Short ver. 6min, Full ver.26min)
https://jica-net-library.jica.go.jp/jica-net/user/lib/contentDetail.php?item_id=10064





▸ SHEP Game App "Fun Fun Farming!"
https://jica-net-library.jica.go.jp/jica-net/user/lib/contentDetail.php?item_id=10035




▶ Booklet "Introduction to the Psychology of International Cooperation"

http://libopac.jica.go.jp/images/report/12092193.pdf




▶ SHEP Brochure “JAPAN Brand SHEP (September 2016)”

https://www.jica.go.jp/english/publications/brochures/c8h0vm0000avs7w2-att/japan_brand_08.pdf




▶ SHEP Brochure “SHEP pamphlet (March 2013)”

https://www.jica.go.jp/english/our_work/thematic_issues/agricultural/c8h0vm00009ul5bk-att/shep_04_en.pdf




▶ SHEP Brochure “SHEP’s Story (February 2014)”

https://www.jica.go.jp/english/our_work/thematic_issues/agricultural/c8h0vm00009ul5bk-att/shep_05_en.pdf



▶ SHEP Brochure “Do-nou Technology – Improving Rural Access Roads”

https://www.jica.go.jp/english/our_work/thematic_issues/agricultural/shep/c8h0vm0000bm5dqa-att/Do-Nou.pdf



▶ SHEP Youtube Video DO-NOU Technology "Improving Rural Access Roads" Kenya SHEP-UP (2012)

https://www.youtube.com/watch?v=zcG7cdKXKxU



Japan International
Cooperation Agency